
sinhalaebooks.com




Scanned with CamScanner

sinhalaebooks.com

# රිදී මකුළුවාගේ
# අබිරහස



සන්ධ්‍යා කුමාරි කුලතුංග

Scanned with CamScanner

sinhalaebooks.com

# රිදී මකුළුවාගේ අබිරහස

සන්ධ්‍යා කුමාරි කුලතුංග

නව මුද්‍රණය : 2014 නොවැම්බර්

අක්ෂර සංයෝජනය : රසාදර ධනුෂ්ක

කවර නිර්මාණය : මල්ෂා පියුමලි

ඇතුළත චිත්‍ර : ඉෂාන් සේනක

මුද්‍රණය : වාසනා ප්‍රින්ටර්ස්,
නාත්තන්ඩිය පාර,
දන්කොටුව.

පිටු : 127

ප්‍රකාශනය හා බෙදාහැරීම
වාසනා පොත් ප්‍රකාශකයෝ
කටුකෙන්ද, දන්කොටුව.

පොත් වෙළෙඳ සැල :- ☎ 031-2258384 / 031-4921922
ෆැක්ස් :- ☎ 031-2259805
ප්‍රකාශන අංශය :- ☎ 031-4926206
කාර්යාලය :- ☎ 031-7212979

E-mail: pmwasana@sltnet.lk / pmkumara@sltnet.lk
Web: wasanapublishers.com.lk

ශාඛා:
වාසනා පොත්හල, දන්කොටුව. :- ☎ 031-4923647/031-2261525
වාසනා පොත්හල, මරදාන. :- ☎ 011-2682603/011-4979913
Fax: 011-2682604

## පොත පිළිබඳව.....

ළමා රහස් පරීක්ෂකයින් තිදෙනෙක් අහම්බෙන් මිතුරු වූ රජ කුමරෙකුගේ ආරාධනයෙන් ඔහුගේ රටට යති. කුමන්ත්‍රණකාරී පිරිසක් රජ කිරුළ ලබා ගන්නට වෙර දරද්දී ඔවුන්ගෙන් රට බේරාගෙන කුමරුට රජ කිරුළ හිමිකර දෙන්නට මේ රහස් පරීක්ෂකයන් තිදෙනා සමත් වෙත් ද? කියවන්න, රස විඳින්න. යොවුන් ඔබටයි මේ ආරාධනය....

මෙම කෘතිය ඔබ අතට පත් කිරීමට ප්‍රකාශනය භාරගත් වාසනා ප්‍රකාශන අධිපති, නිහාල් කුමාර මහතාටත්, පොත කඩිනමින් එළි දැක්වීමට වෙහෙස ගත් මනෝජ් සියඹලාපිටිය මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පිරිනමමි.

**සන්ධ්‍යා කුමාරි කුලතුංග**

හංගිලිපොල,
බලල්ල,
මහව.
දු. ක. : 037-5615375

**කතුවරියගේ වෙනත් පොත්**

- හොඳ හා පැංචා
- හා පැංචගෙ හපන්කම
- බලුහාමිට පාඩමක්
- හඳයා සහ යහළුවෝ
- මාරක පොරොන්දුව (පරිවර්තන)
- වැලපෙන මිටියාවතේ අබිරහස (පරිවර්තන)
- හරිත මන්දිරේ හොල්මන (පරිවර්තන)



Scanned with CamScanner

sinhalaebooks.com

## පටුන

01. නූලෙන් බේරෙයි
02. පුදුම ආරාධනාව
03. රිදී මකුළුවා
04. ඩිජාරෝ විස්තර කරයි
05. කූට සංවාදය
06. රිදී මකුළුවා සැඟවෙයි
07. පලා යාම
08. බොබීගේ මතකය නැති වෙයි
09. පලා යන්නට සැලැස්මක්
10. හදිසි පහරදීමක්
11. මහලු ඇන්ටන්
12. කානුවේ කුණාටුව
13. අඳුරේ දිගු ගමනක්
14. ජුපිටර්ගෙන් අදහසක්
15. පෝල් කුමරුගේ සණ්ටාරය
16. රිදී මකුළුවා සොයා ගනියි



# 1

# නූලෙන් බේරෙයි

"අර බලන්න...." බොබ් හයියෙන් කෑ ගැසීය.

"වොනින්ටන්, බලාගෙන....." පීටර් ද බෙරිහන් දුන්නේය.

රන් පැහැති රෝල්ස් රෝයිස් රථයේ තිරිංග තද විය. රහස් පරීක්ෂකයෝ තිදෙන එක ගොඩේම රථය තුළ ඇද වැටුණහ. රෝල්ස් රෝයිස් රථය මහත් හඬ නගමින් සුඛෝපභෝගී රථය ඉදිරිපිට නතර කර ගත්තේ මහත් අමාරුවෙනි. ඒ දෙක අතර දුර ප්‍රමාණය කෙස් ගහකට සමාන විය.

එසැනින්ම සුඛෝපභෝගී රථයෙන් බැස ගත් මිනිස්සු කිහිප දෙනෙක් වොනින්ටන් වට කරගෙන අමුතු භාෂාවකින් දොඩවන්නට වූහ. වොනින්ටන් ඒ කිසිත් ගණන් නොගෙනම අසුන තුළ හිඳගෙන සිටියේය. වොනින්ටන් වෘත්තීය රියැදුරෙකු හැසිරෙන අයුරින් විනීත ලෙස සුඛෝපභෝගී රථය වෙත ළං විය. ඔහුගේ නිල ඇඳුම රතු පාටින් බැබළුණ අතර එහි රනින් වැඩ දමා තිබූ වාටිය නිසා එය තවත් ඔපවත්ව පෙනුණි.

"මහත්මයාණෙනි, ඔබ නැවතීමේ සංඥාව නොසලකා හැරියා. ඒ නිසා අපි දෙන්නාව විනාශ වෙන්න තිබුණා. සම්පූර්ණයෙන්ම වැරැද්ද ඔබේ. මම නිවැරදිව මාර්ගයේ ගමන් කරනවා." වොනින්ටන් විනීත අයුරින් පැවසීය.

"ඩිජාරෝ කුමාරයත් නිවැරදි මාර්ගයේ තමයි ගමන් කරන්නේ." අනිත් රියැදුරා පිළිතුරු දුන්නේය.



Scanned with CamScanner

sinhalaebooks.com

ඔහු ඩිජාරෝ යන නම උච්චාරණය කරනු ලැබුවේ ජාරෝ ලෙසිනි.

සුඛෝපභෝගී රථයෙන් බට මිනිස්සු වොෂින්ටන් වටා එක්රැස් වී බැණ වදින්නට වූහ. බොබ්, පීටර් සහ ජුපිටර් එම දසුන දෙස පුදුමයෙන් බලා සිටින්නට වූහ. එතැන සිටි උස මිනිසා ඉංග්‍රීසියෙන් කතා කළේය.

"මෝඩයා, උඹ කුමාරයව මරන්නයි හැදුවෙ. සෙල්ලමක් නෙමෙයි. මේක ජාත්‍යන්තර වශයෙන් බලපාන ගැටලුවක්. උඹ මීට වඩා විනයගරුක වෙන්න ඕනෑ." ඔහු ගිගුරුවේය.

"මම මාර්ග නීතිවලට අවනත වෙලයි වැඩ කරන්නේ. ඒත් ඔයාලා එහෙම නෙමෙයි. ඔයාගේ රියැදුරාගෙයි වැරැද්ද." වොෂින්ටන් ඍජුවම ප්‍රකාශ කළේය.



"මොන කුමාරයෙක් ගැනද මේ කියවන්නෙ?" පීටර්, බොබ්ගේ සවනට කෙඳිරිය.



"ඔයා පත්තර කියවන්නෙ නැද්ද? එයා වෙරෝනාවල ඉඳලා එන්නෙ. ඒක යුරෝපීය රටක්. ලෝකයේ තියෙන පොඩිම රටවල් හතෙන් එකක්. එයා ඇමෙරිකාව නරඹන්න ඇවිල්ලා." බොබ් ආපසු පීටර්ගේ සවනට කෙඳුරුවේය.

"දෙයියනේ.... තව ටිකෙන් මෙයා තල ගුලියක් වගේ චප්ප වෙනවනේ." පීටර් සිනහව අතරින් කීය.

"වොෂින්ටන් හරි. එයාගේ වැරැද්දක් නැහැ. අපිත් ගිහිල්ලා එයාට උදවුවට කතා කරමු." ජුපිටර් යෝජනා කළේය.

ළමෝ අමාරුවෙන් කාරයෙන් එළියට බැස ගත්හ. ඒ සමගම සුඛෝපභෝගී රථයේ දොර ඇරගෙන බොබ්ට වඩා උස ළමයෙක් එළියට ආවේය. ඔහුගේ කළු පැහැති කොණ්ඩය යුරෝපීය ක්‍රමයට කපා තිබුණි. ඔහු ඔවුනට වඩා වසර දෙකකින් පමණ වැඩිමහල් වෙන්නට ඇත.

"නිශ්ශබ්ද වන්න....!"

ඔහුගේ හඬින් වොෂින්ටන් වටා දඟලමින්, දොඩවමින් සිටි මිනිස්සු නිහඬ වූහ. ඔහු වොෂින්ටන් වෙත ළඟා විය.

"මම සමාව ඉල්ලනවා. මගේ රියැදුරාගෙයි වැරැද්ද. එයා ඉදිරියේදී මාර්ග නීතිවලට අවනත වේවි." ඔහු පිරිසිදු ඉංග්‍රීසියෙන් කීවේය.

"ඒත් ඔබ උසස් කෙනෙක්..." කණ්ඩායමේ සිටි උස මිනිසා විරෝධය පෑවේය.

නිහඬ වන ලෙස ඔහුට අතින් සංඥා කළ කුමරු ළමුන් තිදෙනා දෙස මහත් ඕනෑකමින් බැලීය.

"මට කනගාටුයි මේ සිද්ධිය ගැන. ගොඩක් ස්තුතියි ඔයාලගෙ රියැදුරාගෙ දක්ෂතාවට. එයා අපිව ලොකු අනතුරකින් බේරගත්තා. මේ බොහොම වටිනා කාර් එකේ අයිතිකාරයෝ ඔයාලද?"

"නැහැ, සම්පූර්ණයෙන්ම අයිතිකාරයෝ නම් අපි නෙමෙයි. ඒත් මේක සමහර වෙලාවට අපි පාවිච්චි කරනවා. මේකෙ ඉතිහාසය ගැන කියන්න ගියොත් අමාරුයි. වෙලා යනවා. මේක සෙබස්තියන් මහත්තයා තරගයකින් දිනපු එකක්. එයා රහස් පරීක්ෂක කතා ලියන ලේඛකයෙක්. අපේ අලුත්ම රහස් පරීක්ෂණයේ කරුණු ටිකක් දෙන්නයි

sinhalaebooks.com

එහේ ගියේ. ඉතින් අපි ආපහු ගෙදර එන ගමන් තමයි මේ අනතුර සිද්ධ වුණේ."

"මම වෙරෝනාවල ඩිජාරෝ මොන්ටෙස්ටන්. මම තවම කුමාරයා නෙවෙයි. ලබන මාසේ තමයි මට නිත්‍යානුකූලව ඔටුනු පලඳවන්නේ. ඒත් මිනිස්සු මට කුමාරයා කියලා කතා කරන එක නවත්වන්න බැහැ. ඔයාලා පෙනුමෙන් නම් ඇමෙරිකන් ළමයි වගේ...?"

"ඔබ හරි. පීටර්, බොබ් දෙන්නා නම් ඇමෙරිකන් ළමයිම තමයි. ඒත් මට හිතෙන්නෙ මම නම් එහෙම නෙවෙයි. හුඟ දෙනෙක් මට කියන්නේ මම ආඩම්බරයි කියලා."

බොබ් සහ පීටර් එකිනෙකා දෙස බලමින් සිනාසුනහ. ජුපිටර් කියන්නේ සත්‍යයකි. එය ඔවුන් හඳුනාගත් මුල් කාලයේම ඔවුනට දැනුණි. ඔහුට උපතින්ම හොඳ මොළයක් පිහිටා තිබේ. සමහර ළමයි ඒ නිසාම ඔහුට ඊර්ෂ්‍යා කළහ. යම් ගැටලුවක් ඇති වූ විට අනෙක් අයට වඩා පහසුවෙන් එය විසඳීමේ හැකියාව ජුපිටර් සතුව ඇත.

ජුපිටර් තම සාක්කුවෙන් කාඩ් පතක් ගත්තේය. එය රහස් පරීක්ෂකයන් තිදෙනාගේ නිල කාඩ් පතයි. ඔහු එය නැතිව කිසිම තැනක ගමන් නොගනියි.

"මේ තියෙන්නෙ අපේ නම්. මම ජුපිටර් ජෝන්ස්, මෙයා පීටර් ක්රේන්ෂෝ, මේ ඉන්නේ බොබ් ඇන්ඩෲස්."

සංචාරක ළමයා ජුපිටර් දුන් කාඩ් පත ගෙන හොඳින් නිරීක්ෂණය කළේය. එහි මෙසේ සඳහන් විය.

**රහස් පරීක්ෂකයෝ තිදෙන**

*'අපි යමක් නිරීක්ෂණය කරන්නෙමු.'*

| | | |
|---|---|---|
| පළමු රහස් පරීක්ෂක | : | ජුපිටර් ජෝන්ස් |
| දෙවන රහස් පරීක්ෂක | : | පීටර් ක්රේන්ෂෝ |
| වාර්තා සහ පර්යේෂණ | : | බොබ් ඇන්ඩෲස් |

? ? ?

ඔවුන් බලා සිටියේ ඔහු මෙම ප්‍රශ්නාර්ථ ලකුණු ගැන විමසන තෙක්ය. ඕනෑම අයෙකු මෙම කාඩ් පත දුටුවිට අසන ලද ප්‍රශ්නය එයයි.



"දෙයියනේ...." ඩිජාරෝ තම භාෂාවෙන් කියා සිනාසුනි. ඔහු සතුව ලස්සන සිනාවක් ඇත.

"මම හිතනවා මේ ප්‍රශ්නාර්ථ ලකුණු ඔයාලගෙ නිල සලකුණු කියලා."

ළමෝ ඔහු දෙස බලා සිටියහ. ඔහුගේ අනුමානය නිවැරදි විය. ඩිජාරෝ තම සාක්කුවෙන් ඔහුගේ කාඩ් පත ගෙන ජුපිටර් අත තැබීය.

"මේ මගේ කාඩ් පත." ඔහු කීවේය.

පීටර් සහ බොබ්, ජුපිටර් ළඟට කිට්ටු වී එම කාඩ් පත නැරඹුවෝය.

සන සුදු පැහැති කොළයක ඩිජාරෝ මොන්ටෙස්ටන් යන්න තදින් කාවද්දා මුද්‍රණය කර තිබුණි. නමට ඉහළින් රන් පැහැති මකුළු දැලක මකුළුවෙක් කඩුවක් රැගෙන සිටින අයුරු රන් සහ නිල් පැහැයෙන් කැටයම් කර තිබුණි.

"මේක තමයි මගේ ලාංඡනය." කුමාරයා හෙමින් කීවේය.

"මකුළුවෙක්... ඒක තමයි අපේ රාජ්‍ය ලාංඡනය. ඒක රාජ්‍ය ලාංඡනය විදිහට තෝරා ගත්තෙ ඇයි කියන එක දිග කතාවක්. නමුත් මට හරි සතුටුයි ඔය තුන්දෙනා මුණ ගැසුණු එක ගැන." ඔහු තිදෙනාටම අතට අත දී ආචාර කළේය.

එසැනින් කළු පැහැති කාරයක් කුමරුගේ සුඛෝපභෝගී රිය පසුපස නැවැත්විය. එයින් බැස ගත් උස සිහින්දෑරි මිනිසා අනෙක් අය පසෙකට තල්ලු කරමින් ඉදිරියට ආවේය. ඔහු පැහැදිලිවම ඉංග්‍රීසි කතා කළේ ඇමෙරිකානුවෙකු මෙනි.

"මට සමාවෙන්න. ඔබ උසස් කෙනෙක්, කාල සටහනකට අනුව වැඩ කරන්න ඕනෑ. මට සතුටුයි අනතුරක් සිදු නොවුන එක ගැන. අපි අපේ ගමන යා යුතුයි."

"මට එච්චර විශේෂ ආශාවක් නැහැ නගරයේ ඇවිදින එක ගැන. මම ගොඩක් නගර දැකලා තියෙනවා. මම ගොඩක් කැමතියි මේ වගේ ළමයි එක්ක කතා කරන්න. එයාලා හම්බ වුණු එක මගේ වාසනාවක්. මට කියන්න ඩිස්නිලන්තෙ කොහොමද? මම ඒකට යන්න ගොඩක් කැමැත්තෙන් ඉන්නෙ." ඔහු ළමයින්ගෙන් විමසීය.



Scanned with CamScanner

sinhalaebooks.com

එය අනිවාර්යයෙන්ම නැරඹිය යුතු එකක් බව ඔවුහු කීවෝය. ඔහුගේ පෙනුම අසරණ බවක් පෙන්වීය. නමුත් ඔහුගේ දෑස්වල ආශාව පිරී තිබුණි.

"ඇත්තටම මට හරියට විනෝද වෙන්නවත් බැහැ. වටේටම ආරක්ෂකයෝ. ආදිපාද ස්ටෙෆාන්, එයා තමයි මගේ භාරකාරයා. ඒ වගේම දැනට වෙරෝනාව පාලනය කරන්නෙත් එයා. මට ඔටුනු පලන්දන තුරු එයා කාටවත්ම මගේ ළඟට එන්න දෙන්නෙ නැහැ. ඒක හරිම අසාධාරණයි. මගේ ඔළුවෙ කිසිම වැදගත්කමක් නැහැ කෙනෙකුට මාව ඝාතනය කරන්න තරම්. වෙරෝනාවේ මට හතුරෝ නැහැ. ඇත්තෙන්ම මගේ වැදගත්කමකුත් නැහැ." ඔහු මොහොතක් නිහඬ විය. ඔහු නැවත හිත හදා ගත්තේය.

"ඔයාලත් එනවද මගෙත් එක්ක ඩිස්නිලන්තයට යන්න?" ඔහු ඇසීය.

"මේ හැමදෙයක්ම පෙන්වන්න. මම ඒක ගොඩාක් අගය කරනවා. මම කැමතියි වෙනසකටත් එක්ක මගෙත් එක්ක යාළුවෝ ඉන්නවා නම්."

ඔහුගේ ඉල්ලීමට ඔවුහු පුදුම වූහ. කෙසේ හෝ ඔවුහු ඔහු සමග ඩිස්නිලන්තයට යාමට කැමැත්ත පළ කළෝය. ඔවුන් එදිනට විශේෂ වැඩක් සැලසුම් කර තිබුණේ නැත. ජුපිටර් තම නැන්දණියට දුරකථන ඇමතුමක් ගෙන ඔවුන්ගේ ගමන ගැන ඇයට දැනුම් දුන්නේය. ළමයි තිදෙනා ඩිජාරෝ කුමරුගේ සුඛෝපභෝගී රථයට නැගුණහ. මේ සිද්ධියේදී මහත් කලබලයක් කළ රළු පෙනුමකින් හෙබි පුද්ගලයාද එම රථය තුළ විය. අනෙක් සියලුම පරිවාර ආරක්ෂකයෝ පෙර කී ආරක්ෂක වාහනයට ගොඩ වූහ.

"ස්ටෙෆාන් ආදිපාදතුමා නම් මේකට කැමති වෙන එකක් නැහැ." ඔහු ළමුන් දෙස රවා බලමින් කීවේය.

"ඔහු කිසිම අවදානමක් ගන්නවට කැමති නැහැ."

"මේක අවදානමක් නෙවෙයි රෝජාස්...!" ඩිජාරෝ සෘජු ලෙස කීවේය.

"මම මොනවටද කැමති කියලා ස්ටෙෆාන් ආදිපාදතුමාට දැනගන්න හොඳම වෙලාව තමයි මේක. තව මාස දෙකකින් මම



මගේ රටේ පාලකයා වෙනවා. මගේ වචනය තමයි නීතිය වෙන්නෙ. නැතිව ස්ටෙෆාන් ආදිපාදවරයාගේ නෙවෙයි. දැන් වාකෝස්ට කියන්න මේ වෙලාවේ ඉඳලා මාර්ග නීති හරියට පිළිපදින්න කියලා. ලොකු අනතුරු සිද්ධ වෙන්න ගිය තුන්වෙනි වතාව මේ. තවත් මේ වගේ දේවල් සිද්ධ වෙන්න බැහැ. එහෙම වුණොත් ඒ ගැන කටයුතු කරන්න සිද්ධ වේවි."

ළමෝ රියැදුරා ගැන අවධානයෙන් පසු වූහ. ඔහු මාර්ග නීති නිවැරදි ලෙස පිළිපදිමින් රිය පදවන්නට විය. විනාඩි හතළිස් පහක පමණ ගමනකින් පසු ඔවුහු ඩිස්නිලන්තයට ළඟා වූහ. ඩිජාරෝ කුමරු ඇමෙරිකාව පිළිබඳ ප්‍රශ්න වැලක් අසන්නට විය. ඔවුහු ඩිස්නිලන්තයට පැමිණීමෙන් පසු බොහෝ විනෝද වූ අතර සිත්ගන්නා දේ පිළිබඳව ද කතා කරන්නට වූහ.

එක් තැනකදී ඩිජාරෝ කුමරුගේ දෑස් දීප්තියෙන් බැබළුණි. උද්‍යානය වටේ පුංචි කෝච්චියේ රවුමක් යන්නට ඔහු ඔවුනට ආරාධනා කළේය. ළමයි තිදෙනා ඔහුගේ ආරාධනාවට එකඟ වූහ. ඔවුහු මිනිසුන් අතරින් රිංගා විත් කුඩා දුම්රියපළට ළඟා වූහ. පුංචි කෝච්චියට ගොඩ වූ මිතුරෝ සතර දෙනාම උද්‍යානය වටේ රවුමක් යන්නට වූහ. පහළ සිටි ආදිපාද රෝජාස් සහ ඔහුගේ මිනිසුන් කුමරු සොයමින් අසාර්ථක උත්සාහයක යෙදෙන අයුරු ඔවුහු දුටුවෝය.

ආදිපාද රෝජාස් තවත් මිනිසුන් කිහිප දෙනෙකුත් සමග කුමරු වෙත දිව ආවේය. රෝජාස් මුව විවර කරන්නට පෙර ඩිජාරෝ ඔහු වළකාලීය.

"ඔයා මගෙත් එක්ක එන්න එපා. මගේ පස්සෙන් හිටියාම ඇති."

"ඒත්.... ඒත්...." මිනිසා යමක් කියන්නට උත්සාහ කළේය.

"ඇති, අපි දැන් යමු. මට සමාවෙන්න, කාල සටහනට අනුව ආපසු එන්න බැරි වුණාට."

ඩිජාරෝ කුමරු රෝජාස් ආදිපාදවරයාට තමන් පසුපසින් එන ආරක්ෂක රථය පදවන්නට අණ කළේය. එම නිසා ආපසු රොකිබීච් දක්වා යන ගමනේදී ළමුන් හතර දෙනාට සිත් සේ කතා කරන්නට ඉඩ ලැබුණි.



Scanned with CamScanner

sinhalaebooks.com

ඩිජාරෝ කුමරු රහස් පරීක්ෂකයන් තිදෙනාගෙන් ඔවුන්ගේ වගතුග විමසන්නට විය. ඔවුහු තමන්ගේ සමාගම පටන් ගත් ආකාරයත්, හෙක්ටර්. සෙබස්තියන් ඔවුන් සමග මිතුරු වූ ආකාරයත් විස්තර කළෝය. සෙබස්තියන් මහතා රහස් පරීක්ෂක කතා ලියන ලේඛකයෙකි.

"දෙයියනේ..., ඕහ්..., මට ඔයාලා ගැන ඊර්ෂ්‍යා හිතෙනවා. ඇමෙරිකන් ළමයින්ට ඕනෑවටත් වඩා නිදහස තියෙනවා. මට කුමාරයෙක් වෙන්න ඕනෙ නැහැ. ඒත් මගේ වගකීම මගේ රට පාලනය කරන එක. ඒක කුඩා රටක් වුණත් මම කවදාවත් ඉස්කෝලෙකට ගිහිල්ලා නැහැ. මුළු ජීවිතේම පෞද්ගලික ගුරුවරුන්ගෙන් තමයි ඉගෙන ගත්තෙ. ඒ නිසාම මට යාළුවෝ හරි අඩුයි. මේ ඇමෙරිකාවට ආවා වගේ ගමනක් කවදාවත් ගිහිල්ලා නැහැ. අද තමයි මුළු ජීවිතේටම සතුටින් ගත කරපු දවස. මට ගොඩක් සතුටුයි ඔයාලව මුණ ගැසුණු එක ගැන. මට ඉස්සරහටත් ඔයාලා එක්ක කතා කරන්න පුළුවන් වෙයිද?"

"අපිටත් ඇත්තටම සතුටුයි, ඔයා වගේ කෙනෙක් අපේ යාළුවෙක් වුණු එක ගැන." පීටර් උනන්දුවෙන් කීවේය.

"ගොඩක් ස්තුතියි, මම ගැන එහෙම හිතුවට." ඩිජාරෝ කුමරු සිනාසුනි.

"ඔයාලා දන්නවද? මම රෝජාස්ට ඔය විදිහට කතා කරපු පළවෙනි දවස. ඒක එයාට ලොකු කම්පනයක්. ඒක ස්ටෙෆාන් ආදිපාදවරයටත් ලොකු කම්පනයක්. ඒත් මමයි ඒ රටේ කුමාරයා. මම ඒකෙන් අදහස් කළේ මොකක්ද කියලා ඔයාලට කියන්න පුළුවන්ද?",

"ඔබේ බලය ප්‍රකාශ කිරීම." ජුපිටර් කීවේය.

"නැහැ, ඔබේ බලය හැමෝටම පෙන්නුවා." බොබ් කීය.

"අන්න හරි. මගේ බලය හැමෝටම පෙන්නුවා." ඩිජාරෝ කුමරු සතුටෙන් කීවේය.

"ස්ටෙෆාන් ආදිපාදවරයා පුදුම වෙයි."

ජුපිටර් ඔවුන්ගේ නිවසට යන මාර්ගය රියැදුරාට පැවසීය. රිය ජුපිටර්ගේ නිවස ඉදිරිපිට නතර කෙරුණි. එයින් බිමට බැසගත් ළමයි තිදෙනා ඔවුන්ගේ රහස් පරීක්ෂක ප්‍රධාන මූලස්ථානය නරඹන්නට



එන ලෙස ඩිජාරෝ කුමරුට ආරාධනා කළෝය. නමුත් ඔහු හිස වනා නිහතමානී ලෙස එය ප්‍රතික්ෂේප කළේය.

"මට දැන් නවතින්න වෙලාවක් නැහැ. අද රාත්‍රී භෝජන සංග්‍රහයකටත් යන්න තියෙනවා. හෙට මම ආපහු වෙරෝනාවට යන්න ඕනෑ. වෙරෝනාවල ප්‍රධාන නගරය තමයි ඩෙන්සෝ. මම එහෙ ජීවත් වෙන්නෙ පැරණි බළකොටුවක තියෙන මාලිගාවක. ඒකේ කාමර තුන්සීයක් විතර තියෙනවා. එච්චරම සුඛෝපභෝගී නැහැ. වැඩට සේවකයෝ ඉන්නවා. හැබැයි කුමාරයෙක් වෙන්න නම් ලොකු වන්දියක් ගෙවන්න ඕනෑ. දැන් මට නවතින්න බැහැ. මම කැමති වුණත් අකමැති වුණත් ආපහු ගිහිල්ලා රට පාලනය කරන්න සූදානම් වෙන්න ඕනෑ. ඒත් මම කවදාවත්ම ඔයාලව අමතක කරන්නෙ නැහැ. සමහර විට යම් දවසක අපි ආයෙත් මුණ ගැහේවි. ඒක මට විශ්වාසයි."

සුඛෝපභෝගී රථය සෙමින් ඉදිරියට ඇදුණි. ඒ පසුපසින් ඔහුගේ ආරක්ෂක වාහනය ද ගමන් ගත්තේය. ඔවුන් යන දෙස ළමයි තිදෙනා බලා සිටියහ.

"කුමාරයෙක් වුණාට එයා හොඳ කොල්ලෙක්." පීටර් ඔහු වර්ණනා කළේය.

"ජුපිටර්, මොකක්ද ඔයා ඒ ගැන හිතන්නේ? මොනවද ඔයා කල්පනා කරන්නෙ?"

ජුපිටර් ඇසිපිය සලමින් පියවි සිහියට පැමිණියේය.

"මම හරියට පුදුම වුණා." ජුපිටර් තම සගයන් දෙස බැලුවේය.

"අද උදේ වුණු සිද්ධිය ගැන ආපහු හැරිලා බලද්දි ඔයාලට මොකුත් අමුත්තක් දැනුණේ නැද්ද?"

"අමුත්තක්...? ඒ කිව්වෙ...?" බොබ්ට එය ප්‍රහේලිකාවකි.

"වාසනාව.... අපේ වාසනාව. නැත්තම් අපි තව පොඩ්ඩෙන් පොඩිවෙලා යනවනේ." බොබ් සිනාසුනි.

"ඔයා මොකක් ගැනද ඔය කියන්නේ?" පීටර් විමසුවේ කුතුහලයෙනි.



Scanned with CamScanner

sinhalaebooks.com

"වාකෝස්, ඩිජාරෝගේ වාහනයේ රියැදුරා ගැන."

"එයා අපේ වාහනය දැකලත් බ්රේක් කරන්න ඕනෑ එකට එයා තවත් වේගය වැඩි කළා. වොනින්ටන් හොඳ රියදුරෙක් නොවුණා නම් ඩිජාරෝ ඉඳගෙන හිටිය පැත්ත පොඩි වෙන්න තිබුණා. සත්තකින්ම ඔහු මැරෙනවා."

"වාකෝස් වේගය වැඩි කරලා වැරැද්දක් කළේ." පීටර්, ජුපිටර්ගේ මතය සනාථ කළේය.

"මට හිතෙන්නේ...." ජුපිටර් තමාටම කොඳුරා ගත්තේය.

"ඔහ්... හරි. මම හිතනවා ඒක වැදගත් නැහැ කියලා. ඩිජාරෝ හම්බ වුණු එක ලොකු සතුටක්. ඒත් මම නම් හිතන්නෙ නැහැ එයා අපිට ආයෙ හම්බ වේවි කියලා." ජුපිටර් එසේ සහතික වුවද ඔහුගේ තීරණය නිවැරදි නොවිය.



2

# පුදුම ආරාධනාව

දවස් ගතවෙමින් තිබුණි. ළමයි තිදෙනා ඔවුන්ගේ මූලස්ථානයේ වැඩක නිරත වී සිටියෝය. බොබ් ලියුමක් කියවමින් සිටියේය. එය එවා තිබුණේ වැලිබු බීච්වල කාන්තාවක විසිනි. ඇයගේ බලු පැටවා නැතිවී තිබුණි. ඒ සමගම දුරකථනය නාද වන්නට විය. ජුපිටර් රිසීවරය ගත්තේය.

"හෙලෝ, රහස් පරීක්ෂකයෝ තුන්දෙනාගේ සංගමය. ජුපිටර් ජෝන්ස් කතා කරනවා."

"හායි... ජුපිටර්." ඔවුන් අමතනු ලැබුවේ හෙක්ටර් සෙබස්තියන් විසිනි.

"මට සතුටුයි, ඔයාව අල්ලගන්න පුළුවන් වුණ එක ගැන." සෙබස්තියන් මහතා සතුටෙන් ප්‍රකාශ කළේය.

"මම කියන්න හැදුවෙ, ඉක්මනින්ම ඔයාලව හම්බවෙන්න අමුත්තෙක් ඒවි."

"අමුත්තෙක්....?" ජුපිටර් එයම ප්‍රතිරාවය කළේය.

"මොකක්ද අලුත් සිද්ධියක්ද?" ඔහුගේ දෑස දීප්තිමත් විය.

"නැහැ. ඒ ගැන මම කිසිම ඉඟියක් දෙන්නෙ නැහැ." ලේඛකයා කිවේය.

"මම පොරොන්දු වෙනවා ඒ ගැන වැඩිය කතා නොකරන්න. මම ඔයාලගෙ අමුත්තත් එක්ක ගොඩක් වෙලා කතා කළා. මම එයාට

sinhalaebooks.com

ඔයාල ගැන හොඳ සහතිකයක් දුන්නා. මට එකක් කියන්න පුළුවන්. ඔයාලට පුදුම ආරාධනාවක් ලැබෙන්නයි යන්නේ. ඒ ගමන යන්න මගෙන් සුබ පැතුම්." ඔහු ආපසු රිසිවරය තැබීය.

ජුපිටර් ආපසු දුරකථනය තැබූ පසු ළමුන් තිදෙනාම කුතුහලයෙන් යුතුව එකිනෙකාගේ මුහුණු බලන්නට වූහ.

"ඔයා හිතන්නේ තවත් පරීක්ෂණයක් කියලද?" බොබ් නිහඬ බව බින්දේය.

ඔවුනට එය අනුමාන කරන්නට වේලාවක් නොවීය. එම අවස්ථාවේදීම ජුපිටර්ගේ නැන්දණිය මැටිල්ඩා ජෝන්ස් ඔවුන්ගේ කාර්යාල කාමරයේ ජනේලයෙන් එබී කතා කළාය.

"ජුපිටර් එළියට එන්න. ඔයාලව හම්බ වෙන්න අමුත්තෙක් ඇවිල්ලා."

ළමෝ ඔවුන්ගේ රහස් මාර්ගය භාවිත කරමින් එළියට ආවෝය. පොඩි කාරයක් ඉදිරිපිට නවතා තිබුණි. තරුණ මිනිසෙක් රිය පසෙකින් සිටගෙන සිටියේය. ඔහු වෙන කිසිවකු නොව අනතුර සිදුවන්නට ගිය දිනයේ ඩිජාරෝගේ ආරක්ෂක හමුදාවේ සිටි ඇමෙරිකානුවාය.

"හෙලෝ..., මම හිතුවෙ නැහැ ආයෙ ඔයාලව හම්බ වේවි කියලා. මේක හොඳම වෙලාව මාව අඳුන්වලා දෙන්න. මම බර්ට් යන්ග්. මෙන්න මගේ සහතිකය." ඔහු නිල කාඩ් පතක් පෙන්වා නැවතත් එය සාක්කුවේ රුවා ගත්තේය.

"මේක ඇමෙරිකානු රජයේ නිල කටයුත්තක්." ඔහු කීවේය.

"අපිට කොහෙද නිදහසේ කතා කරන්න පුළුවන් හොඳ තැනක් තියෙන්නෙ?" ඔහු වටපිට බැලීය.

"පිටිපස්සට යමු."

ජුපිටර්ගේ දෙනෙත් විශාල විය. රජයේ නියෝජිතයෙකු ඔවුන් සමග කතා කරන්නේ කුමක් දැයි ඔහුට සිතා ගැනීමට අපහසු විය. සමහර විට සෙබස්තියන් ඉඟි කළ කාරණය මෙය විය හැක. ඔහු එයින් අදහස් කළේ කුමක් දැයි ජුපිටර් කල්පනා කරන්නට විය.

ඔවුන්ගේ වැඩ බිමේ කොටසකට අමුත්තා කැඳවාගෙන යන



ලදී. එහි තිබූ පරණ පුටු දෙකක ජුපිටර් සහ අමුත්තා වාඩි වූහ. බොබ් සහ පීටර් ඒ අසල තිබූ පරණ පෙට්ටි දෙකක් උඩ වාඩි වූහ.

"සමහර විට ඔයාලට අනුමාන කරන්න පුළුවන්ද, ඇයි මම මෙහෙ ආවේ කියලා?" බර්ට් යන්ග් ඇසීය.

ඔවුනට පිළිතුරක් තිබුණේ නැත. ඔවුහු ඔහු දෙස බලා සිටියෝය.

"වෙරෝනාවල ඩිජාරෝ කුමරුගෙ චුවමනාවකට."

"ඩිජාරෝ කුමරු....?"බොබ් පුදුමයෙන් ඇසීය.

"ඇයි එයාට මොකද වෙලා තියෙන්නෙ?"

"එයා සනීපෙන් ඉන්නවා. ඒත් එයා ඉල්ලීමක් කරලා තියෙනවා...." බර්ට් මහතා කතාව තවත් බැරෑරුම් කළේය.

"එයා මගෙත් එක්ක දවස් දෙකකට උඩදි කතා කළා, එයා කැමතියි ඔයාලා තුන්දෙනා එයාව බලන්න යනවා නම්. තවත් සති දෙකකින් එයාගේ රාජාභිෂේකය සිද්ධ වෙනවා. ඒකට ඔයාලට එහෙ නතර වෙන්න සිද්ධ වෙනවා."

"ෂහ්...! නියමයි." පීටර් ප්‍රීතියෙන් කෑ ගැසීය.

"යුරෝපයට යන්න ක්‍රමයක්.... ඔයාට විශ්වාසද එයාට අපිව ඕනෑ බව?"

"ඔයාලා විතරයි. වෙන කවුරුත් නෙමෙයි." බර්ට් ඍජු ලෙස කීවේය.

"මට පෙනෙන විදිහට ඩිස්නිලන්තයට ගියාට පස්සෙ ඔයාල හොඳ යාළුවො වෙලා තියෙනවා. එයාට ගොඩක් යහළුවෝ නැහැ වෙරෝනාවෙ. ඇත්තටම එයාට ගොඩක් යාළුවෝ නැහැ. මොකද එයා කුමාරයෙක් නිසා. ඒත් ඔහු ඔයාලව විශ්වාස කරනවා. එයා කැමතියි එයත් එක්ක යාළුවෝ ටිකක් ඉන්නවා නම්. ඒ නිසයි ඔහු ඔයාලට ආරාධනා කළේ. මම ඔයාලට ඇත්තම කියන්නම්, මම ඔහුගේ මේ යෝජනාවට උදව් කළා."

"ඔයා එහෙම කළා...! ඇයි ඒ?" බොබ් ඇසීය.

"හොඳයි, මම කියන්නම්. වෙරෝනාව කියන්නේ බොහොම



Scanned with CamScanner

sinhalaebooks.com

සාමකාමී රටක්. ඒ වගේම ඒක ස්වාධීන රටක්. හරියට ස්විස්ටර්ලන්තය වගේ. ඒකෙ තේරුම තමයි වෙරෝනාව කාටවත් උදව් උපකාර කරන්නෙත් නැහැ. අනෙක් රටවල් සමග සම්බන්ධතා පවත්වන්නෙත් නැහැ කියන එක."

"ඉතින් ඔය වගේ සුළු ජාතියක් කොහොමද තවත් රටකට උදව් කරන්නෙ?" ජුපිටර් ප්‍රශ්න කළේය.

"ඔයාලා පුදුම වෙයි. එයාලා ඉඩදීලා තියෙනවා ඔත්තු සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන්න. ඒත් මට යන්න බැහැ. දැන් තියෙන ප්‍රශ්නෙ තමයි ඔයාලා කුමාරයගෙ ආරාධනාව පිළිගන්නවද කියන එක."

ඇත්තෙන්ම ඔවුනට වෙරෝනාවට යාමේ අවශ්‍යතාවක් තිබුණි. නමුත් ඔවුනට ප්‍රශ්න කිහිපයක් ඉතිරි වී තිබුණි. පළමු ප්‍රශ්නය වූයේ ඔවුන්ගේ පවුල්වලින් ඒ සඳහා අවසර ලබා ගැනීමයි. ඔවුන්ගේ වියදම් සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම අනෙක් ප්‍රශ්නයයි. තුන්වැනි ප්‍රශ්නය වූයේ පිටරට ගමනකට අවශ්‍ය පාස්පෝට් සකසා නොතිබීමයි.

"මම කතා කරන්නම් ඔයාලගෙ පවුල් එක්ක. මට එයාලට ඒත්තු ගන්වන්න පුළුවන් වේවි මේකෙ තියෙන වැදගත්කම. පළවෙනි දේ තමයි, මම ඉන්නෙ මෙහෙ. මම ඔයාලා ගැන ඇහැ ගහගෙන ඉන්නවා. ඔයාලා කුමාරයගෙ අමුත්තො; අනිත් දේ තමයි, ඔයාලගෙ ගුවන් ටිකට්පත්වල වියදම අපේ රජය දරනවා. ඒ වගේම පාස්පෝට් ටිකත් හදලා දේවි. ඒ විතරක් නෙවෙයි ඔයාලගෙ වියදමට මුදලුත් ලැබෙනවා. එතකොට ඔයාලගෙ ප්‍රශ්නෙ ඉවරයි නේ. හැබැයි අපි හැම වෙලාවෙම රඟපාන්න ඕනෑ. ඒ කිව්වෙ ඇමෙරිකන් සංචාරකයෝ විදිහට. වෙරෝනාවට ගොඩක් කැමති විදිහට. ඒකෙන් මම අදහස් කළේ ඔයාලා නිතරම සමරු සිහිවටන ගන්න, පින්තූර ගන්න, නියම සංචාරකයෝ විදිහට."

බොබ් සහ පීටර් තමන්ට අත් වූ විශාල වාසිය ගැන සිතමින් ආඩම්බර වූහ. නමුත් ජුපිටර් කල්පනා කරන්නට විය.

"ඇයි ඇමෙරිකන් රජය ඒ වගේ දෙයක් කරන්නෙ?"

"මේක ත්‍යාගශීලී දෙයක් නෙමෙයි. අපේ රජය මේ විදිහට ත්‍යාගශීලී වෙන්නෙ නැහැ."



"හෙක්ටර් සෙබස්තියන් කිව්වා ඔයාලා හරි දක්ෂයි කියලා. ඔහු කිව්ව දේ හරි කියලා මට හිතෙනවා. ළමයිනේ, ඇත්ත මේකයි. අපේ රජයට වුවමනා කරලා තියෙනවා, ඔයාලා කනිෂ්ඨ නියෝජිතයෝ විදිහට රජය නියෝජනය කරනවට."

"ඒකෙන් ඔබ අදහස් කරන්නෙ අපි ඩිජාරෝ කුමාරයගෙ ඔත්තුකාරයොද?"

බර්ට් යන්ග් හිස සැලීය.

"සත්තකින්ම නැහැ. නමුත් නිතරම ඔයාලා අවදියෙන් ඉන්න ඕනෑ. සිද්ධ වෙන හැමදෙයක් ගැනම විමසිල්ලෙන් ඉන්න ඕනෑ. ඔයාලට සැක සහිත යම් දෙයක් දැක්කොත් හරි, ඇහුණොත් හරි හැකි ඉක්මනින් මට වාර්තා කරන්න. වෙරෝනාව සසල කරවන සිද්ධියක් වෙන්න පුළුවන්. නමුත් අපි දන්නෙ නැහැ ඒ මොකක්ද කියන්න. අපි හිතනවා ඔයාලා ඒක හොයාගන්න අපට උදව් කරාවි කියලා."

"මේක හරි අමුතු දෙයක් නේ. හරිම බරපතළයි. මම හිතනවා ඒ සම්බන්ධයෙන් තොරතුරු රජය සතුව ඇති කියලා." ජුපිටර් කල්පනා කරන්නට විය.

"අපිත් මිනිස්සු." ඔහු ජුපිටර්ගේ කතාවට බාධා කළේය.

"වෙරෝනාව කියන්නේ තොරතුරු අනාවරණය කරගන්න අපහසු තැනක්. ඔයාලා දන්නවද වෙරෝනාවේ මිනිස්සු හරිම ආඩම්බරයි. එයාලා කවදාවත්ම පිටරටකින් උදව් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ඔයාලා උදව්වක් කළොත් එයාලා ඒකට අපහාස කරාවි. එයාලා එයාලගෙ ස්වාධීනත්වය ඉහළින්ම අගය කරනවා. අපිට එයාලා ගැන දූෂමාන ආරංචි ටිකක් අහන්න ලැබිලා තියෙනවා. මම ඔයාලගෙන් ඉල්ලා සිටින්නේ මේක ස්ථිරවම රහසිගත වැඩක්." බර්ට් යන්ග් ළමුන් එකිනෙකාගේ මුහුණු දෙස විමසිලිමත්ව බලන්නට විය.

"හොඳයි, දැන් මම ඔයාලට අපේ සැකය ගැන විස්තර කරන්නම්කෝ. ස්ටෙෆාන් ආදිපාදවරයා දැනට පාලකයා. ඒත් එයා ඒ තත්ත්වයේ නැහැ. ඔහු ඩිජාරෝ කුමරු ඔටුනු පලඳින තුරු විතරයි පාලකයා වෙන්නෙ. ඔහුට වුවමනා නැහැ ඩිජාරෝට ඔටුනු පලඳවන්න. එයා අගමැති විදිහට ඉහළ මන්ත්‍රණ සභාවට ඇතුළත් වෙනවා. ඒ



Scanned with CamScanner

sinhalaebooks.com

කිව්වේ අපේ කොන්ග්‍රස් එක වගේ. එක හරියට අ[illegible] ගෙන වැඩ කරනවා වගේ. ඉතින් ඔවුන් යම් දෙයක් කරන්න පුළුවන් ඩිජාරෝ රජ වෙන එක වළක්වන්න. දැන් රට ඇතුළෙ තියෙන දේශපාලන ප්‍රශ්න පාලනයට බලපානවා. ආරංචි විදිහට ස්ටෙෆාන්ගේ හිතේ ලොකු අදහසක් තියෙනවා. අපිට දැනගන්න අවශ්‍යයි ස්ටෙෆාන් මොකක්ද කරන්න යන්නෙ කියලා. ඔයාලා මාලිගාවේ නැවතුණොත් අපිත් එක්ක සම්බන්ධය තියාගන්න පුළුවන්. ඒ වගේම වෙරෝනාව පිළිබඳව ඇත්ත දැනගන්නත් පුළුවන්. ඔයාලා ඩිජාරෝට උදව් කරනවා කියලා එයා දැන ගත්තොත් ගොඩක් ආඩම්බර වේවි. නමුත් ඒක අනිත් අය දැනගන්න බැහැ. හිතන්න, ඔයාලා සාමාන්‍ය ළමයි විතරයි. වචනයක්වත් පිටවෙන්න බැහැ. ගොඩක් පරිස්සම් වෙන්න ඕනෑ. ඔයාලා ඒ වගකීම භාරගන්නවද?"

බොබ් සහ පීටර් ජුපිටර් දෙස බැලීය. ජුපිටර් මඳක් කල්පනාවේ ගැලී සිටියේය. ඔහු හිස සලමින් එය භාරගත් බව ඇඟවීය.

"ඔබට අවශ්‍ය අපි ලවා ඩිජාරෝට උදව් කරන්න නම්, අපි ඒක කරන්නම්. හැබැයි අපේ පවුල්වල අය ඒකට ඉඩ දුන්නොත් විතරයි. ඒත් අපි එයාගේ යාළුවෝ. ඒ නිසා එයාගේ කීර්තියට බලපාන කිසිම වැරදි දෙයක් කරන්නේ නැහැ."

"මොකක්ද කිව්වේ...?" බර්ට් යන්ග් සතුටට පත් විය.


"මම ඔයාලට එක අවවාදයක් දෙන්නම්. ඔයාලා මේ වගේ දෙයක් දන්නවා කියලා ඩිජාරෝට කියන්න එපා. ඒ වගේම කිසිම කෙනෙකුට අනුමාන කරන්නත් දෙන්න එපා ඇයි ඔයාලා එහේ ඉන්නෙ කියලා. ඒ වගේම වෙරෝනාවේ මිනිස්සු ඩිජාරෝට පක්ෂපාතයි. ඔවුන් ඩිජාරෝගේ පියාට තාමත් වැඳුම් පිදුම් කරනවා. එයා නැති වුණේ දඩයමේ ගිහින් සිද්ධ වුණු අනතුරකින්. ඒ දැනට අවුරුදු අටකට ඉස්සර වෙලා. එයාලා ස්ටෙෆාන්ට කොහෙත්ම කැමති නැහැ. නමුත් එයාලා හිතුවොත් ඔයාලා ඔත්තු බලනවා කියලා, විශාල උද්ඝෝෂණයක් සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා ඇස් කන් හොඳින් ඇරගෙන ඉන්න. කට පුළුවන් තරම් වහගෙන ඉන්න. එහෙම නම් ඔක්කොම හරි. මම යන්නම් ළමයිනේ." බර්ට් යන්ග් ඔවුන්ගෙන් සමු ගත්තේය.



3

# රිදී මකුළුවා

බොබ් ගලින් නිම කරන ලද සඳලුතලයට වී ඩෙන්සෝ පැරණි නගරයේ හිස් අවකාශය දෙස බලා සිටින්නට විය. උදෑසන රන්වන් හිරුඑළිය නගරය පුරා පැතිර ගිය අතර ගොඩනැගිලිවල උස කුළුනු සහ උළු වහල හිරුඑළියෙන් දීප්තිමත්ව බැබළුනි. මඳ සුළඟ තුරු මුදුන් පිසගෙන හමා ආවේය. සැතපුම් එක හමාරකට පමණ දුරින් ඇති විශාල පල්ලියේ රත්රන් කොත කුඩා කඳු ගැටයක් මෙන් දිස් විය. පහළින් පෙනෙන මිදුලේ සිමෙන්ති ඇතිරූ පොළොව උදෑසනම ගැහැනුන් විසින් ඔප දමනු දක්නට ලැබුණි.





Scanned with CamScanner

sinhalaebooks.com

ගලින් නිම කරන ලද මාලිගාවට පිටුපසින් ඩෙන්සෝ ගඟ නගරයට රිදවමින් වේගයෙන් ගලා බසියි. විනෝද ගමන් යන කුඩා බෝට්ටු ගඟ දිගේ පාවේ. එය ඉතාම මනහර දසුනකි.

"සම්පූර්ණයෙන්ම කැලිෆෝනියාවට වඩා වෙනස්." පීටර්, බොබ් වෙත පැමිණෙමින් කිවේය.

"ඔයාට කියන්න පුළුවන්ද මේ නගරය කොච්චර පැරණිද කියලා?"

"මේක ගොඩනගලා තියෙන්නේ 1335 දී." ඔහු කිවේ සැබෑවකි.

ඔවුන් මේ පුදුම ගමනට එන්නට ප්‍රථමයෙන් වෙරෝනාවේ ඉතිහාසය පිළිබඳව කියවා තිබුණි.

"මේක කිප සැරයක්ම ආක්‍රමණය කරලා විනාශ කරලා තියෙනවා. නමුත් ඒ හැම වෙලාවකම මේක ගොඩනගලා තියෙනවා. 1675 දී ඇතිවුණු කැරැල්ලෙදී පෝල් කුමාරයා ජාතික වීරයෙක් බවට පත් වුණා. හරියට අපේ ජෝර්ජ් වොෂින්ටන් වගේ. නගරයට අලුතින් කොටස් එකතු වුණාට තවමත් අපිට වටේටම දකින්න ලැබෙන්නෙ අවුරුදු තුන්සියක පමණ එහා ඈකපු දේවල්මයි."

"මම ඒකට කැමතියි." පීටර් කිවේ සතුටිනි.

"මේ නගරය කොච්චර විතර විශාලද?"

"වර්ග සැතපුම් පනහක් විතර. ඇත්තටම මෙයාලා සුළු ජාතියක්. බලන්න, අර ඈතින් පෙනෙන කඳු වළල්ල දිහා. වෙරෝනාවේ ඉම තියෙන්නෙ එතන. ඩෙන්සෝ ගංගාව සැතපුම් හතක් පමණ දිගට ගලාගෙන යනවා. මිදි වගාව, රෙදිපිළි කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය තමයි මේ රටේ ප්‍රධාන ආදායම් මාර්ග වෙන්නෙ. ගොඩක් සංචාරකයෝ මෙහාට එනවා. මොකද මෙහෙ හොඳ දර්ශනීය දසුන් තියෙන නිසා. හුඟක් වෙලාවට මෙහෙ ඉන්න කඩ සාප්පු හිමියෝ ඇඳගෙන ඉන්නෙ එයාලගෙ පාරම්පරික ඇඳුම් ආයිත්තම්."

ජුපිටර් තම කමිසයේ බොත්තම් පියවමින් චිත් සගයන්ට එකතු විය.

"හරි ලස්සන දර්ශනයක් නේද?" ජුපිටර් ද එම දසුනින් කුල්මත් වී සිටියේය.



"අර පල්ලිය මොකක්ද කියලා දන්නවද බොබ්?"

"මම හිතන්නෙ ඒක සෙන්ට් ඩොමිනික්." බොබ් පිළිතුරු දුන්නේය.

"ඒක තමයි මෙහෙ තියෙන ලොකුම පල්ලිය. ඒ වගේම රත්රන් කොතකුයි, සීනු සවි කළ උසම කුලුනු දෙකකුයි තියෙන්නෙ මේ පල්ලියේ. වම් කුලුනේ තියෙන ඝණ්ටාරෙ නාද වෙන්නෙ පල්ලියෙ කටයුතුවලදීයි, ජාතික නිවාඩු දවස්වලටයි. දකුණු පැත්තෙ තියෙන ඝණ්ටාරයට කියන්නේ පෝල් කුමරුගේ ඝණ්ටාරය කියලා. 1675 කැරැල්ලේදී පෝල් කුමාරයා මේ ඝණ්ටාරය නාද කරලා තියෙනවා. ඒ වෙලාවේ එයාගේ රාජ පාක්ෂිකයෝ දැනගෙන තියෙනවා එයාට උදව් අවශ්‍ය බව. ඔවුන් එකතු වෙලා කැරලිකරුවන් පලවා හැරලා තියෙනවා. එතැන ඉඳලා රාජකීය පවුල විතරයි මේ ඝණ්ටාරය පාවිච්චි කරන්නෙ. පාලකයෙක් ඔටුනු පළඳන විට ඒක සිය පාරක් නාද කරනවා, බොහොම හෙමින්. රාජකීය පවුලට අලුතෙන් කෙනෙක් ඉපදුනාම පෝල් කුමරුගේ ඝණ්ටාරය පනස් වතාවක් නාද වෙනවා. ඒ වගේම රාජකීය පවුලක විවාහ මංගල්‍යයක් සිද්ධ වෙනවා නම් ඒක හැත්තෑපස් වතාවක් නාද වෙනවා. නගරයේ තියෙන අනෙක් ඝණ්ටාර වගේ නෙමෙයි, ඒකෙ ගැඹුරු හඬක් තියෙන්නෙ. අඩුම තරමේ ඒකෙ ශබ්දය හැතැප්ම තුනක් විතර දුරට ඇහෙනවා."

"හොඳ පැරණි වාර්තාවක්නෙ." පීටර් දසත් දක්වා සිනාසුනේය.

"අපි දැන් ඩිජාරෝ කුමාරයව බලන්න යන්න ඕනෑ. ගෘහ පාලක නිලධාරියා දැනුම් දුන්නා එයා අපිත් එක්ක උදේ ආහාරය ගන්න එනවා කියලා."

"උදේ කෑමට කතා කරාවිද? අපි කොහේදිද කෑම ගන්නෙ?" පීටර් විමසුවේ බඩගිනි විලාසයෙනි.

"අපි බලාගෙන ඉමු. අපි අපේ බඩු ඔක්කොම පරීක්ෂා කරලා බලමු. ඔක්කෝම පිළිවෙළට තියෙනවද කියලා. ඔය ඔක්කෝටමත් වැඩිය අපිට ලොකු රාජකාරියක් පැවරිලා තියෙනවා."

එසේ කියමින් ජුපිටර් ආපසු කාමරයට ගියේය. අනෙක් දෙදෙනා ද ඔහු පසුපසින් ඇදුණි.

එහි සිවිලිම ඉතා උසින් පිහිටා තිබුණි. බිත්තිවල තිබූ ජනේල



Scanned with CamScanner

sinhalaebooks.com

දීප්තියෙන් බැබළුණි. කාමරයේ තබා තිබූ ඇඳ අඩි හයක් පළල වූ අතර එහි තිදෙනෙකුට පහසුවෙන් නිදාගත හැකි විය. ඒවායේ කකුල් හොඳින් ඔප දමා කැටයම් කර තිබුණි.

ඔවුන්ගේ ගමන් මලු තවමත් තට්ටුවක් මත තබා තිබුණි. ඒවා පෙරදා සවස ඔවුන්ගේ පිජාමා සහ දත් බුරුසු ගන්නට විවර කළ හැටියටම තිබුණි. පෙර දිනයේ ඔවුහු නිව්යෝර්ක් සිට පැරිස් බලා ගුවන්යානයකින් පැමිණියෝය. ඔවුන් වෙන කිසිදු නගරයක් දුටුවේ නැත. පැරිස් නගරයේදී ඔවුහු විශාල ගුවන්යානයකට මාරු වූහ. එය ඔවුහු ඩෙන්සෝවල පිහිටි කුඩා ගුවන් තොටුපළ දක්වා රැගෙන ආවෝය.

ඉන්පසු රථයක නංවාගත් ඔවුන් මාලිගාව වෙත රැගෙන එන ලදී. ගෘහ පාලක නිලධාරියා ඔවුනට ආචාර කර පිළිගත්තේය. ඩිජාරෝ කුමරු විශේෂ රැස්වීමක සිටි බැවින් ඔවුනට ඔහු හමුවීමට නොහැකි බව දැන්විය. නමුත් පසුදා උදේ ආහාරය ඔහු සමග ගත හැකි බව පවසා තිබුණි. ගමන් තෙහෙට්ටුව නිසා ඔවුහු ඇඳට වැටී නිදන්නට වූහ.

එම නිසාම දැන් ඔවුන්ගේ ඇඳුම් පැලඳුම් සහ බඩු මුට්ටු පිළිවෙළකට තැබිය යුතුය. ඔවුහු ඔවුන්ගේ ඇඳුම් පැලඳුම් කැබිනෙට්ටුවක තැන්පත් කළෝය. ඒ කැබිනෙට්ටුව අවුරුදු පන්සීයකට වඩා පැරණි බවක් ඉසිලීය. ඔවුන් සතුව කාමරා තුනක් තිබුණි. ඒවා වටිනාකමින් ඉතා ඉහළය. එහි ආලෝක විමෝචක බල්බ කිහිපයක් ද, ගුවන් විදුලියක් ද, වෝකිටෝවක් ද, සම්බන්ධ කර තිබුණි. එයටම සවි කළ ඇන්ටෙනා දෙකකින් පණිවුඩ හුවමාරුව පහසු විය. එයින් සැතපුම් දෙකක් පමණ දුරකට පණිවිඩ හුවමාරු කළ හැකි විය. වෝකිටෝව සතු සම්ප්‍රේෂණ උපකරණ දෙකක් තිබුණි. එහි ගුවන් විදුලියට සියලුම සේවාවන් හසුකර ගැනීමේ හැකියාව තිබුණි.

ඇමෙරිකන් තානාපති කාර්යාලයේ සිට බර්ට් යන්ග් නිතරම ඔවුන් බලාපොරොත්තුවෙන් සිටියේය. සෑම රාත්‍රියකම කාමරා වෝකිටෝවෙන් දෙගොල්ල අතර සම්බන්ධය තබා ගැනීමට වගබලා ගත්තේය. ඉක්මනින්ම යම් විශේෂ දෙයක් සිදු වුවහොත් දැන ගැනීම ඔහුගේ අරමුණයි.



"හැම දෙයක්ම හොඳින් සිද්ධ වේවි. ඩිජාරෝ නියමිත වෙලාවට ඔටුනු පලඳාවි. නමුත් මම හිතනවා ඒ වෙලාවෙ කුමක් හෝ සිද්ධ වේවි කියලා. මම බලාපොරොත්තු වෙනවා ඔයාලා අපට උදව් කරාවි කියලා. මම කියන දේ තේරෙනවා නේද? මගෙන් ප්‍රශ්න අහන්න එපා. මම කලිනුත් කිව්වෙ. වෙරෝනාවේ මිනිස්සු කැමති නැහැ එයාලගෙ වැඩවලට කවුරුවත්ම ඇඟිලි ගහනවට. ඔයාලා මම කියපු විදිහට සංචාරකයෝ වගේ රඟපාන්න. නිතරම දර්ශනවල පින්තූර ගන්න. හැබැයි ඔයාලා මොනව කළත් හොඳට ඇස් කන් විවෘතව තියාගන්න. ඔයාල මට දිනපතාම ඔයාලගෙ වෝකිටෝවෙන් වාර්තා කරන්න. දැනට ඇති. ඔයාලා පැරිසියට යන ගුවන්යානයට නැග ගත්තට පස්සෙ ගුවන් විදුලියෙන් මමත් එක්ක සම්බන්ධය තියාගන්න. මම වෙරෝනාවට වෙනම ගුවන්යානයකින් එන්නම්. ඔයාලා වාර්තා කරන විට ඉස්සරලම සංකේත භාවිත කරන්න. ඊට පස්සේ වාර්තාව. ඒ විදිහට කරන්න."

බර්ට් යන්ග් නළල පිස දැම්මේය. එය ඉතාමත් බැරෑරුම් පැවරුමකි. සියල්ලන්ගේම බලාපොරොත්තුව වූයේ ඇමෙරිකන් රජයේ රහස් නියෝජිතයින් ලෙස ක්‍රියා කිරීමය.

දැන් සියල්ලෝම ඊයේ සිදුවූ සිදුවීම සහ බර්ට් යන්ග් කියූ දේවල් සිහියට නඟා ගත්හ. පීටර් පළමුවෙන්ම නිහඬ බව බිඳ දැමුවේය. ඔහු තම කැමරාව ගෙන එහි හම් වැස්ම ඉවත් කළේය. එම හම් වැස්ම යට තවත් උපකරණයක් විය. එය ඉතා කුඩා ටේප් රෙකෝඩරයකි.

"අපි ඩිජාරෝ හම්බ වෙන්න ඉස්සර වෙලා යන්ග් මහත්තයව සම්බන්ධ කර ගමුද?"

"ඒක හොඳ අදහස." පීටර් එයට එකඟ විය.

"මම සඳලුතලයට ගිහිල්ලා පින්තූරයක් ගන්නම්."

ජුපිටර් තම කැමරාවත් රැගෙන ඉක්මන් ගමනින් සඳලුතලය වෙත පිය මැන්නේය. ඔහු සෙන්ට් ඩොමිනික් දේවස්ථානයේ රන් කොත නාභි ගත කළේය. ඔහු එහි බොත්තම තද කරත්ම වෝකිටෝව ක්‍රියාත්මක විය.

"පළමුවෙන් වාර්තා කරනවා...." ඔහු සෙමෙන් කීවේය.



Scanned with CamScanner

sinhalaebooks.com

කිසිවකු ඔහු දුටුවේ නම් ඔහු සිතන්නේ ජුපිටර් හොඳ පින්තූරයක් ගැනිමට සූදානම් වන බවකි.

"පළමුවෙන්ම වාර්තා කරනවා. ඔයාට මාව ඇහෙනවද?"

"ඇත්තෙන්ම මට ඔබව හොඳට ඇහෙනවා. මොනවා හරි අලුත් දෙයක් තියෙනවද කියන්න?"

"මම මේක හරියට වැඩ කරනවද කියලා පරීක්ෂා කරලා බැලුවේ. අපිට තවම ඩිජාරෝ කුමාරයව හම්බ වුණේ නැහැ. අපි උදේ කෑම ගනිද්දී එයාව හම්බ වෙන්න බලාපොරොත්තු වෙනවා. මම හොඳ අවධානයෙන් ඉන්නම්."

ජුපිටර් ආපසු කාමරයට ආ විගසම කිසිවෙක් දොරට තට්ටු කළේය.

පීටර් දොර හරිත්ම ඩිජාරෝ කුමරු සිනාහවකින් මුව සරසා ගෙන ඔවුන් දෙස බලා සිටියේය.

"මගේ යාළුවනේ...., පීටර්, බොබ්, ජුපිටර්." ඔහු එසේ කියමින් ඔවුන් වටා දෑත් යවා උණුසුම්ව වැලඳ ගත්තේය.

"මට ඔයාලව දකින්න ලැබුණු එක ලොකු සතුටක්. ඔයාලා මොනවද හිතන්නෙ මගේ රට ගැන. මගේ නගරය ගැන. ඔයාලට තවම ඒවා බලන්න හම්බ වුණේ නැද්ද? දැන් ඉක්මනටම අපි අපේ උදේ කෑම අරගෙන ඉමු."

"එන්න..." ඔහු ආපසු හැරී අතින් සංඥා කළේය.

"ජනේලය ළඟ මේසය ලෑස්ති කරන්න."

තද රතු සහ රන්වන් පාටින් නිම කරන ලද රාජකීය නිල ඇඳුමින් සැරසුනු සේවකයෝ අට දෙනෙක් මේසයක්, පුටු, පිඟන් ආදිය ගෙන ආහ. මේසයට එළන ලද හණ පිළියෙන් සැකසූ රෙද්ද මත දීසිවලට දැමූ බිත්තර, බේකන්, සොසේජස්, කේක් වර්ගයක් සහ කිරි තබා තිබුණි.

"පෙනුමෙන් නම් හොඳයි වගේ. මට හරි බඩගිනියි." පීටර් කීවේය.

"ඒක ඇත්ත. ඔක්කෝමලා කෑම කාල ඉමු. බොබ් එන්න... ඔයා



මොනවා දිහාද බලන් ඉන්නෙ?" ඩිජාරෝ කුමරු විමසිලිමත් විය.

බිත්තියේ මුල්ලේ අඩි දෙකක් පමණ ඉහළින් විශාල මකුළු දැලක මකුළුවෙක් තවමත් දැල වියමින් සිටියේය. බොබ් එදෙස බලා සිටියේ ඩිජාරෝට මෙතරම් සේවකයන් පිරිසක් සිටියදීත් මේ මකුළු දැල් කඩා පිරිසිදු නොකරන්නේ මන්දැයි සිතමිනි.

"මම මේ මකුළු දැල දිහා බලාගෙන හිටියෙ. මම ඒක ශුද්ධ කරලා දාන්නම්." කියමින් බොබ් එදෙසට ළං විය.

ඩිජාරෝ කුමරු ඔහුගේ ගමන වලකන්නට මෙන් කකුල ඉදිරියට එසවීය. ළමුන් පුදුම කරමින් බොබ් පොළොව මත ඇද වැටුණේ මකුළු දැල කඩා දැමීමටත් පෙරය.

පීටර් සහ ජුපිටර් පුදුමයට පත් කරවමින් බොබ්ට නැගී සිටින්නට ඔහු උදව් කළේය. ඔහු වේගයෙන් කතා කරන්නට විය.

"මට සමාවෙන්න, මට ඔබට මීට පෙර අවවාද කරන්න තිබුණා." ඔහු කීය.

"නමුත් මට වෙලාවක් තිබුණෙ නැහැ ඒ ගැන කියන්න. දෙවියන්ට ස්තුති වේවා, මම ඔබට මකුළු දැල කඩන්න ඉඩ ලබා නොදීම ගැන. ඒක දැක්ක එක ගැන මම ගොඩක් සතුටු වෙනවා. ඒක හොඳ මංගල පෙරනිමිත්තක්. ඒකෙ තේරුම ඔයාලට පුළුවන් මට උදව් කරන්න."

ඔහුගේ වචන යමෙකුගේ සවන් උදුරා ගත්තේය. ඔහු දිගු පියවර තබමින් හදිසියේම දොර හැරගෙන ඇතුළු විය. රතු පාට සැට්ටයක් හැඳගත් මිනිසෙක් ඔහු ඉදිරියේ විය. අතිකරු කළු කොණ්ඩයක් සහ ඝනව වැඩුණු උඩු රැවුලක් ඔහු සතු විය.

"ඔව්, බිල්කිස්, මොකක්ද ප්‍රශ්නය?" ඩිජාරෝ විමසීය.

"මම ආවේ ඔබේ උසස්වීමට සුබ පතන්න." මිනිසා කීවේය.

"දැන්ම නෙවෙයි.... මෙතනින් යනවා...." ඩිජාරෝ බෙරිහන් දුන්නේය.

මිනිසා දිගු අඩි තබමින් පිටව ගියේය.



Scanned with CamScanner

sinhalaebooks.com

ඩිජාරෝ දොර වසා ඇමීය. ඔහු හෙමින් සැරේ ඔවුනට ළං විය. හෙමින් කොඳුරන්නට විය.

"ඔය ස්ටෙෆාන්ගෙ මිනිහෙක්. සමහර විට එයා අපේ ඔත්තු බලනවා ඇති. මම හිතනවා මේක ඔයාලට කියන එක වැදගත්. මට ඔයාලගෙ උදව් අවශ්‍යයි. වෙරෝනාවේ රිදී මකුළුවා හොරකම් කරලා."



4

# ඩිජාරෝ විස්තර කරයි

"මට ඔයාලට කියන්න ගොඩක් දේවල් තියෙනවා. ඒත් ඔක්කෝටම ඉස්සරවෙලා අපි කෑම කාලා ඉමු. ඊට පස්සේ කතා කරමු."

බඩගිනි නිසාම ඔවුහු ගිජු ලෙසින් ආහාර ගිල දැමූහ. ඔවුන් ආහාර ගැනීමෙන් පසු මෙහෙකරුවෝ පැමිණ මේස, පුටු, පිඟන් ආදිය අස්කර දැමූහ. බිල්කිස් නැවතත් හොරෙන් එබිකම් කරන්නට නොඑන බව සැක හැර දැනගත් ඩිජාරෝ පුටු කිහිපයක් ජනේලය ළඟට ඇදගෙන කතාව පටන් ගත්තේය.

"මම ඉස්සරලම ඔයාලට වෙරෝනාවේ ඉතිහාසය ගැන කියන්නම්. 1675 පෝල් කුමාරයා රජකම් කරන කාලයේදී කැරැල්ලක් ඇති වුණා. ඒ වෙලාවෙදී පෝල් කුමාරයා අමාත්‍ය මණ්ඩලයේ පවුලේ කෙනෙකුගේ රැකවරණය ලබා ගත්තා. එහෙ ජීවත් වෙන එක ඔවුන්ට අවදානමක් ගෙන දුන්නා. ඒ නිසා පෝල් කුමාරයා ඒ ගෙදර තිබුණු අටුවක හැංගුණා. සතුරන් හැමතැනම හොයා බැලුවත් ඔහුව අල්ලා ගැනීමට හැකිවුණේ නැහැ. එයට හේතුව වුණේ අටුවට යන උගුල් දොර හරහා මකුළු දැලක් බැඳ තිබීමයි. දවස් තුනක් තිස්සේ ඔහු බඩගින්නේ වතුර පිපාසයෙන් ගත කළා. ඒ ගෙදර අයට ඔහුට කෑම දෙන්න විදිහක් තිබුණේ නැහැ. ඇයි දන්නවද, මකුළුවා දොර හරහා දැලක් බැඳලා තිබුණු නිසා. ඒකට බාධා කරන්න ඔවුන් කැමති වුණේ නැහැ. දැක්කා නේද මකුළුවා ඔහුව ආරක්ෂා කරපු හැටි. ඉන්පස්සෙ සණ්ටාරේ නාද කරලා තියෙනවා. ඒ ශබ්දෙට සේනාව රැස්වෙලා කැරලිකරුවන් නගරයෙන් එළවලා දැම්මා. එතන ඉඳලා තමයි අර



Scanned with CamScanner

sinhalaebooks.com

සණ්ටාරෙට පෝල් කුමරුගේ සණ්ටාරය කියලා නම [illegible].

"පෝල් කුමරු රජ වුණාට පස්සෙ එයා රන්කරුවෙකුට කියලා රිදීවලින් මකුළුවකුගේ ලාංඡනයකුයි, දම්වැලකුයි හදාගෙන කරේ පලඳාගෙනයි ඉඳලා තියෙන්නෙ. ඒ වගේම ඔහු ප්‍රකාශයට පත් කරලා තියෙනවා මකුළුවා වෙරෝනාවේ ජාතීන්ගේ මංගල වස්තුව විදිහටත්, රාජ්‍යය පාලනය කරන්නන්ගේ රාජකීය ලාංඡනය විදිහටත්. ඒ විතරක් නෙමෙයි, ඔහු නිල නියෝගයක් කරලා තියෙනවා, එතැන් පටන් කිසිම කුමාරයෙකුට රජ කිරුළ පලඳන්නට බැහැ අර පෝල් කුමරුගෙ රිදී මකුළුවා කරේ පලඳින්නේ නැතිව."

"එදා ඉඳලා මකුළුවා වෙරෝනාවට වාසනාව ගෙනෙන ලාංඡනයක් වුණා. ගෘහනියෝ ගොඩක් සතුටු වුණා ගෙදරක එක මකුළු දැලක්වත් බැඳලා තියෙනවා නම්. ඔවුන් ඒක කරදරයක් කියලා හිතුවෙ නැහැ. ඒ නිසාම හිතාමතා ඔවුන් මකුළුවන්ට කිසිම කරදරයක් කළේ නැහැ."

"ඔයාගේ අදහසට අපේ අම්මා නම් කවදාවත්ම කැමති වෙන්නෙ නැහැ. එයා මකුළු දැල් කඩලා දානවා. එයා හිතන්නෙ මකුළුවො හරිම අපිරිසිදු, විෂ සහිත සත්තු වර්ගයක් කියලා." පීටර් කීවේය.

"වැරදියි. මකුළුවෝ හරිම පිරිසිදු සත්තු විශේෂයක්. ඔවුන් නිතරම පිරිසිදු වෙනවා. හරියට කුඩා බළල් පැටව් වගේ. සමහර විට කළු මකුළුවෝ විෂ සහිත වෙන්න පුළුවන්. ලොකු දිවි මකුළුවෝ පවා එච්චරම විෂ නැති වෙන්න පුළුවන්. පරීක්ෂණයකදී හෙළිවෙලා තියෙනවා, විශේෂයෙන්ම ලෝකයේ මේ කොටසේ ඉන්න මකුළුවෝ විෂ රහිතයි කියලා." ජුපිටර් පැහැදිලි කළේය.

"ඒක ඇත්ත. මෙහෙ වෙරෝනාවේ ඉන්න මකුළුවෝ හිංසාකාරී නැහැ. අපිට සිටින ලොකුම මකුළුවත් අපි නම් කරලා තියෙන්නෙ පෝල් කුමරුගෙ නමින්. ඌ හරිම ලස්සනයි, කහ පාටයි, රත්රන් පාට ඉරි තියෙනවා. උන් නිතරම දොරෙන් පිට පැත්තේ දැල් බඳිනවා. නමුත් සමහර වෙලාවට ඇතුළටත් එනවා. අර මකුළු දැල, බොබ් ශුද්ධ කරන්න හැදුවෙ. ඒක තමයි පෝල් කුමරුගෙ මකුළුවා. ඒ මකුළුවා දැකපු එක මට මංගල පෙර නිමිත්තක්. මොකද කියනවා නම් මම අමාරුවේ වැටිලා ඉන්න වෙලාවෙ ඔයාලා මගෙ උදව්වට ආවා."

"ඒක හොඳයි. මම සතුටු වෙනවා, මම අර මකුළු දැල ශුද්ධ



කරලා දාන්න හැදුව වෙලාවෙ ඔයා ඒක වැළැක්කුව එකට. ඒත් දැන් මොකක්ද ඔයාගේ ප්‍රශ්නෙ?" බොබ් විමසිලිමත්ව විමසීය.

ඩිජාරෝ කුතුහලයට පත් විය. ඔහු හෙමින් හිස සැලීය.

"මේ ගැන කිසිම කෙනෙක් දන්නෙ නැහැ, මම ඇරෙන්න. ඒ වගේම මට විශ්වාසයි ස්ටෙෆාන් ආදිපාදවරයත් මේ ගැන දන්නවා. අලුත් කුමාරයෙක් ඔටුනු පලඳවනකොට වෙරෝනාවේ ගොඩක් කාලෙක ඉඳලා එන චාරිත්‍රයක් තියෙනවා. ඒ තමයි එයා අනිවාර්යයෙන්ම පෝල් කුමරුගේ රිදී මකුළුවා බෙල්ලේ පලඳින්න ඕනෑ. තව සති දෙකකින් මම ඔටුනු පැලඳිය යුතුයි. ඒත් ඒක කරන්න මට පුළුවන් වෙන්නෙ නැහැ."

පීටර්ට අහන්නට යමක් තිබුණි.

"ඇයි ඔයාට බැරි?"

"ඔයා ඒකෙන් අදහස් කරන්නේ කවුරු හරි ඒක හොරකම් කරලා තියෙන නිසා ඒක ඔයාට ආපහු ලැබෙන තුරු රජ වෙන්න බැහැ කියලද?" ජුපිටර් විමසීය.

ඩිජාරෝ එය අනුමත කරමින් හිස සැලීය.

"ඒක හොරකම් කරලා තියෙන්නෙ, එතැනින් ඒ වෙනුවට ආදේශකයක් තියලා. ඒත් ආදේශකයකින් වැඩක් නැහැ. ඉක්මනින්ම රිදී මකුළුවා හොයා ගන්නට බැරි වුණොත් මට නියමිත වේලාවට ඔටුනු පලඳින්න බැරි වෙනවා. මේ ගැන පරීක්ෂණයක් පැවැත්තුවොත් අපි සේරම පොදු අපකීර්තියකට පත් වෙනවා. එහෙම දෙයක් සිදු වුණත් නැතත් මම මේ ගැන කතා කරන්න යන්නෙ නැහැ."

"මම දන්නවා, ඔයාලට හිතෙනවා ඇති මේ වගේ පුංචි ආභරණයකට මෙච්චර කලබැගෑනියක් කරගන්නෙ ඇයි කියලා. ඒත් රිදී මකුළුවා කියන්නෙ අපේ රාජ්‍ය ලාංඡනය. කිසිම කෙනෙකුට වෙරෝනාවෙ ඒ වගේ එකක් ආයෙ හදන්න බැහැ. ඒකෙන් අපේ රටට විශාල සේවයක් සිද්ධ වෙලා තියෙනවා."

"අපි පුංචි රටක්. නමුත් අපිට පැරණි සංස්කෘතියක් තියෙනවා. අපි වටේ තියෙන ලෝකය කොයි තරම් වෙනස් වුණත් අපි ඒවට තදින් බැඳී සිටිනවා. ඔයාලා රහස් පරීක්ෂකයෝ. ඒ වගේම ඔයාලා



Scanned with CamScanner

sinhalaebooks.com

මගේ යාළුවෝ. ඔයාලා හිතනවද ඔයාලට පුළුවන් කියලා ඇත්තම රිදී මකුළුවා මට හොයල දෙන්න."

ජුපිටර් කල්පනාකාරීව යටි තොල සපා ගත්තේය.

"මම දන්නැහැ ඩිජාරෝ. ඔය කියන රිදී මකුළුවා සාමාන්‍ය ජීවත්වෙන මකුළුවෙකුගේ ප්‍රමාණයද?"

"ඇමෙරිකන් සල්ලියක ප්‍රමාණය ඇති."

"ඒ කියන්නෙ ගොඩක් පොඩියි. ඒක ඕනැම තැනක හංගන්න පුළුවන්. සමහර විට ඒක විනාශ කරලා තියෙන්නත් පුළුවන්."

"මම එහෙම හිතන්නෙ නැහැ. ඒක විනාශ කරලා දමන්නෙ නැහැ. ඒක ගොඩක් වටිනවා. ඒක හංගන්න නම් පුළුවන්. ඇනටවුත් ඒක කවුරු හරි හංගලා නම් එයාට ගොඩක් පරිස්සම් වෙන්න වෙනවා. ඒකෙ තේරුම මරණය කියන එක. ස්ටෙෆාන් ආදිපාදවරයට වුණත්." ඩිජාරෝ ගැඹුරු හුස්මක් පිට කළේය.

"හොඳයි, මම කිව්වෙ මට ඔයාලගෙ උදව්ව හැර වෙන කිසිම අදහසක් නැහැ. මට තියෙන. එකම බලාපොරොත්තුව ඔයාලගෙ උදව්ව විතරයි. මම ගොඩක් සතුටු වුණා ඔයාලා මගේ රාජාභිෂේකයට මෙහෙ ආව එකට. දැන් ඔයාලා මෙහේ. ඒත් කවුරුවත්ම දන්නෙ නැහැ ඔයාලා රහස් පරීක්ෂකයෝ බව. කවුරුවත් දැනගන්න අවශ්‍ය නැහැ. මොකද හිතන්නෙ? ඔයාලට මට උදව් කරන්න පුළුවන්ද?" ඩිජාරෝ තම මිතුරන්ගේ මුහුණු දෙස සැලකිල්ලෙන් බැලීය.

"මට හරියටම කියන්න බැහැ. පුංචි රිදී මකුළුවෙක් හංගපු තැනකින් හොයන එක ගොඩක් අමාරු වැඩක්. ඒත් අපි උත්සාහ කරන්නම්. ඒත් මට ඉස්සරලාම දැනගන්න ඕනෑ කොහේදිද හොරකම් කළේ? ඒක මොන වගේද? කියලා. ඔයා කිව්ව නේ, ඒකෙ අනුරුවක් තියෙනවා කියලා."

"ඔව්, ඔව්... හොඳ අනුරුවක් තියෙනවා. එන්න.... මම පෙන්වන්නම්. ඒක කෞතුකාගාරයේ තියලා තියෙනවා."

තිදෙනාම තම කැමරා ද අතැතිව ඔහු පසුපසින් ගලින් නිම කරන ලද කොරිඩෝව දිගේ ගමන් කළෝය. එහි වහල, බිත්ති, බිම සියල්ලක්ම ගලින් නිම කර තිබුණි.



"මේ මාලිගාව හදලා අවුරුදු තුන් සියයක් විතර වෙනවා. මෙකෙ අත්තිවාරමේ සමහර බිත්ති කොටසක් පරණ බළකොටුවට අයිතියි. මෙකෙ කාමර ගොඩාක් තියෙනවා. සමහර කාමරවලට කවුරුවත් යන්නෙත් නැහැ. වෙරෝනාව කියන්නේ දුප්පත් රටක්. මේ මුළු මාලිගාවම නඩත්තු කරන්න සේවකයෝ තියාගන්න එක රටට ඔරොත්තු දෙන්නෙ නැති වියදමක්. ඒ වගේම සමහර කාමර උණුසුම් කරන ඒවා නවීකරණය කරන්නත් වෙලා. උණුසුම් කරන්නෙ නැතිව ඒවායෙ ඉන්න හිතන්නවත් බැහැ."

අගෝස්තු මාසයේ දී පවා ඒවායේ පැවතියේ ඇඩි සීතලකි.

"මෙ පොළොව යට හිර ගෙවල් සහ හිර කුටි පරණ බළකොටුවේ කොටස්." ඩිජාරෝ පෙන්වීය.

ඔවුහු වෙනත් හිණි පෙළක් වෙත ආවෝය.

"රහසේ ඇතුළු වෙන තැනක්. දැන් අපට අවශ්‍ය තැනට යන්න පුළුවන්."

"භයානක චිත්‍රපටියකට හොඳ තැනක්." ඔහු සිනාසුනේය.

ඔවුන් පහළ කොරිඩෝවට ළඟාවත්ම උස මිනිසෙක් වේගයෙන් ඔවුන් වෙත පැමිණියේය. ඔහු ඔවුන් ඉදිරියේ නතර වුණි.

"සුබ උදෑසනක් ඩිජාරෝ.... මේ ඔයාගේ ඇමෙරිකන් යාළුවෝ වෙන්න ඇති?" ඔහු විමසුම් බැල්මක් ඔවුන් වෙත හෙළීය.

ඔහුගේ කතාව විධිමත්ය. ඝන උඩු රැවුල සහ දිගු නාසය ඔහුට ගෙන ආවේ රළු මෙන්ම කපටි පෙනුමකි.

"සුබ උදෑසනක් ස්ටෙෆාන් ආදිපාදතුමනි, මේ මගේ යාළුවෝ. මේ ඉන්නෙ ජුපිටර් ජෝන්ස්, මේ පීටර් ක්‍රේන්ෂෝ, මෙයා බොබ් ඇන්ඩෘස්. මෙයාලා ඔක්කෝම ඇමෙරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්තයේ."

උස මිනිසා එකිනෙකාට අතට අත දෙමින් තමාව හඳුන්වා දුන්නේය. ඒ අතර ඔහුගේ තියුණු ඇස් ඔවුන් හොඳින් නිරීක්ෂණය කළේය.

"වෙරෝනාව ඔබලව සාදරයෙන් පිළිගන්නවා." ඔහු විධිමත් ලෙස කිවද හඬ රළු විය.



Scanned with CamScanner

sinhalaebooks.com

"ඔයා යාළුවන්ට බළකොටුව පෙන්නුවද?"

"නැහැ, අපි කෞතුකාගාරයට යනවා. එයාලා අපේ ඉතිහාසයට ගොඩක් කැමතියි." ඩිජාරෝ කීවේය.

"මගේ තාත්තා දඩයමේ ගිහිල්ලා අනතුරකින් මිය ගියාට පස්සෙ, එතැන ඉඳලම රට පාලනය කරන්නෙ ස්ටෙෆාන් ආදිපාදවරයා." ඩිජාරෝ තම යහළුවන්ට ඔහු ගැන හැඳින්වීමක් කළේය.

"ඊළඟට ඔබේ නම කුමාරයාණෙනි." ස්ටෙෆාන් ආදිපාදවරයා ඉක්මනින් කීවේය.

"ඔබේ යහපත උදෙසා, ඔබේ උපකාරයට මම ඔබත් එක්ක ඉන්නවා. මම දැක්කා ඔබේ යහළුවෝ ඉතා විනීත ලෙස හැසිරෙනවා." ස්ටෙෆාන් තව දුරටත් කීවේය.

"බොහොම හොඳයි. මගේ යාළුවෝ ගැන එහෙම සහතිකයක් දුන්නට." ඩිජාරෝ පිළිතුරු දුන්නේය.

"මම හිතනවා ඔබට අද උදේ මන්ත්‍රණ සභාවේ රැස්වීමක් තියෙනවා කියලා. ඒ නිසා අපි ඔබේ කාලය ගන්න කැමති නැහැ." ඔහු මඟ හැර යාමේ වුවමනාවෙන් මෙන් ඩිජාරෝ කීවේය.

"ඔව්. ඒක ඇත්ත. තව සති දෙකකින් පැවැත්වෙන ඔබේ රාජාභිෂේකය පිළිබඳ කරුණු ටිකක් සලකා බලන්න තියෙනවා. ඒත් මට ඔයාලා වෙනුවෙන් පොඩි වෙලාවක් ගන්න පුළුවන්."

එය අනවශ්‍ය බව පැවසූ මුත් ස්ටෙෆාන් ආදිපාදවරයාද ඔවුනට එක් විය. ඩිජාරෝ තම මිතුරන් සමග කොරිඩෝව දිගේ ගොස් පහළට බැස්සේය. එය ඉතා විශාල කාමරයක් වූ අතර එහි වහලය බොහෝ ඉහළින් පිහිටියේය. පින්තූරවලින් බිත්ති ආවරණය වී තිබුණි. මුළු කාමරයම පිටත වීදුරු යොදා ආවරණය කර තිබූ අතර එහි ඇතුළත පැරණි කොඩි, පලිහ, හෙල්ල, කඩු, පදක්කම්, පොත් ආදී විවිධ කෞතුක භාණ්ඩ තැන්පත් කර තිබුණි. සුදු පැහැති සටහන් පතක් ඒ කුමක් ඇයි හඳුනා ගැනීමට තබා තිබුණි. එක් තැනක කැඩුණු කඩුවක් තබා තිබුණි. ළමයි එදෙස එබී බැලූහ. එම සටහන් පතේ සටහන්ව තිබුණේ එය පෝල් කුමරුට අයිති එකක් බවත් ඔහු විසින් 1675 දී කළ යුද්ධයේදී භාවිත කළ එකක් බවය.

"මෙන්න මේක තමයි කෞතුකාගාරය." ස්ටෙෆාන් ආදිපාදවරයා කීය.

"අපේ ජාතියේ ඉතිහාසය. ඒත් අපි බොහොම පුළු ජාතියක්. ඒ වගේම පුදුම හිතෙන කිසිම දෙයක් අපේ ඉතිහාසයේ නැහැ. ඒත් කිසිම සැකයක් නැහැ ඔයාලට හොයාගන්න පුළුවන් වේවි, ඇමෙරිකාව වගේ විශාල රටවලින් ආව පරණ මෝස්තරත්."

"නැහැ මහත්මයාණෙනි, ඔබේ රට ඉතාම සුන්දර රටක්." ජුපිටර් විනීත අයුරින් කීවේය.

"මට සමාවෙන්න, රැස්වීමකට සහභාගි වෙන්න තියෙනවා. මම යන්නම්." ඔහු ඔවුන්ගෙන් සමුගෙන පිටව ගියේය.

බොබ් සුසුමක් හෙළා ළය සැහැල්ලු කර ගත්තේය.

"එයා අපිට කැමති නැහැ වගේ." බොබ් කීවේ පහත් ස්වරයෙනි.

"ඒ ඔයාලා මගේ යාළුවෝ නිසා. එයා කැමති නැහැ මට යාළුවෝ ඉන්නවට. ඔහුට අවශ්‍ය නැහැ මට කතා කරන්න හරි, බලපෑම් කරන්න හරි. විශේෂයෙන්ම මම ඇමෙරිකාවට ගිය ගමනින් පස්සෙ. එයාව අමතක කරලා දාමු. මේ බලන්න.... මේ තියෙන්නෙ පෝල් කුමරුගෙ චිත්‍රයක්."

එය ජීවමාන ප්‍රමාණයේ චිත්‍රයකි. එහි පෝල් කුමරු දිලිසෙන රතු පාට නිල ඇඳුමකින් සැරසී සිටි අතර එහි බොත්තම් රත්රන් පාටින් දිලිසුණි. එක් අතක කඩුවක් දරා සිටි අතර කඩුවේ තුඩ පොළොවට බර කරගෙන සිටියේය. මුහුණේ ගාම්භීර පෙනුමක් තිබූ අතර බැල්ම තියුණු විය. ඔහුගේ අනෙක් අත ඉදිරියට දිගු කරගෙන සිටි අතර එහි මකුළුවෙක් සිටියේය. ළමෝ ළං වී එය හොඳින් නැරඹූහ.

"මගේ මුතුන්මිත්තෙක්." ඩිජාරෝ ආඩම්බරයෙන් කීවේය.

"පෝල් කුමාරයා වීරයෙක්. මකුළුවා එයාගේ ජීවිතය බේරුවා."

ළමුන් පින්තූරය නරඹද්දී පිටුපසින් විවිධ භාෂාවන්ගෙන් යුත් කට හඬවල් ඇසෙන්නට විය. ඒ අතර ඉංග්‍රීසි භාෂාව ද විය. කාමරය මිනිසුන්ගෙන් පිරී තිබුණි. ඔවුන්ගෙන් බොහොමයක් සංචාරකයෝ



Scanned with CamScanner

sinhalaebooks.com

වූහ. ඔවුන් අත කැමරා සහ මාර්ග සිතියම් තිබුණි. හෙල්ල අත දරා ගත් රාජ්‍ය සේවකයෝ දෙදෙනෙක් කාමරයේ මුරට සිටගෙන සිටියෝය. එය මුර කරනවාට වඩා සංස්කෘතික අංගයක් ලෙස සැලකිය හැකිය.

එක් ඇමෙරිකන් යුවළක් ඔවුන් පසුපසින් ආවේය.

"ඊ.... ඊ.... අර බලන්න.... කැත මකුළුවෙක්...!" කාන්තාව කෑ ගැසුවාය.

"ෂ්... ෂ්... කෑ ගහන්න එපා. මේ මිනිසුන්ට ඇහුණොත් එහෙම. මෙයාලට මකුළුවෙක් දකිනවා කියන්නෙ වාසනාවන්ත පෙර නිමිත්තක්."

"මොන පිස්සුද? මම එහෙම දැක්කොත්, මට ඉන්නත් තැනක් නැති වෙයි."

පීටර් සහ බොබ් සිනාසුන අතර ඩිජාරෝගේ දෑස් අමනාපයෙන් දිලිසුණි.

විකෙන් වික ළමෝ කාමරය වටා ගොස් තුන්වැනි මුරකරු සිටින තැනට පැමිණියහ. එතැන වූයේ තවත් දොරටුවකි.

"මට ඇතුළට යන්න ඕනෑ." ඩිජාරෝ කීවේය.

"හොඳමයි කුමරුනි." ඔහු පිළිතුරු දුන්නේය.

ඔහු යතුරක් ගෙන පිත්තල අල්ලු ඇල්ලූ බරැති දොර විවෘත කළේය. එය විවෘත වූයේ කෙටි ශාලාවකටය. එහි අවසානයේද දොරක් දක්නට ලැබුණි. එය ද යතුරු දමා තිබුණි. ඩිජාරෝ කුමරු එය ද විවෘත කළේය. එහි ඇතුළත තුන්වැනි දොරක් ද දක්නට ලැබුණි. එය යකඩ ගරාදි වැටකින් යුක්ත විය. අවසානයේ එය ද විවෘත කෙරුණි. ඔවුන් පා තැබූ කාමරය අඩි අටක් පමණ දිග පළලින් යුක්ත වූ හතරැස් කාමරයකි.

එක් බිත්තියක වූ වීදුරු කැබිනෙට්ටුවේ රාජකීය ආභරණ අසුරා තිබුණි. ඔටුන්නක්, සෙංකෝලයක්, මාල කිහිපයක් සහ මුදු ද ඒ අතර විය.

"මේවා රජිනට. රජිනක් ඉන්න දවසක..." ඩිජාරෝ ආභරණ පෙන්වා කීවේය.



"අපිට ගොඩක් ආභරණ නැහැ. අපි එච්චර පොහොසත් රටක් නෙවෙයි. නමුත් ඒවා හොඳින් ආරක්ෂා කරනවා."

ඔහු කාමරය මැද තිබූ කැබිනෙට්ටුවක් ළඟ නතර විය. එහි විශේෂ රඳවනයක් මත රිදී දම්වැලක ඇමුණ- රිදී මකුළුවෙක් විය. ළමුන් පුදුමයට පත් වූයේ එහි පෙනුම සැබෑ මකුළුවෙකු මෙන් දිස් වීමෙනි.

"ඔයාලා හිතුවෙ ඔක්කොම රිදී කියලද? නැහැ, මේකෙ තියෙන්නෙ කළු එනමල් එකේ රත්තරන් කුඩු මිශ්‍ර කරලා. මේ ඇස්වලට තියෙන්නෙ රූබිස් මැණික් කැට. නමුත් මේක වෙරෝනාවේ තියෙන නියම රිදී මකුළුවා නෙවෙයි. ඒක අපෙන් ඈත්වෙලා."

ඩිජාරෝ එසේ කීවද ළමුන්ට රිදී මකුළුවා විශේෂ දෙයකි. ඔවුන් එය එක් එක් කෝණයෙන් සිට අධ්‍යයනය කරන්නට වූහ. නියම රිදී මකුළුවා දුටුවහොත් එය හඳුනා ගන්නේ කෙසේ දැයි යන්න එය අධ්‍යයනය කිරීමේ අරමුණ විය.

"නියම මකුළුවා ගිය සතියේ අරගෙන තියෙනවා. මේ තියෙන්නෙ ඒකෙ අනුරුවක්. මම සැක කරන්නේ එකම මිනිහයි. ඒ තමයි ස්ටෙෆාන් ආදිපාදවරයා. නමුත් මට සාක්ෂි නැතිව කතා කරන්න බැහැ. දේශපාලනය කියන්නේ ප්‍රවේශමෙන් කටයුතු කළ යුතු දෙයක්. ඉහළ මන්ත්‍රණ සභාවේ සියලුම සාමාජිකයො ස්ටෙෆාන්ගෙ මිනිස්සු. මම ඔටුනු පලඳන තුරු මට තියෙන්නෙ සුළු බලයක්. ඒ වගේම ඔවුන්ට වුවමනාවක් නැහැ, මට ඔටුනු පලඳවන්න. මගේ තැන නැති කරන්න ගත්ත පළමු පියවර තමයි රාජකීය මකුළුවා සොරකම් කිරීම." ඩිජාරෝ කීවේ කලකිරුණු හඬිනි.

"ගොඩාක් දේවල් කියලා ඔයාලා පිට බර පටවන්න මම කැමති නැහැ. අනෙක් එක තමයි මට දැන් රැස්වීමකට යන්න ඕනෑ. මගේ කාර් එකයි, රියදුරයි සූදානමෙන්. ඔයාලට පුළුවන් නගරය බලන්න යන්න. අපි ආයේ රෑට හමුවෙමු. රෑ කෑමෙන් පස්සෙ. එතකොට අපිට ආයෙත් කතා කරන්න පුළුවන්."

ඔවුහු ආභරණ තිබූ කාමරයෙන් ඉවත් වූහ. ඩිජාරෝ විසින් නැවතත් සියලුම දොරවල්වලට අගුළු දමන ලදී. ඔවුන් කෞතුකාගාරයෙන් පිටවූ වහාම ඩිජාරෝ ඔවුනට අතට අත දී සමුගත්තද ඔවුන් රැගෙන ඔවුන්ගේ කාරය වෙත ගියේය.



Scanned with CamScanner

sinhalaebooks.com

"මේ රියදුරාගේ නම රූඩි. එයා මට හුඟාක් විශ්වාසවන්තයි. මමත් කැමතියි ඔයාලත් එක්ක යන්න. ඒත් කුමාරයෙක් වීම හරිම අවාසනාවක්. මට ඕනෑ දේ මට කරන්න බැහැ. ඔයාලා ඇති තරම් විනෝද වෙන්න. අපි අද රෑ කතා කරමු." ඔහු කොරිඩෝව දිගේ වේගයෙන් ආපසු ඇවිද ගියේය.

"ඔයා මොනවද හිතන්නෙ ජුපිටර්? අපිට පුළුවන් වෙයිද ඩිජාරෝගෙ රිදී මකුළුවා හොයා ගන්න?" බොබ් තම කෙස් අතරින් සුරත යවා කල්පනා කරන්නට විය.

"අපිට පුදුමාකාර වාසනාවක් තිබුණේ නැත්තම් අපි කොහොමද ඒක හොයා ගන්නෙ?" ජුපිටර් සුසුමක් පිට කළේය.



5

# කූට සංවාදය

රහස් පරීක්ෂක ළමයි තිදෙනා නගරයේ ඇවිදිමින් සතුටු වූහ. වෙරෝනාව විශ්වාස කළ නොහැකි ආකාරයේ පැරණි නගරයකි. එහි නිවෙස් සාදා තිබුණේ ගලෙන් හෝ කහ පාට ගඩොලිනි. එහි වහල සාදා තිබුණේ රතු පාට පතුරු පාෂාණවලිනි. පරෙවියෝ රංචු පිටින් එහෙ මෙහෙ සැරිසරති. විශේෂයෙන්ම ඩොමිනික් දේවස්ථානය ඉදිරිපිට පරෙවියෝ පිරී සිටිති.

ඔවුන් ගමන් කළ මෝටර් රථය ආවරණය නොවූ පැරණි සංචාරක රථයකි. එහි රියැදුරු රූඩි, නියමිත නිල ඇඳුම් හැඳ සිටි අතර ඔහු මැනවින් ඉංග්‍රිසි බස කතා කළේය. ඔහු නිතරම පහත් හඬින් කතා කළ අතර හේ ඩිජාරෝට පක්ෂපාතී වූවෙකි.

ඔවුහු ඩෙන්සෝ ගංගාවේ ඉහළ කොටස නැරඹීමට ගමන් ඇරඹූහ. ඔවුහු එහි ඡායාරූප කිහිපයක්ද ගත්හ.

"අපිව លුහුබඳිනවා." රූඩි හෙමින් කිවේය.

"අපි මාලිගාවෙන් පිටත් වුණු වෙලාවෙ ඉඳලම ඔවුන් අපිව លුහුබඳිනවා. මම දැන් උද්‍යානයට යන්නේ. ඔයාලට පුළුවන් එහිදී ඇවිදින්න. ඔයාලව සතුටු කරන්න අය එහේ ඉන්නවා. එයාලත් එක්ක විනෝද වෙන්න පුළුවන්. අර අය අපේ පස්සෙන් එනවා. ඒත් ආපහු බලන්න එපා. ඔවුන්ට දැනගන්න තියන්න එපා ඔයාලා එයාලා ගැන සෙවිල්ලෙන් ඉන්නවා කියලා."

ඔවුන් පසුපස බැලුවේ නැත. එම දුෂ්කර විධානයට ඔවුහු



Scanned with CamScanner

sinhalaebooks.com

කිකරු වූහ. ඔවුන් පසුපස ලුහුබඳින්නේ කවුරුන්ද? ඒ කුමකටද?

"ඇයි අපි පස්සෙන් එන්නේ? අපි කිසිම දෙයක් දන්නෙ නැහැ." පීටර් කෙඳිරුවේය.

"කවුරු හරි, අපි මොනවා හරි කරයි කියලා හිතනවා ඇති." ජුපිටර් කීවේය.

රූඩි මෝටර් රථය නතර කළේය. විශාල තුරුවලින් වැසී ගිය උද්‍යානයකට ඔවුහු පැමිණියහ. එහි බොහෝ මිනිස්සු එහාට මෙහාට ඇවිද ගියෝය. සිහින් සංගීත රාවයක් ඔවුන්ගේ සවනත වැකුණි.

"මේක තමයි අපේ ප්‍රධාන උද්‍යානය." ඔහු කීවේ එහි දොරටුවෙන් ඇතුළු වෙමිනි.

ඔවුහු ඇතුළට හෙමින් ඇවිද ගියෝය.

"ඔයාලා විනෝදය සපයන්නන් ළඟට ගියොත් විහිළුකාරයෝ, සර්කස්කාරයෝ බලන්න පුළුවන්. එයාලගෙ පින්තූර ගන්න පුළුවන්. එතැන බැලූන් විකුණන ගැහැනු ළමයෙක් ඇති. එයා මගේ සහෝදරි එලීනා. ඔයාලා ආපහු එනතුරු මම මෙතන ඉන්නම්. ඔයාලා පස්ස බලන්න එපා. සමහර විට කවුරු හරි ඔයාලගෙ පස්සෙන් ඒවි. ඒත් ඒ ගැන කලබල වෙන්න එපා. කලබල වුණත් ඇන්මම නෙවෙයි."

"කලබල වුණත් ඇන්මම නෙමෙයි?" පීටර් එම වදන් පෙළ ප්‍රතිරාවය කළේය.

ඔවුහු සංගීතය ඇසෙන දෙසට හෙමින් ගමන් කරන්නට වූහ.

"අපි කොහොමද ඩිජාරෝට උදව් කරන්නෙ?" බොබ්ට දැන ගැනීමට අවශ්‍ය විය.

"මේ වල් පාත්තයෙක් අපේ පස්සෙන් පන්නන්න ගත්තානේ. අපිට මොකුත් කරන්න බැහැ." පීටර් කනස්සල්ල පළ කළේය.

"අපිට ටිකක් බලාගෙන ඉන්න වෙනවා අලුතෙන්ම ඇතිවෙන තත්ත්වය මොකක්ද කියලා." ජුපිටර් කල්පනාකාරීව කීවේය.

"මට හිතෙනවා අපිව ලුහුබඳින කෙනාව දකිද්දි අපි බර්ට් යන්ග් එක්ක සම්බන්ධ වෙන්න ඕනෑ."



ඔවුහු තව ටික දුරක් ඇවිද ගියහ. එළිමහනක තණ පිටිය මත මිනිස්සු හිඳ සිටියහ. මිනිසුන් අට දෙනෙකුගෙන් යුත් සංගීත කණ්ඩායමක් දිලිසෙන නිල් පාට ඇඳුමින් සැරසී සිටියහ. ඔවුන්ගේ එක් වාදනයක් අවසන් වෙත්ම වටේ සිටින මිනිස්සු ඔල්වරසන් හඬ නැගූහ. ඒ සමගම ඔවුහු වෙනත් වාදනයක් පටන් ගත්හ. රහස් පරීක්ෂකයෝ තිදෙනා හෙමින් ගමන් කර සිමෙන්ති අතුරා ඇති තැනකට සේන්දු වූහ.

රූඩි සඳහන් කළ විනෝදය සපයන්නන් සිටින්නේ එහිය. ජිම්නාස්ටික්, පිනුම් ගසන්නෝ, විහිළුකාරයෝ එහි සිටියෝය. ඔවුන්ගේ රංගනයන් අවසාන වූ පසු පොඩි භාජනයක් ගෙන විහිළුකාරයෝ දෙදෙනෙක් වටේ යති. නරඹන්නෝ එයට කාසි දමති.



සිත් ගන්නා සුළු ගැහැනු ළමයෙක් බැලූන් විකුණමින් සිටියාය. ඇය යන එන්නන්ගෙන් බැලූනයක් ගෙන අහසට නිදහස් කරන ලෙස ඉල්ලමින් ඉංග්‍රීසියෙන් ගීතයක් ගායනා කළාය. බොහෝ මිනිස්සු බැලූන් ගෙන අහසට නිදහස් කළෝය. කහ පාට, රතු පාට, නිල් පාට බැලූන් අහසේ ඉහළ ගොස් අතුරුදහන් විය.

"විහිළුකාරයන්ගෙ පින්තූර ටිකක් ගන්න පීටර්. මම ජිම්නාස්ටික්

sinhalaebooks.com

සරඹ ටිකක් පින්තූර ගන්නම්. බොබ් ඔයා හොඳට වටපිට බලන්න. සැක කටයුතු කෙනෙක් ඉන්නවද කියලා." ජුපිටර් කිව්වේය.

"හරි, මම ඉස්සරලම පිනුම් ගහන විහිළුකාරයන්ගෙ පින්තූර ටිකක් ගන්නම්කෝ." පීටර් එදෙසට ඇවිද ගියේය.

ජුපිටර් බොබ් සමග එකතුව ඡායාරූපයක් ගැනීමට සූදානම් විය. ජුපිටර් වෝකිටෝව ක්‍රියාත්මක කළේය.

"අපිව ඇහෙනවද?" ජුපිටර් හෙමින් ඇසීය.

"ඔව්. හඬ හොඳට පැහැදිලියි." බර්ට් යන්ග්ගේ හඬ කැමරාව පිටුපසින් නිකුත් විය.

"කොහොමද තත්ත්වය?"

"අපි දැන්නම් මෙහෙ දර්ශන නරඹනවා. ඩිජාරෝ කුමාරයා අපෙන් උදව් ඉල්ලනවා. එයාගේ රිදී මකුළුවා හොරකම් කරලා."

"ඕහ්...! මම හිතුවටත් වැඩිය වැඩේ නරක අතට හැරිලා. ඉතින් ඔයාලට පුළුවන්ද එයාට උදව් කරන්න."

"තවම ඒ ගැන මොකුත් කියන්න බැහැ." ජුපිටර් කීය.

"කමක් නැහැ. ඔයාලා හොඳට ඇස් ඇරගෙන ඉන්න. වෙන මොනවද තොරතුරු?"

"අපි දැන් ඉන්නෙ උද්‍යානයක. කවුරු හරි අපිව ලුහුබඳිනවා. ඒත් අපි දන්නෙ නැහැ ඒ කවුද කියලා."

"උත්සාහ ගන්න. එයාලව හොඳට බලාගන්න. මට පස්සෙ ඒ විස්තර එවන්න. ඔයා කතා කරද්දි කවුරු හරි සැක කරන්න පුළුවන්."

බර්ට් යන්ග් කතාව හමාර කළ පසු ජුපිටර් පින්තූර ගත්තේය. ඒ අතරේ බොබ් වටපිට බලමින් වටේ ගමන් කරන්නට විය. ඔහු ඔවුන් දෙස බලා සිටින කිසිවෙකුත් දුටුවේ නැත. ඔහු ඇමෙරිකන් කාසියක් විහිළුකාරයන්ගේ බඳුනට දැම්මේය.

දැන් විහිළුකාරයින් ප්‍රංශ බලු පැටවකු ලවා උගේ සෙල්ලම් පෙන්වීමට මෙහෙයවති. ඌ කරණම් ගසමින් ඉදිරිපස පාද දෙකෙන් සිට ගනියි. සෙනඟ වටවී එදෙස බලා සිටිති. බැලූන් විකුණමින් සිටි



ඇරියද් මඳකට තම වෙළඳාම නතර කර එදෙස බලා සිටියාය.

"දැන් අපි අර ගෑනු ළමයගෙ පින්තූරයක් ගමුද?" ජුපිටර් අනෙක් අයට කෙඳිරීය.

ජුපිටර් ඈ වෙත කැමරාව යොමු කළේය. එවිටම ඇය එය දුටුවාය. ඇය සිනාසෙමින් පින්තූරයක් ගන්නට අවශ්‍ය ඉරියව්වට පැමිණියාය. ජුපිටර් ඇගේ ඡායාරූපයක් ගත් පසු ඇය ඔවුන් වෙත පැමිණියාය.

"තරුණ ඇමෙරිකන් මහත්වරුනි, බැලූනයක් ගන්න. ඒක අහසේ පා කරලා අරින්න. ඒත් එක්කම ඔබලාගේ බලාපොරොත්තුත් ස්වර්ගයට යවන්න." ඇය කීවාය.

පීටර් ඇය අත මුදල් තැබුවේය. ඇය තිදෙනාගේ අත්වල බැලූනය බැගින් තැබුවාය. ඇය ඉතිරි කාසි ඔවුනට දෙන්නට නැවෙන ගමන්ම යමක් මිමිණුවාය.

"ජෝඩුවක් ඔයාලගෙ පස්සෙන් එනවා. පෙනුමෙන් නම් එයාලා භයානක නැහැ. මම හිතන්නෙ එයාලට ඔයාලට කතා කරන්න ඕනෑ වගෙයි. අර අතන තියෙන මේසෙට ගිහිල්ල අයිස් ක්‍රීම් ගෙන්න ගන්න. එයාලත් එතැනට ඒවි. ඉතින් ඔයාලට පුළුවන් එයාලත් එක්ක කතා කරන්න."

ළමෝ ප්‍රාර්ථනාවක් කරමින් බැලූන් නිදහස් කළහ. ඔවුහු ඒවා ඈත අහසේ කුඩා තිත් බවට පත්වන තුරු බලා සිටියහ. ඉන්පසු ඔවුහු මඳක් ඉදිරියට ගමන් කළහ. රතු කොටු රෙද්දෙන් සැරසූ මේස තැනින් තැන තබා තිබුණි. ඔවුන් එක් මේසයක වාඩි වූ පසු ඉක්මනින්ම පැමිණි සේවකයා,

"අයිස් ක්‍රීම්, උණුසුම් චොක්ලට්, සැන්විච්ස් ඕනෑද?" යනුවෙන් විමසීය.

ඔවුහු හිස වනා එය අනුමත කළහ. ඔවුහු ඒ වනවිට වටපිටාව පිරික්සන්නට වූහ. බැලූන් මිලදී ගන්නා ගැහැනියක් සහ මිනිසෙකු ඔවුහු දුටුවෝය. බොබ්ට ඔවුන් වහා හඳුනා ගැනීමට හැකි විය. උදේ කෞතුකාගාරයේදී පෝල් කුමරුගේ ප්‍රතිමාව ළඟදී ඔවුන් දුටු බව ඔහුට මතකය.



Scanned with CamScanner

sinhalaebooks.com

ඔවුහු දෙදෙනා හෙමින් සැරේ පැමිණ ළමුන් තිදෙනා අසල මේසයක වාඩි ගත්හ. ඔවුහු අයිස් ක්‍රීම් සහ කෝපි ඇණවුම් කිරීමෙන් පසු ළමුන් වෙතට හැරී සිනහ පෑවෝය.

"ඔයාලා ඇමෙරිකන් ළමයි නේද?" කාන්තාව ගැඹුරු හඬින් විමසුවාය.

"ඔව්, නෝන මහත්මයා, ඔයාලත් ඇමෙරිකාවෙ නේද?" ජුපිටර් විමසීය.

"ඇත්තෙන්ම ඔව්. අපි ඇමෙරිකාවේ, කැලිෆෝනියාවල. හරියට ඔයාලා වගේම."

ජුපිටර් කලබලයට පත් විය.

'එයාලා කොහොමද දැන ගත්තෙ අපි කැලිෆෝනියාවෙ කියලා.' ජුපිටර් සිතන්නට විය.

"ඔයාලා කැලිෆෝනියාවෙන් නේද? එහෙම නෙවෙයිද? ඒ කොහොම වුණත් ඔයාලා ඇඳගෙන ඉන්නෙ කැලිෆෝනියාවේ ක්‍රීඩකයෝ අඳින මෝස්තරයේ කමිස." මිනිසා ඉක්මනින්ම කීවේය.

"ඇත්ත මහත්මයා, අපි කැලිෆෝනියාවේ තමයි. අපි ඊයේ රෑ තමයි මෙහෙ ආවෙ."

"අද උදේ අපි දැක්කා ඔයාලා අර බළකොටුවෙ තියෙන කෞතුකාගාරයේදී. ඔයාලත් එක්ක ඩිජාරෝ කුමාරයත් හිටිය නේද?" කාන්තාව විමසුවාය.

"ඔව්. එයා අපට හැමදෙයක්ම පෙන්නුවා." ජුපිටර් හිස වැනිය.

"මම හිතන්නෙ අපි පොඩ්ඩක් මූණ කට සෝදා ගත්තොත් හොඳයි කියලා, වේටර් අපට කෑම ගෙනෙන්න ඉස්සරලා." ජුපිටර් බොබ් සහ පීටර් දෙස බැලීය.

"මම දැක්කා පොඩ්ඩක් එහායින් මුහුණ කට සෝදාගන්න තැනක් තියෙනවා."

ජුපිටර් ඊළඟ මේසයේ සිටි ජෝඩුව වෙත ළං විය.

"අපි යනවා, පොඩ්ඩක් මුහුණ කට සෝදාගෙන එන්න. අපි



ගිහිල්ලා එනකල් අපේ කැමරා බලා ගන්න පුළුවන්ද?"

"අයියෝ, ඕක මොකක්ද? ඇත්තටම පුළුවන් ළමයිනේ." මිනිසා කට පළල් කර සිනාසුනේය.

"බය වෙන්න එපා. අපි ඒවා කාටවත් ගන්න දෙන්නෙ නැහැ."

"ගොඩක් ස්තුතියි, මහත්මයා."

ජුපිටර් එසේ කියමින් මුහුණ කට සෝදා ගන්නා ස්ථානය කරා ගමන් කරන්නට වූයේ අනෙක් දෙදෙනාට වචනයක්වත් කතා කරන්නට ඉඩ නොතබමිනි. බොබ් සහ පීටර් ද කිසිවක් සිතාගත නොහැකිව ඔහු පසුපසින් ගමන් කරන්නට වූහ.

"මොනවද ඔයා මේ කරන්නෙ ජුපිටර්? ඇයි අපි එතනින් ආවෙ? අනිත් එක අපේ කැමරාත් ඇලා." පීටර්ට කුතුහලයකි.

"ෂ්... ෂ්... සද්ද කරන්න එපා. මට පොඩි අදහසක් ආවා. දැන් එන්න මගෙත් එක්ක."

ඔවුහු බැලූන් විකුණන ගැහැනු ළමයා වෙත පැමිණියෝය.

"කරුණාකරලා අර දෙන්නා දිහා පොඩ්ඩක් බලාගෙන ඉන්න. එයාලා අපේ කැමරා ඇල්ලුවොත් අපට කියන්න. අපි විනාඩියෙන් ආපහු එනවා."

ඇය හිස වනා එය පිළිගත්තාය. රහස් පරීක්ෂකයෝ තිදෙන දැකුම්කලු තැන් නරඹමින් නිදහසේ ගමන් කළෝය.

මුහුණ කට සෝදා ගැනීමට තිබූ කාමරය ගලින් නිම කරන ලද්දක් වූ අතර එය ගස්වලින් වට වී තිබුණි. ඔවුන් ඇතුළට ගිය සැනින් පීටර් ප්‍රශ්න කරන්නට විය.

"මොකක්ද ඔයා කරන්න යන්නෙ ජුපිටර්?"

"කාරණා දෙකක්." ජුපිටර් චතුර කරාමය ඇරියේය.

"සමහර විට එයාලා අපි නැති අතරේ කතා කරන්න ඉඩ තියෙනවා. නැත්තම් හෙමින් සැරේ මාරු වෙලා යන්නත් පුළුවන්."

"ඒත් ඉතින් ඒකෙන් අපිට ඇති වැඩේ මොකක්ද?" බොබ් තම දැත් සෝදමින් කතාවට හවුල් විය.



Scanned with CamScanner

sinhalaebooks.com

"මම මගේ කැමරා එකේ ටේප් රෙකෝඩරය ක්‍රියාත්මක කරලයි ආවේ. ඒක හරිම සියුම්. එයාලා කියන ඕනෑම දෙයක් ඒකේ පටිගත වෙයි."

ඔවුහු මුහුණ කට සෝදා ගැනීමෙන් පසු හෙමින් සැරේ ඇවිදගෙන ඔවුන්ගේ මේසය වෙත පැමිණියෝය. ඔවුන් බැලුන් විකුණන ගැහැනු ළමයා ළඟින් යනවිට ඇය එක්වරම හිස වනා කිසිදු දෙයක් සිදු නොවූ බව හැඟවූවාය. ඔවුන්ගේ කැමරා ඒ අයුරින්ම මේසය මත තිබුණි. යාබද මේසයේ වූ කාන්තාව සහ මිනිසා කෝපි තොල ගාමින් සිටියෝය.

"කිසිම කෙනෙක් ඔයාලගෙ කැමරාවලට කරදරයක් කළේ නැහැ. මේ රටේ මිනිස්සු හරිම අවංකයි. සේවකයා ඔයාලා ඇණවුම් කරපු ඒවා ගෙනාවා. මම කිව්වා ඔයාලා පොඩ්ඩකට එළියට ගියා කියලා. ආහ්...! කියනකොටම, අර එයා ආපහු එනවා."

සේවකයා ආහාර පුරවන ලද බන්දේසියක් ඔවුන් වෙත රැගෙන ආවේය. එහි අයිස් ක්‍රීම්, උණු චොකලට්, සැන්ඩ්විච් අඩංගු විය. දිවා ආහාරයට වෙන කිසිවක් නොමැති බව ඔවුහු අවබෝධ කර ගත්හ. දැඩි කුසගින්නේ සිටි ඔවුහු ආහාර ගන්නට වූහ. මිනිත්තු කිහිපයකට පසු ඔවුන්ගේ මේසයට යාබද මේසයේ සිටි යුවළ ඔවුන්ගේ කාර්යය නිම කර ඔවුන්ගෙන් සමුගෙන යන්නට ගියෝය.

"එයාලා අපිත් එක්ක කතා කළාට පස්සෙ එයාලගෙ හිත වෙනස් වුණා වගේ." පීටර් තමාට හැඟුන දේ කීවේය.

"අපි බලමු, එයාලා මොනවද කතා කළේ කියලා." ජුපිටර් කැමරාව ගත්තේය.

ජුපිටර් කුඩා බොත්තමක් එබූ සැනින් හඬ පටිය එතෙන්නට විය. වෙනත් බොත්තමක් එබූ විට හඬ පටිය ක්‍රියාත්මක විය. පළමුවෙන්ම මිනිසාගේ කට හඬ එතුළින් ඇසුණි. බොබ් පුදුමයෙන් උඩ පැන්නේය.

"ඒක වැඩ කරනවා. ඔයා හරි ජුපිටර්." ඔහුගේ සතුට නිම්හිම් නැති විය.

"ෂ්... ෂ්..." ජුපිටර් දෙතොලට දබරැඟිල්ල තබා ඔහු නිහඬ කළේය.



"එයාලා මොනවද කියන්නෙ කියලා ඇහුම්කන් දෙන්න. කැමරාව දිහා බලන්න එපා. කෑම කන්න."

ජුපිටර් නැවතත් හඬ පටිය ඔතා නැවත එය වාදනය කළේය. එහි හඬ අඩු කරනු ලැබුවේ අසල සිටින අයට එය ඇසේවි යැයි යන සැකයෙනි. එවිට ඔවුන්ට ඇසුණේ මෙවැනි සංවාදයකි.

මිනිසා : මට හිතෙන්නෙ ෆ්‍රෙඩී අපිව එවලා තියෙන්නෙ වල් පාත්තයො දඩයමක. මේ කොල්ලො තුන්දෙනා රහස් පරීක්ෂකයෝ නම් මම මගේ ඔළුව කනවා.

කාන්තාව : ෆ්‍රෙඩී නිතරම වැරදි කරන්නෙ නැහැ. එයා කිව්වෙ දක්ෂ කොල්ලො තුන්දෙනෙක් කියලා. පොඩ්ඩක් හොයලා බලන්න කියලා.

මිනිසා : පෙනෙන්නෙ නැද්ද? ඒ කොල්ලො දැනුත් සෙල්ලම. ඔයා මට කියන්න එපා එයාලා ප්‍රශ්න විසඳනවා කියලා. ඇයි දන්නවද? මම ඕනෑ තරම් දැකලා තියෙනවා ඔය වගේ මෝඩ පෙනුම තියෙන කොල්ලො.

කාන්තාව : ඒක එහෙම තමයි. ෆ්‍රෙඩී කිව්වෙ අපිට එයාලගෙ පිටිපස්සෙන් යන්න කියලා. සමහර විට එයාලා වෙන කෙනෙක් එක්ක සම්බන්ධතාවයක් පැවැත්වුවොත් එයා හිතන්නෙ මේ ළමයි සී. අයි. ඒ. එකත් එක්ක වැඩ කරනවා කියලා.

මිනිසා : එයාලා දන්නෙ නැහැ කිසිම දෙයක් කිසිම කෙනෙකුට කියන්න. නිකම් විනෝද වෙන්න ආව කොල්ලො ටිකක්.

කාන්තාව : ඔයා එයාලත් එක්ක ස්ටෙෆාන් ආදිපාදතුමාගේ සැලැස්ම ගැන කතා කරන්න යන්නෙ නැද්ද?

මිනිසා : නැහැ. මම හිතන්නෙ නැහැ, ඒ අදහස හොඳයි කියලා. මොකද ෆ්‍රෙඩීට විතරයි ඒ ගැන යමක් කරන්න පුළුවන්. කුමාරයව එළියට දාලා ස්ටෙෆාන් ආදිපාදතුමා නියම පාලකයා කරනවා. එතකොට ස්ටෙෆාන් අපේ අතේ. ඇත්තෙන්ම ඉන්පස්සෙ රොබොටෝ සහ අපේ හවුලෙන් තමයි මේ රට පාලනය වෙන්නෙ.



Scanned with CamScanner

sinhalaebooks.com

කාන්තාව : ඔයාගේ ශබ්දය අඩු කර ගන්නවා නම් හොඳයි. කවුරු හරි ඇහුම්කන් දුන්නොත්.

මිනිසා : කවුරුවත්ම නැහැ අපට ඇහුම්කන් දෙන්න. මම කියන්නද මේබල්, මේක අපේ සංවිධානයේ සිහිනයක්. අපි පාලනය පවරා ගත්තම ස්ටෙෆාන් කටයුතු කරන්නෙ අපිට ඕනෑ විදිහට. එතකොට අපිට නිදහසේ කටයුතු කරන්න පුළුවන්. ඔබටම අයිති, ඔබේම රටක් තිබුණොත් මොනවද කරන්න බැරි.

කාන්තාව : අපි මේ රට මොන්ටිකාර්ලෝවලට වඩා ලොකු කරමු.

මිනිසා : මෙහෙ තියෙන බැංකුවල අයිතිවාසිකම මිනිස්සුන්ට පවරනවා. එතකොට රජයට පුළුවන්කමක් නැහැ ඒ මුදල් හොයාගන්න. ඒක තමයි අපේ පටන් ගැන්ම. අපි චූදිතයකු වරදක් කළ විට ඒ රටට බාරදෙන නීතිය අහෝසි කරනවා. ඒකේ තේරුම තමයි මෙහේ සිටින රැකවරණය ලබන්නන් අපරාධවලට අත් අඩංගුවට ගන්න බැහැ. ඕනෑම කෙනෙකුට, ඕනෑම දෙයක්, ඕනෑම තැනකදි කරන්න මෙහේ ආරක්ෂාව තියෙනවා. හැබැයි අපේ මුදල ගෙවන්න ඕනෑ.

කාන්තාව : කතාව හරි. ඒත් ස්ටෙෆාන් ආදිපාදතුමා අපේ සැලැස්මට අනුව වැඩ කළේ නැත්තම්?

මිනිසා : ඔහු කරාවි. ඔහුට අවශ්‍ය බලය නම් අපිට ඔහුගෙන් බඩු ලබාගන්න පුළුවන්. ඕහ්...! මම කියන්නද, වෙරෝනාව කියන්නෙ බොහොම රසවත් පෙයාර්ස් ගෙඩියක්. ඔක්කෝමලා ඒක කඩාගන්න හදනවා.

කාන්තාව : ෂ්... ෂ්... අන්න එයාලා එනවා.

හඬ පටිය නතර විය. ඔහු නැවතත් එය ක්‍රියාත්මක කළේය.

"දෙවියනේ....! බර්ට් යන්ග් හිතුවටත් වඩා තත්ත්වය භයානකයි. එයාලගෙ අදහස මේ ලස්සන රට අඹරවලා දාන්න." පීටර් ශෝකයෙන් කීවේය.

"අපි මේක බර්ට් යන්ග්ට කියන්න ඕනෑ." බොබ්, ජුපිටර් දෙස බැලීය.



"මමත් හිතනවා අපි එහෙම කරන්න ඕනෑ කියලා. මම කැමතියි එයාට මුළු හඬ පටය අහන්න සලස්වන්න. ඒත් ඒක දිග වැඩියි. සමහර විට කවුරු හරි ඒක ගැන අවධානය යොමු කළොත්. හොඳයි, අපි මෙහෙම කරමු. එයාට අපි මේකෙ සාරාංශය දෙමු."

ජුපිටර් කැමරාව ගෙන එයින් ඡායාරූපයක් ගන්නා ආකාරයක් පෙන්නුම් කරමින් බර්ට් යන්ග්ට කතා කළේය.

"පළමුවැනි වාර්තාව, ඔයාට මාව ඇහෙනවද?"

"හොඳට පැහැදිලිව ඇහෙනවා." බර්ට් යන්ග්ගේ හඬ පසුපසින් ඇසිණ.

"අලුත්ම තත්ත්වය?"

ජුපිටර් සිදුවූ සියල්ල කීවේය. ඔහු තමන්ට පුළුවන් අයුරින් එම කතාව කෙටි කළේය.

"හරිම නරක තත්ත්වයක්...!" බර්ට් යන්ග් සියල්ල හොඳින් ශ්‍රවණය කළේය.

"ඔයා විස්තර කරපු විදිහට ඒ මාක්ස් ශ්‍රෝගන්. නෙවාඩාවල ඉඳලා ආව සූදුකාරයෙක්. අරයා එයාගේ නෝනා. එයාලා විශාල අපරාධවලට හවුල්කාරයො. එයාලා කිව්ව ෆ්‍රෙඩී සහ රොබොටෝ කියන්නෙ මැක්ග්‍රෝ සහ රොබොටෝ රවුල් ටී දෙන්නම සූදු අන්තුවෝ. මේ ඔක්කෝම දේවල් අපෙන් ඈත තියෙන සිහිනයක්. ඔවුන් කොහොම හරි වෙරෝනාව අයිතිකර ගන්නවා."

"ඔයා ඩිජාරෝ කුමරුට අවවාද කළ යුතුයි. මේක ඔයාලට ලැබුණු හොඳ අවස්ථාවක්. බළකොටුව තව දුරටත් ආරක්ෂාකාරී නැහැ. අපි එයාට උදව් කරන්න උත්සාහ කරමු. නමුත් අපිට බලාගෙන ඉන්න වෙනවා එයා අපෙන් උදව් ඉල්ලන තුරු. ඔයා හැමදෙයක්ම හොඳින් කරලා තියෙනවා. අපි තවත් සිහින දකිව්. හැබැයි පරිස්සමින්."



Scanned with CamScanner

sinhalaebooks.com

# 6

## රිදී මකුළුවා සැඟවෙයි

මධ්‍යාහ්න කාලය රහස් පරීක්ෂකයන් තිදෙනා දර්ශන නරඹමින් ගත කළහ. ඔවුහු පැරණි මෙන්ම දර්ශනීය කඩ සාප්පු සහ කෞතුකාගාරය නැරඹූහ. ඔවුන් ගඟ දිගේ විනෝද සවාරියක් යන්නටද අමතක කළේ නැත.

රූඩි විටින් විට කලින් සඳහන් කළ දෙදෙනා ඔවුන් තවමත් ලුහුබඳින බව පැවසීය. කොහොම නමුත් ඔවුන් වෙරෝනාවේ රහස් සේවයේ සාමාජිකයන් වූ අතර ඔවුහු සැබවින්ම ස්ටෙෆාන් ආදිපාදවරයාගේ මිනිස්සු වූහ.

"මට හිතෙන්නේ එයාලට ඔයාලව හොඳින් බලාගන්න ඕනෑ ඇති. අනික එයාලා ඔයාලට කැමතියි වගේ. ඒත් මම දැනගන්න කැමතියි ඒ ඇයි කියලා." රූඩිට ද ඔවුන් ගැන කුතුහලයක් ඇතිවී තිබුණි.

ළමුන්ගේ බලාපොරොත්තුව වූයේද එයයි. ඔවුන් මේ තරම් සැලකිල්ලක් ළමුන් කෙරෙහි දක්වන්නේ ඇයිද යන්න ඔවුනට ද ප්‍රශ්නයකි. ඔවුන් තවම කිසිවක් කර නොමැත. ඇත්තෙන්ම ඔවුනට තවම ඩීජාරෝ කුමරුට උදව් කිරීමට ද නොහැකි විය.

සංගීත කණ්ඩායම් පාරේ තැනින් තැන සංගීත භාණ්ඩ වාදනය කරමින් සිටියෝය.

"එයාලා ඓතිහාසික ගායකයෝ. පෝල් කුමරුගෙ කාලයේ ඉඳලා පැවත එන්නෝ. මමත් එයාලගෙන් එක්කෙනෙක්. ඒත් මගේ



තාත්තා ස්ටෙෆාන් ආදිපාදතුමා සේවයෙන් පහකරන තුරුම අගමැති විදිහටයි හිටියේ. අපි ඩීජාරෝ කුමරුට ගොඩාක් පක්ෂපාතියි. පෝල් කුමරුගෙ නඩු තීන්දුවක් අනුව අපි බදු ගෙවන්නෙ නැහැ. අපි රහස් සංවිධානයක් පවත්වාගෙන යනවා ස්ටෙෆාන්ට විරුද්ධව. අපි ඒක නම් කරලා තියෙන්නෙ වෘත්තීය ගායකයන්ගේ සංගමය කියලා. මිනිස්සු ස්ටෙෆාන් ආදිපාදවරයාට කැමති නැහැ."

එක් සංගීත කණ්ඩායමක් පසුකර යද්දී ඔහු රථයේ වේගය අඩු කළේය. සංගීත කණ්ඩායමේ එක් අයෙක් ඔහුට යාන්තම් හිස සලා ආචාර කළේය. ඔහු නැවතත් රථයේ වේගය වැඩි කළේය.

ඔවුහු තව දුරටත් දර්ශන නරඹන්නට වූහ. ඔවුනට ක්‍රමයෙන් පසුපස හඹා එන්නන් ගැන අමතක විය. ළමෝ රාත්‍රී ආහාරය පිටත වූ අවන්හලකින් ගත්තෝය. ගඟෙන් අල්ලා ගත් අලුත් මාළු එහි තිබීම විශේෂත්වයකි.

ඔවුන් ආපසු බළකොටුවට යනවිට තෙහෙට්ටුවට පත්වී සිටි නමුත් සිතට දැනුනේ සුවයකි. දීප්තිමත් රතු පාට නිල ඇඳුමකින් සැරසුණු තරබාරු මිටි මිනිසෙකු වූ රාජකීය පිළිගැනීමේ නිලධාරියා ඔවුනට ආචාර කර පිළිගත්තේය.

"සුබ සැන්දෑවක් තරුණ මහත්වරුනි, ඩීජාරෝ කුමරු කනගාටුව පළ කළා අද රාත්‍රියේදී ඔබලාව හමුවීමට නොහැකි වීම ගැන. නමුත් හෙට උදේ ඔහු ඔබලා සමග එකතු වේවි. මම ඔබලාව කාමරය වෙත රැගෙන යන්නම්. නැතිනම් එය ඔබලාට සොයා ගැනීමට අපහසු වේවි."

බොහෝ ශාලා, පඩි පේළි පසු කරමින් අවුල් සහගත මාර්ගයක ඔවුහු පසුපසින් ගමන් කරන්නට වූහ. ඔවුන් කාමරයට ඇතුළු වූ සැනින් ඔහු ආපසු ගියේය.

ඔවුහු කාමරයට ඇතුල් වූ විගසම ඕක් ලීයෙන් සාදන ලද ශක්තිමත් දොර වසා දැම්මෝය. ඔවුන්ගේ ඇඳට ඉහළින් බිත්තිය මුල්ලේ විශාල මකුළු දැලක් තිබෙනු බොබ් දුටුවේය. ලොකු රන්වන් පාට මිශ්‍ර කළු මකුළුවෙක් ඔවුන් එනවාත් සමගම ජනේලය අසල වූ පැල්මකට රිංගා ගත්තේය. වෙරෝනාවේ මකුළුවන් පූජනීය සත්ත්ව කොට්ඨාසයක් බැවින් ඌට කිසිදු හිරිහැරයක් නොකර ළං වී නිරීක්ෂණය කරන්නට බොබ් සිතුවේය.



Scanned with CamScanner

sinhalaebooks.com

"අලුතෙන් කිසිම දෙයක් සිද්ධ වුණේ නැතත් මට හිතෙනවා, බර්ට් යන්ග්ට කතා කරන්න. ඔහු සමහර විට පෙර සූදානමකට අවශ්‍ය උපදෙස් ලබා දේවි. පීටර්, ඔය දොරට යතුර දාන්න."

පීටර් දොර වසත්ම ජුපිටර් කතා කරන්නට විය.

"ඔයාට මාව ඇහෙනවද?"

"පැහැදිලිව ඇහෙනවා. අලුත් ආරංචි තියෙනවද?"

"විශේෂ දෙයක් නැහැ. අපි විවිධ තැන් නරඹන්න ගියා. මුළු දවස තිස්සෙම ස්ටෙෆාන්ගෙ රහස් සංවිධානය අපේ පස්සෙන් එනවා."

"ඩිජාරෝ කුමරු ඔයාලා ගැන කනගාටු වෙනවා ඇති. තවම ඩිජාරෝ එක්ක කතා කළේ නැද්ද? එයා කොහොමද තොරතුරු ගන්නෙ?"

"තවම අපට එයාව හම්බ වුණේ නැහැ. හෙට උදේ වනතුරු එයාව දකින්න හම්බ වෙන එකක් නැහැ."

"මට හිතෙනවා ඔවුන්ගේ අරමුණ ඔයාලගෙන් කුමාරයව ඈත් කර තියෙන එක කියලා. වැදගත්ම දේ තමයි හෙට උදේ එයාව හම්බ වෙලා මේ ගැන එයාට කියන එක. දැන් ඔය හඬ පටිය ගලවලා සාක්කුවේ දමා ගන්න. මම බලාපොරොත්තු වෙනවා හෙට ඒක තානාපති කාර්යාලයට ලැබෙයි කියලා. ඔයාලා රට නරඹන්න ආව සංචාරකයෝ විදිහට එන්න. හැම දෙයක්ම සුදුසු පරිදි කරන්න. තේරුණාද?"

"ඔව් සර්."

"අපි තවමත් අවබෝධ කර ගන්න උත්සාහ කරන්නේ ඩිජාරෝ කුමරුට කොහොමද උදව් කරන්නෙ කියලා. ස්ටෙෆාන් ආදිපාදවරයා රූපවාහිනි, ගුවන් විදුලිය, පත්තර ඒ හැම ජනමාධ්‍යයක්ම තදින්ම සීමා කරලා. ඒ නිසා අපට ජනතාවට ළං වෙන්න අමාරුයි. ඒත් හෙට ඔයා ඔයාගේ රාජකාරියෙන් අපට සහනයක් ලබාදෙනවනේ."

"ඔව් සර්." ජුපිටර් ඔහුගේ අදහසට එකඟ විය.

ජුපිටර් සම්ප්‍රේෂණය ක්‍රියා විරහිත කර කැමරාවේ පතුල ගැලෙව්වේය. එයින් පිටතට ඇදගත් හඬ පටිය පීටර් අත තැබිය.



"මේක ඔයා අරන් යන්න. මේක ඔයාගෙන් කාටවත් ගන්න දෙන්න එපා."

"හරි. ඒක මම කරන්නම්." පීටර් එය තම ඇතුළු සාක්කුවේ දමා ගත්තේය.

ජුපිටර්, බර්ට් යන්ග් සමඟ කතා කරන විට බොබ් රෙදි අල්මාරිය අවුස්සන්නට විය. ඔහු ලේන්සුවක් ගැනිමට එහි ලාච්චුව අවුස්සා බැලිය. ඔහු තිබූ තැනින් ලේන්සු සොයාගෙන එයින් එකක් ගැනිමට සැරසෙද්දීම එයින් සිහින් හඬක් මතු විය. ඔහු ඒ හඬ කොහෙන් දැයි විමසිලිමත් විය. බර ලෝහමය දෙයක් ඔහුගේ ලේන්සුව යට තිබුණි. ඔහු එය එළියට ගත්තේය. ඔහුගේ දෑස් විසල් විය. බොබ්ට ඉබේටම කෑ ගැසුනි.

"හේයි, ජුපිටර්...! පීටර්....! මේ බලන්න."

ඔවුන් පුදුමයෙන් ඔහු වෙත හැරුණි.

"මකුළුවෙක්... ඒකා බිමට දාන්න." පීටර් කෑ ගැසීය.

"ඌ අහිංසකයි. ඌ පෝල් කුමරුගෙ නමින් ඉන්න මකුළුවෙක්. බිමට දාන්න බොබ්." ජුපිටර් ද කිවේය.

"ඔයාලට තේරෙන්නෙ නැද්ද? මේ ඇත්ත මකුළුවෙක් නෙවෙයි. මේ අර මකුළුවා...!"

"අර මකුළුවා...? ඒ කිව්වේ...?" පීටර් ඇසීය.

"වෙරෝනාවේ රිදී මකුළුවා.... අතුරුදහන් වුණු මකුළුවා. ඔයාලා හිතුවෙ ඌ ඇත්තම එකෙක් කියලද? නැහැ, මේක ලෝහවලින් හදපු එකක්. අර අපි කෞතුකාගාරයේදී දැක්ක එක වගේ." බොබ් විස්තර කළේය.

ජුපිටර් එය අල්ලා බැලීය.

"ඔයා හරි. මේක තමයි නියම නිර්මාණය. ඔයාට කොහෙන්ද මේක හම්බ වුණේ?"

"මගෙ ලේන්සුව යට තිබිලා. කවුරු හරි ඒක මෙහෙ හංගලා. මේක උදේ මෙතන තිබුණේ නැහැ. මම ඒක හොඳටම දන්නවා."



Scanned with CamScanner

sinhalaebooks.com

ජුපිටර් නළල රැළි ගන්වමින් කල්පනා කරන්නට විය.

"වෙරෝනාවේ රිදී මකුළුවා ඇයි අපේ කාමරයේ හැංගුවෙ?"

"මෙකෙ කිසිම තේරුමක් නැහැ. කවුරු හරි මේ හොරකමට අපිව අල්ලන්න හදපු සැලැස්මක්."

"අපි දැන් මොකද කරන්නෙ ජුපිටර්?" පීටර් කුතුහලයෙන් ඇසීය.

"රිදී මකුළුවත් එක්ක අහුවුණොත් මරණය තමයි. මම හිතනවා...."

ජුපිටර් කියන්නට ගිය දේ කියන්නට මත්තෙන් පිටතින් බර අඩි ශබ්දයක් ඇසෙන්නට විය. ඒ සමගම යමෙකු හයියෙන් දොරට ගසන්නට විය.

"අපගේ රජුගේ නාමයෙන් දොර අරිනු. නීතියට අනුව දොර අරිනු." කෝපාවිෂ්ට හඬක් පිටතින් ඇසුණි.

ඊළඟ විස්මිත තත්පරයේදී ජුපිටර් සහ පීටර් දොරේ එල්ලි තදින් වසාගෙන සිටියෝය. බොබ් මහත් කලබලයට පත් විය. වෙරෝනාවේ රිදී මකුළුවා ඔහුගේ අතෙහි විය. ඔහු වික්ෂිප්තව බලා සිටියේ කුමක් කළ යුතු දැයි නොදැනය.



# 7

## පලා යාම

නැවතත් දොරට තදින් පහර වැදුණි.

"රජුගේ නාමයෙන් දොර අරිනු. නීතියට අනුව දොර අරිනු." නැවතත් රළු හඬින් අණ ලැබුණි.

පීටර් සහ ජුපිටර් දොරට තදින් හේත්තු වී සිටි නිසා දොර තදින් වැසී තිබුණි. බොබ් රිදී මකුළුවා අතෙහි තබාගෙන දෙගිඩියාවෙන් යුතුව බලා සිටියේය. එය වහාම සැඟවිය යුතුය. නමුත් එය සඟවන්නේ කොහේද?





Scanned with CamScanner

sinhalaebooks.com

ඔහු කාමරය වටේ එහාට මෙහාට දුවන්නට වූයේ එය සඟවන්නට තැනක් සොයමිනි. බිම් පලස යට සැඟවුවහොත්, නිදන මෙට්ටය යට සැඟවුවහොත්, ඒත් ඒ එකක්වත් සුදුසු තැන් නොවේ. එසේ නම් එය කොහේ සඟවන්නද?

දොරට තදින් පහර වැදෙන්නට විය. මුරකරුවෝ දොර කඩන්නට මෙන් පහර දෙන්නට වූහ. එසැණින්ම තරුණයෙක් ජනේලය මත පා තැබිය. පීටර් සහ ජුපිටර් මෙම හදිසි කඩා වැදීම නිසා මහත් අවුලකට පත් වූහ.

"මේ මම, රූඩි." ඔහු මිමිණුවේය.

"මේ මගේ නංගි එලීනා."

එලීනාද ඔහුගේ පසුපසින් ආවාය. ඇය පිරිමි ළමුන් අඳින කලිසමකින් සහ උඩු කබායකින් සැරසී සිටියාය.

"එන්න, ඔයාලට පැනලා යන්න සිද්ධ වෙනවා. එයාලා ඔයාලව අත් අඩංගුවට ගන්න යන්නෙ. ඔයාලා රජයට විරුද්ධව විශාල වරදක් කරලා තියෙනවා." ඇය පැහැදිලි කළාය.

ඔවුහු නැවතත් දොරට තලන්නට වූහ. යමෙක් පොරවක් භාවිත කළ අතර එය ඕක් ලීයෙන් සෑදූ දොරක් නිසා ශක්තිමත් බවින් ඉහළය. එමෙන්ම එයට අසව් තුනක් අල්ලා තිබුණි. එම නිසාම එය අරින්නට මිනිත්තු කිහිපයක් ගතවිය හැකිය. එම සිදුවීම පෙළ චිත්‍රපටියක දර්ශන පෙළක් මෙනි. ළමෝ නිහඬව එයට ප්‍රතිචාර දක්වන්නට වූහ. නමුත් ඔවුනට එක් දෙයක් අවබෝධ වී තිබුණි. ඒ කෙසේ හෝ මෙතනින් පැන යාගත යුතු බවයි.

"එන්න පීටර්, බොබ්. රිදී මකුළුවත් අරගෙන අපි යමු." ජුපිටර් මිමිණුවේය.

බොබ් කුතුහලයටත්, කලබලයටත් පත් විය. ඔහු වහාම දිව ගොස් තම කණ්ඩායමට එකතු විය. සඳලුතලය දිගේ යන ගමනේදී එලීනා පෙරමුණ ගත්තාය. අඳුරේ සියල්ලෝම එකට එකතු වූහ. නගරයේ විදුලි පහන් ආලෝකය පහළින් දිස් විය.

"මේ ගරාදි වැට ගොඩනැගිල්ල වටේම තියෙනවා. අපිට යන්න ඇති තරම් පළල තියෙනවා. පරිස්සමෙන් එන්න. මම ඉස්සරලා යන්නම්." එලීනා කීවාය.



ඇය ගරාදි වැටට උඩින් පැන සඳලුතලයේ වැටිය දිගේ ඇවිද යන්නට වූවාය. ජුපිටර් කලබලයට පත් විය.

"මගේ කැමරාව, අපරාදේ... ඒක මට අමතක වුණා."

"ඒකට දැන් වෙලාවක් නැහැ. කරන්න දෙයක් නැහැ. දොර නිසා අපිට මිනිත්තු කිපයක් ලැබෙයි. එතන තුන් දෙනෙක්වත් ඇති. අපිට තත්පරයක්වත් අපතේ යවන්න බැහැ. එහෙම වුණොත් දන්නවනේ වෙන දේ." රූඩි කීවේ අණ කරන ස්වරූපයෙනි.

කැමරා රේඩියෝව අත හරින්නට ජුපිටර් කැමති වූයේ නැත. නමුත් වෙන කළයුතු දෙයක් ද නැත. එබැවින් ජුපිටර් පීටර් අනුගමනය කරන්නට විය. එලීනා පසුපසින් සියල්ලෝම බළලුන් මෙන් ගමන් කරන්නට වූහ.

ඔවුනට නැතිවුණු දේ ගැන ශෝක වන්නට කාලයක් තිබුණේ නැත. තවමත් ඔවුන්ගේ කාමරයේ දොරට තලන හඬ ඇසෙයි. ඔවුහු ගොඩනැගිල්ලේ මුල්ලකට පැමිණියෝය. රාත්‍රි සුළඟ තදින් හමන්නට විය. බොබ්ගේ අත් වාරුව ගිලිහී ගියේය. රූඩි වහා බොබ්ගේ උරහිසෙන් අල්ලා ගත්තේය. රූඩි සමබරතාව රැක ගනිමින් අනෙක් අය පිටුපසින් ගමන් කරන්නට විය. අඳුරේ වුවද පහළින් ඩෙන්සෝ ගඟ ශීඝ්‍රයෙන් ගලා බසිනු පෙනේ.

පරෙවි ජෝඩුවක් ඔවුන් යන මඟ අවුරමින් හිස ඉහළින් පියඹා ගියේය. එකිනෙකා පසුපස ඇදෙමින් ඔවුහු වෙනත් සඳලුතලයකට ගමන් කළෝය. මොහොතකට පස්දෙනාම එකට එකතු වූහ.

"දැන් අපිට එල්ලිලා යන්න සිද්ධ වෙනවා." එලීනා මිමිණුවාය.

"මම හිතනවා මෙතන ඉන්න ඔක්කෝමලා හොඳට කඹේ එල්ලිලා යන්න දන්නවා කියලා. මොකද මෙතනින් යන්න තියෙන එකම මාර්ගය එච්චරයි. මෙන්න ලණුව, ඒකේ ගැටයක් තියෙනවා. මේකෙ සඳලුතලයේ ඉඳලා ඉහළට නගින්නයි තියෙන්නෙ. අපි මේ විදිහට ගියාම එයාලා මෝඩ වේවි."

කඹය ඉහළ සිට පහළට එල්ලෙමින් තිබුණි. ඇය පළමුවෙන්ම තම කාර්යය අවසන් කළාය. පීටර් ලේසියෙන්ම ඇය අනුගමනය කළාය. ජුපිටර් හති අරිමින් වෙහෙස ගෙන ඉතාම හෙමින් ඉහළට නැගුණේය. ඊළඟට පැමිණියේ බොබ්ගේ වාරයයි. ඔහු වැනෙමින්



Scanned with CamScanner

sinhalaebooks.com

තිබෙන ලණුව අල්ලා ගත්තේය. රූඩි සැනෙකින් සඳලුතලයේ මුල්ලට ගොස් එබී බැලීය.

"එයාලා තවමත් දොරෙන් ඇතුළු වෙන්න හදනවා. එයාලට අපිව පෙනෙන්නෙ නැහැ."

"මොකක්ද?" බොබ් රූඩිගේ කතාවට ඇහුම්කන් දුන්නේය.

ඔහු ඒ සඳහා ඔළුව හැරවීය. ඒ සමගම ඔහු අල්ලාගෙන සිටි ලණුවේ ගැටය අත හැරුණේය. අත් ලිස්සා යාමත් සමගම අඳුරේම ඔහු ආපස්සට ඇද වැටුණි. බොබ් ආපසු සඳලුතලයට ඇද වැටුණු අතර ඔහුගේ ඔළුව එහි තදින් වැදුණි. බොබ්ට කහ පාට, රතු පාට එළි විහිදී යනු පෙනෙන්නට විය.

"බොබ්, මොකද ඔයාට වුණේ? ඔයාට තුවාලද? ඔයාට මාව ඇහෙනවද?" රූඩි ඔහු වෙත නැඹුරු වී විමසන්නට විය.

බොබ් ඇසිපිය සලමින් ඇස් හැරියේය. වර්ණ එළි ඇස් ඉදිරියේ සැලෙන්නට විය. ටික වේලාවකින් ඔහුට තමා වෙත නැමී සිටින රූඩිගේ මුහුණ දැක ගැනීමට හැකි විය. ඔහු සඳලුතලය මත වැතිර සිටි අතර ඔළුව ගෙඩි ගැසී තිබුණි.

"බොබ්, ඔයාට අමාරුවක් නැද්ද?" රූඩි බියෙන් විමසීය.

"මගේ ඔළුව රිදෙනවා. ඒත් මම හිතනවා මට අමාරුවක් නැහැ කියලා." ඔහු හිඳගෙන හෙමින් වටේම පිරික්සීය.

ඔහු සිටියේ සඳලුතලයේය. බළකොටුවේ කුලුනු උඩට එසවී තිබුණු අතර පහළින් ගඟ ගලා ගියේය. ඈතින් ඩෙන්සෝ නගරයේ විදුලි ආලෝකයද දිස් විය.

"අපි මොකද මෙහෙ කරන්නෙ?" ඔහු රූඩිගෙන් විමසීය.

"මම දැක්කා ඔයා ජනේලයෙන් ඇවිල්ලා අපට එළියට එන්න කියලා කෑ ගැහුවා. ඉන්පස්සෙ අපි සඳලුතලයට ආවා. මගෙ ඔළුවෙ ලොකු ගෙඩියක් තියෙනවා. මොකක්ද මට වුණේ...?"

"පෝල් කුමරු අපිව ආරක්ෂා කරාවි." ඔහු මිමිණුවේය.

"ඔයා වැටුණා. දැන් ඔයාගේ මොළේ අවුල් වෙලා. අපිට වෙලාවක් නැහැ කතා කර කර ඉන්න. ඔයාට නගින්න පුළුවන්ද?



මෙන්න කඹය, මේකෙ එල්ලිලා යන්න පුළුවන්ද?"

රූඩි කඹය ගෙන බොබ්ගේ අතෙහි තැබීය. ඔහුගේ අතට එය දැනුණු නමුත් මීට පෙර එය දැක්ක බව මතකයේ නොවීය. ඔහු දුර්වලව වැනෙමින් සිටි අතර කම්පනයටද පත්ව සිටියේය.

"මම දන්නෙ නැහැ. මම උත්සාහ කරන්නම්."

"ඒක ඒතරම් හොඳ නැහැ." රූඩි හදිසියේම ඔහුගේ තත්ත්වය තේරුම් ගෙන කළ යුතු දේ සිතින් නිශ්චය කළේය.

"අපි ඔයාව ඇදලා ගන්නම්. හිටගෙන ඉන්න. ඔයාගේ උරහිස්වලට යටින් පපුව හරහා තොණ්ඩුවක් දමන්නම්."

බොබ්ගේ පපුව හරහා ලණුවේ නිදහස් කෙළවර ගැට ගසනු ලැබිණ.

"දැන් මම නගින්නම්. ඊට පස්සෙ ඔයාව ඇදලා ගන්නම්. මට ඔයාට උදව් කරන්න පුළුවන්. අපි ඔයාව වට්ටන්නෙ නැහැ. බය නැතුව ඉන්න." රූඩි ඔහුව සන්සුන් කළේය.

"මම එනවා. වෙන දෙයක් වුණාවේ."

බොබ් හිඳගෙන තම හිස අතගා බැලීය. හිසෙහි ලොකු ගෙඩියක් හසු වුණි. ඔහුට කුමක් වූවා දැයි තේරුම් ගැනීමට අපහසු විය. ඔහු ද රූඩි අනුගමනය කළ යුතුය. නමුත් ඔහුට කිසිවක් මතක් කරගත නොහැකි විය. ඔහුගේ අවසාන මතකය රැඳී තිබුණේ රූඩි විසින් ඔවුන් ජනේලයෙන් පිටතට ගැනීමත් කවුරුන් හෝ ඔවුන්ගේ කාමරයේ දොර අරින්නට ගත් උත්සාහයත්ය.

රූඩි අමාරුවෙන් ඉහළට බඩ ගා නැග ගත්තේය. ජනේලයෙන් ඇතුළුවත්ම අනෙක් අය නොඉවසිලිමත්ව බලා සිටියෝය.

"බොබ්ගේ ඔළුව අවුල් වෙලා. අපිට එයාව ඇදලා ගන්න වෙනවා. අපි ඔක්කෝම එකතු වෙලා ඒක කරමු. අපිට පුළුවන් ඒක කරන්න. එන්න, ඉහළට ඇදලා ගමු."

පළමුවෙන්ම ඔවුහු ලණුව ලිහිල් කළෝය. පසුව සියලුදෙනාම එක්ව ලණුව අදින්නට වූහ. බොබ් එතරම් බර නැති නිසා පහසුවෙන් ඇද ගැනීමට හැකි විය. ඔහු ජනේලය ළඟට ඇද ගැනීමෙන් පසු ජනේලය අල්ලා ගත්තේය.



Scanned with CamScanner

sinhalaebooks.com

"මට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒත් මගේ ඔළුව රිදෙනවා. මට නාමත් මතක නැහැ, සඳලුතලයෙදි මොකද වුණේ කියලා."

"ඒක ප්‍රශ්නයක් නැහැ. ටික වෙලාවකට පස්සෙ ඔක හරියාවි." එලීනා කිවාය.

ඔවුන් දැන් සිටින්නේ බළකොටුවේ තිබෙන වෙනත් නිදන කාමරයකය. එහි එකදු ගෘහ භාණ්ඩයක් හෝ නොවූ අතර දූවිලි පිරී තිබුණි. රූඩි සහ එලීනා කිසිවෙකුටත් නොඇසෙන්නට ඇඟිලි තුඩුවලින් ඇවිදිමින් දොරේ සිදුර අස්සෙන් එබී බැලූහ.

"දැන් අපිට හැංගෙන්න තැනක් ඕනෑ. එලීනා, ඔයා මොකද ඒ ගැන හිතන්නෙ? අපි පොළොව යට තියෙන කාමරවලට යමුද?"

"ඔයා කියන්නෙ පොළොව යට තියෙන සිර කුටිද? නැහැ, මම එහෙම හිතන්නෙ නැහැ. අපි මෙහෙම කරමු. මේ කඹය වෙන කොහේ හරි තැනකින් දමමු. එතකොට එයාලා හිතයි ජුපිටර්ලා ඒ පාරෙන් යන්න උත්සාහ කළා කියලා, ඒ පැත්ත බලාවි."

ඇය ජනෙල් පඩියේ වාඩි වී පහළ බැලුවාය. මිදුලේ එහේ මෙහේ ඇදෙන මිනිසුන් පුංචිවට පෙනුණි.

"ඇනටමත් මුරකාරයෝ මිදුලේ ඉන්නවා. මගේ නම් අදහස තවත් උඩට යන්න. ඒ කිව්වෙ වහලෙට. හෙට රෑ වෙනතුරු එහෙ ඉමු. අපි උත්සාහ කරමු පොළොව යට තියෙන සිර කුටිවලට යන්න. ඉන්පස්සෙ කුණු කානුව දිගේ නගරෙට යමු. එතකොට අපිට පුළුවන් ඇමෙරිකන් තානාපති කාර්යාලයට ගිහිල්ලා රැකවරණය ලබා ගන්න." එලීනා පැහැදිලි කළාය.

"ඔව්, ඒක හොඳ අදහසක්." රූඩි අනෙක් තිදෙනා වෙත හැරුණි.

"බළකොටුවේ මේ පැත්ත ප්‍රයෝජනයට ගන්නෙ නැහැ. ඒ නිසා මේ පැත්ත බලන්නෙ නැහැ. ඒ හින්දම අපිට පුළුවන් පහළට බහින්න. ජුපිටර් මට දෙන්න ඔයාගෙ ලේන්සුව."

රූඩි ජුපිටර්ගේ උඩ කබායේ සාක්කුවේ තිබූ නවන ලද සුදු පාට ලේන්සුව ගත්තේය. එහි 'ජේ. ජේ.' යනුවෙන් ගෙත්තම් කර තිබුණේය.

"දැන් අපි මේක බොරු සාක්ෂියක් විදිහට බිම අලා තියමුඃ හරි,



දැන් අපි යමු. එලීනා, ඔයා හොඳට පිටිපස්ස බලන්න ඕනෑ." රූඩි තම ඉණ වටේ ලණුව ඔතා ගත්තේය.

ඔවුහු අඳුර අතරින් ශාලාව දිගේ ගමන් කළෝය. ඔවුහු විදුලි පන්දමේ ආධාරයෙන් එහි දොර සොයා ගත්තෝය. පෙනෙන ආකාරයට නම් පහත මාලයේ කිසිවෙකු පෙනෙන්නට නැත. ඔවුහු අවතාර මෙන් පටු මාවතේ ගල් පඩි මතින් ඉදිරියට ගියෝය. එහි වහලය ගලින් නිම කළ අතර එහි තැනින් තැන සිදුරු පැදී ඇත. ඉහළ අහසේ තරු බැබළෙනු ඒ තුළින් දිස්වෙයි.

"මේ මොනවද දන්නවද? සමහර විට යුද්ධ කාලෙදි ඊතල විදපු ඒවා. නැත්තම් මොනවා හරි තෙල් වර්ගයක් උණු කරලා අලා වෙන්න ඕනෑ." රූඩි අනුමාන කළේය.

"අර කොණේ තියෙන්නෙ මුර කුටියක්."

ගලෙන් නිම කළ මුර කුටියක් ඔවුනට දක්නට ලැබුණි. ඔවුන් ඇතුළු වූ කාමරයේ ලී දොර හැර ගන්නට රූඩි සමත් විය. එහි ලී බංකු හතරක් විය. ඒවා බොහෝ පළලින් යුක්තය. කාමරය දූවිල්ලෙන් පිරී තිබූ අතර පටු ජනේලයට වීදුරු යොදා තිබුණේ නැත.

"මේක ඉස්සර මුර භටයන්ගේ කුටියක්. දැන් සාමය තියෙන නිසා මේවා පාවිච්චියට ගන්නෙ නැහැ. මේක ඔයාලට ආරක්ෂා සහිතයි, හෙට රෑ වෙනතුරු."

"මම ගොඩක් සතුටු වෙනවා කාලගුණය උණුසුම්ව තියෙන එක ගැන." ජුපිටර් කිව්වේ ලී බංකුවේ හිඳ ගනිමිනි.

"ඔයාලව වෙරෝනාවේ රිදී මකුළුවා සොරකම් කිරීමේ වරදට අත් අඩංගුවට ගන්නයි හදන්නෙ. කොහොම හරි ඔයාලා ඩිජාරෝ කුමරුගෙ කිරුළ ලබා ගන්න බලපෑම් කරලා තියෙනවා. අපි හොඳටම දන්නවා ඒක විකාර කතාවක් බව. මොකද, ඒක ලබා ගන්න ඔයාලට වුවමනාව තිබුණත් ඒක ඔයාලට හොරකම් කරන්න බැහැ." එලීනා කිවාය.

"නැහැ, අපි ඒක හොරකම කළේ නම් නැහැ. ඒත් ඒක අපි ළඟ තියෙනවා. බොබ්, ඒක මෙයාලට පෙන්නන්න."

බොබ් තම කමිස සාක්කුවට අත යැවීය. ඔහු එය සොයන්නට



Scanned with CamScanner

sinhalaebooks.com

වෙනත් සාක්කුවකට ද අත දමා බැලීය. බොබ් තම සියලුම සාක්කු පරීක්ෂා කර බැලීය. ඔහු පුදුමයට පත් විය.

"මට සමාවෙන්න ජුපිටර්, ඒක මගෙ ළඟ නැහැ. අර වෙලාවෙ ඒක නැති වෙන්න ඇති." බොබ් කලබලයට පත්ව සිටියේය.



8

# බොබ්ගේ මතකය නැති වෙයි

"ඔයා ළඟ රිදී මකුළුවා තිබ්බලත් ඔයා ඒක නැති කර ගත්තා." රූඩි කිවේ දොම්නස් සිතිනි.

"ඒක හරිම භයානකයි. කොහොමද එහෙම දෙයක් වුණේ?" එලීනා ද ශෝක වූවාය.

ඩිජාරෝ කුමරු රිදී මකුළුවා අතුරුදහන් වූ බවත්, එය සොයා ගැනීමට උදව් කරන ලෙස ඉල්ලා සිටි බවත් ජුපිටර් කිවේය. ඒ වගේම ඩිජාරෝ කුමරු ඔවුන් කෞතුකාගාරයට කැඳවාගෙන ගොස් එහි අනුරුවත් පෙන්වූ බව ද එය කරන්නට ඇත්තේ ස්ටෙෆාන් ආදිපාදවරයා බව ඔහු සැක කරන බව ද පැවසූ සැටිත්, එසේ කිරීමට හේතුව ඔහුගේ රාජාභිෂේකය වැළැක්වීමට බවත්, ඔහු කියා තිබුණි. ඉන්පසුව බොබ් පැහැදිලි කළේ තමන්ගේ ලේන්සු අතර රිදී මකුළුවා තිබී හමුවූ ආකාරයයි.

"මට මේ කුමන්ත්‍රණය තේරුම් ගන්න පුළුවන්." රූඩි මිමිණුවේය.

"ස්ටෙෆාන් ආදිපාදතුමා රිදී මකුළුවා ඔයාලගෙ කාමරේ හැංගුවා. රිදී මකුළුවා ඔයාලා ළඟ තියෙද්දි ඔයාලව අත් අඩංගුවට ගන්නවා. ස්ටෙෆාන් පැහැදිලි කරනවා ඔයාලා ඒක හොරකම් කළා කියලා. ඒක ඩිජාරෝ කුමරුගේ අපරීක්ෂාකාරීකමේ ප්‍රතිඵලයක් කියලයි කියන්නේ. ඒකෙන් ඩිජාරෝ කුමරු අපකීර්තියට පත් වෙනවා. ඔයාලව රටින් පිටුවහල් කරනවා විතරක් නෙමෙයි, ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක තියෙන සියලුම සම්බන්ධතා බිඳ දමනවා. ස්ටෙෆාන් ආදිපාදවරයා දිගටම රාජ්‍යය පාලනය කරනවා. ඩිජාරෝ කුමරු

sinhalaebooks.com

අපකීර්තියට පත් වෙනවා. වෙරෝනාවේ පාලනය ලබා ගන්නේ කොහොමද කියලා එයාටම හිතන්න වේවි. දැන් රිදී මකුළුවා නැති වෙලා. ඒත් ඔහුගේ කටයුත්ත දිගටම කරගෙන යන්න පුළුවන්. ඔයාලා ආරක්ෂාකාරීව ඇමෙරිකන් තානාපති කාර්යාලයට ගියත් ඔහු ඔයාලට චෝදනා කරාවි රිදී මකුළුවා හොරකම් කළා කියලා."

"මට තාමත් තේරුම් ගන්න බැහැ, ඇයි මේ රිදී මකුළුවා මෙච්චර වටින්නෙ කියලා. හරි, මම ඒකෙන් අදහස් කළේ අපි හිතමු, ඒක ගින්නෙන් හරි, වෙනත් විදියකින් හරි විනාශ වුණොත්, එතකොට මොකද කරන්නෙ?" පීටර් විමතියකින් යුතුව ප්‍රශ්න කළේය.

"එහෙම වුණොත් මුළු රටම ඒ ගැන ශෝක වෙයි. නමුත් ඩිජාරෝ කුමරුට චෝදනා කරන්නෙ නැහැ. ඇත්තටම ඒක විස්තර කරන්න අමාරුයි. ඒක වටිනා දෙයක් නෙවෙයි. ඒක ලාංඡනයක් විතරයි. ඒකෙන් හඳුන්වන්නේ අපේ වස්තුව, අපේ නිදහස, අපේ ස්වතන්ත්‍රභාවය, අපේ වාසනාව." එලීනා විස්තර කළාය.

"සමහර විට අපි අද්භූත දේවල් විශ්වාස කරන්නෝ. නමුත්, පුරාවෘත්තවලට අනුව පෝල් කුමරු රට පාලනය කරද්දි මකුළුවෙක් එයාගෙ ජීවිතය බේරුවා. මකුළුවා තමයි අපේ රටට වාසනාව, නිදහස ගෙනැල්ලා දුන්නෙ. ඩිජාරෝ කුමරු කිසිදෙයක් නොකිව්වත් වෙරෝනාවේ මිනිස්සු එයාව විශ්වාස කරනවා. රිදී මකුළුවා නැති වුණ එක ජාතික ව්‍යසනයක්. සම්පූර්ණයෙන්ම නොවුණත් ඩිජාරෝ කුමරු වග කියන්න ඕනෑ රිදී මකුළුවා නැති වුණු එක ගැන. එයා නොවටිනා පුද්ගලයෙක් කියලා එයාට දැනේවි. එතකොට කවුද එයාට ආදරය කරන්නෙ?"

"අපිට ආපහු රිදී මකුළුවා හොයාගන්න බැරි වුණොත් ස්ටෙෆාන් ආදිපාදවරයා දිනාවි."

"දෙවියනේ..., ඒක හරිම නරකයි. මට උදව් කරන්න ඒක හොයාගන්න. ඒක මගේ අතින් වැටෙන්න ඇති." බොබ් දොම්නස් සිතින් යුතුව කීවේය.

මේ අවස්ථාවේදී පීටර් සහ ජුපිටර් බොබ්ගේ සාක්කු පරීක්ෂා කළෝය. ඔවුන් ඔහුගේ කලිසමේ යට වාටිය පවා පිරික්සා බැලූහ. නමුත් ඔවුන්ගේ බලාපොරොත්තු බිඳ වැටුණි.



"බොබ් මතක් කරන්න." ජුපිටර් ඔහු උනන්දු කළේය.

"ඒක තිබුණේ ඔයාගේ අතේ. ඊට පස්සේ ඔයාට මොකද වුණේ? ඔයා ඒකට මොකද කළේ?" බොබ් නළල රැළි ගන්වමින් කල්පනා කරන්නට විය.

"මම දන්නෙ නැහැ. මට අවසානයට මතක තියෙන්නෙ කවුරු හරි හයියෙන් දොරට ගැහුව එකයි, රූඩි ජනේලයෙන් ආව එකයි විතරයි. අනිත් කිසිම දෙයක් මතක නැහැ, මම වැටුණට පස්සෙ..."

"අර්ධව ස්මරණ ශක්තිය නැති වීම." ජුපිටර් තම යටි තොල සපා ගත්තේය.

"යම් කෙනෙකුට ඔළුවට පහරක් වැදුණාම, මොනවද වුණේ කියලා අමතක වෙනවා. සමහර වෙලාවට පසුගිය දවස් කීපයේම වෙන්නත් පුළුවන්. සතියක් විතර වෙන්නත් පුළුවන්. පස්සෙ ක්‍රම ක්‍රමයෙන් ඒක යථා තත්වයට පත් වෙනවා. මට පෙනෙන විදිහට බොබ්ට වෙලා තියෙන්නෙ එයාගෙ ඔළුව සඳලුතලයේ වැදුනාම මිනිත්තු ගණනක මතකය නැතිවෙලා තියෙනවා."

"මට හිතාගන්න පුළුවන්, දැන් මට මොකද වුණේ කියලා." බොබ් සුසුමක් හෙළීය.

"මට මතකයි, මම රිදී මකුළුවා හංගන්න හොඳ තැනක් හොය හොයා කාමරය වටේම දිව්වා. මම ඇත්තටම බය වුණා. ඒත් මට මතකයි ඒක හංගන්න මට හොඳ තැනක් තිබුණේ නැහැ. මෙට්ටය යට හංගන්න බැලුවා, බිම් පලස යට බැලුවා, ඇඳුම් අල්මාරියේ පිට පැත්තේ හංගන්න බැලුවා. ඒත් මට හිතුණා, ඒ හැමතැනම ඉක්මනට හොයාගන්න පුළුවන් වේවි කියලා."

"ඒක සාමාන්‍යයෙන් සිද්ධවෙන දෙයක්." රූඩි ඔහු සැනසුවේය.

"මම ඔයාව කාමරයේදී දකිද්දි ඒක ඔයාගෙ සාක්කුවෙ හිරවෙලා තියෙන්න ඇති. ලණුව අත ඇරිලා සඳලුතලයේ ඔයා වැටුණු වෙලාවෙ ඒකත් වැටෙන්න ඇති."

"ඔව්. මම සඳලුතලයට ඉක්මනින් එද්දිත් ඒක මගේ අතේ තිබුණා වගේ මතකයි. සඳලුතලයේ ගරාදි වැට දිගේ එද්දි ඒක මගේ අතින් වැටෙන්න ඇති. ඒක සඳලුතලයේ අද්දර ඇති. නැත්තම් මිදුලට වැටිලා ඇති." බොබ් කීවේ කනගාටුවෙනි.



Scanned with CamScanner

"ඒක මිදුලට වැටුණා නම් අපට හම්බ වේවි. එහෙම වුණොත් කොච්චර දෙයක්ද... ඒක හම්බ වුණේ නැත්නම්..." රූඩි, එලීනා දෙස බැලීය.

"ස්ටෙෆාන් ආදිපාදතුමාගේ මිනිස්සු සම්පූර්ණයෙන්ම ඔයාලගෙ කාමරේ පරීක්ෂා කරන්නෙ නැති වෙයි." ඇය හිස වැනුවාය.

"එයාලා හිතාවි පිඳී මකුළුවා තාමත් ඔයාලා ළඟ තියෙනවා කියලා. ඒ නිසා එයාලා මිදුලෙ ඒක තියෙනවද කියලා බලන්නෙ නැති වෙයි. හෙට ඌ අපි ආපහු එනවා. ඒක ගැනත් අපි බලන්නම්." රූඩි සහ එලීනා ඔවුන්ගෙන් සමුගත්හ.




# 8

## පලා යන්නට සැලැස්මක්

රහස් පරීක්ෂකයෝ තිදෙන ඒ දිගු රාත්‍රිය මාලිගාවේ වහලය යටම වූ මුර කුටියක ගෙවා දැමූහ. කිසිවෙකුත් බළකොටුවේ එම කොටස පරීක්ෂා කර බැලුවේ නැත.

එලීනා සහ රූඩි පිටව ගිය පසු ළමයි තිදෙනා ලී බංකුවල දිග ඇදී නිදන්නට සූදානම් වූහ. සුවපහසු ඇඳන් නොමැති වුවද සවස් කාලයේ සිදු වූ අනපේක්ෂිත සිදුවීම් ද අමතක කර ඔවුහු සුව නින්දකට වැටුණහ.



sinhalaebooks.com

පසුදා උදයේ හිරු නැගෙන්ම පීටර් අවදි වී ඇඟමැලි කඩා නැගී සිටියේය. ජුපිටර් ඒ වන විටත් අවදිව උදෑසන ව්‍යායාම කරමින් සිටි අතර බොබ් තවමත් සුව නින්දක පසුවිය.

"අද නම් හොඳ දවසක්..."

ගලෙන් නිම කරන ලද මුර කුටියෙහි කුඩා ජනෙල් සිදුරෙන් එබී බලමින් පීටර් කිවේය.

"මට පෙනෙන විදිහට අපට අද දවසම කෑම නැහැ. මේ හැම එකකටම වඩා කෑම වටිනවා."

"මට හිතෙනවා මේ හැමදේකටම රූඩි ළඟ සැලැස්මක් තියෙනවා කියලා." ජුපිටර් කීය.

"මට බොබ්ගෙන් දැනගන්න ඕනෑ, එයා රිදී මකුළුවට මොනවද කළේ කියලා. එයා නැගිට්ටට පස්සෙ කියයිනෙ."

ඒ සමගම බොබ් ඇසිපිය සලමින් නැගිට හිඳ ගත්තේය.

"අපි කොහෙද මේ ඉන්නෙ?" ඔහු එසේ අසමින් තම හිස පිටුපස අතගා බැලීය.

"ආහ්...! මගෙ ඔළුව රිදෙනවා. දැන් මට මතකයි."

"ඔයාට දැන් මතකයි...? ඔයා රිදී මකුළුවට මොනවද කළේ?" පීටර් සැනෙකින් ප්‍රශ්න කළේය.

"මට මතකයි, අපි කොහෙද ඉන්නෙ කියලා. ඒ වගේම මට මතකයි මගේ ඔළුව වැදුණා. මට මතකයි ඔයාලා කියපු දේවල් ඔක්කෝම."

"ඔයා ඒ ගැන කනාගාටු වෙන්න එපා බොබ්. අපි බලාගෙන ඉමු ඔයාගෙ මතකය ආපහු එනතුරු. සමහර විට ඒවි. නැත්තම් නැති වේවි." ජුපිටර් ඔහු අස්වසාලීය.

"ඔහ්...! ජුපිටර්, කවුද එක්කෙනෙක් එහා පැත්තෙ ඉන්නවා. එයා මේ පැත්ත බලාගෙන ඉන්නෙ." පීටර් නැවතත් ජනේලයෙන් පිටත බැලීය.



තිදෙනාම ජනේලය ළඟට රොක් වූහ. හිස පහතට නවා ගත් මිනිසෙක් ඇඟට වඩා විශාල අළු පැහැති ඇඳුමකින් සැරසී සිටි අතර එයට උඩින් පිළිවැස්මක් පැලඳ සිටියේය. ඔහු අත ඉදලක් සහ කුණු බාල්දියක් ද තිබූ අතර ඔහු හොරෙන් වටපිට බැලීය.

ඔහු පඩි පෙළ දිගේ එමින් සිටියේය. ඔහු අත වූ භාණ්ඩ පසෙක තබා මුර කුටියේ දොර වෙත ආවේය.

"එයාට එන්න ඉඩදෙන්න පීටර්. එයා මුරකාරයෙක් නෙවෙයි. එයා පැහැදිලිවම අපි මෙහෙ ඉන්න බව දන්න කෙනෙක්." පීටර් වහා දොර තද කරගෙන සිටි බැවින් ජුපිටර් කීය.

පීටර් දොර හරින්ම මිනිසා ඇතුළු වී තදින් සැනසුම් සුසුමක් පිට කළේය.

"ටිකක් ඉන්න, මාව විශ්වාස කරන්න. මම ඔයාලගෙ පස්සෙන් ආවා නෙමෙයි." ඔහු එම වචන බර කර කිවේය.

ඔවුහු නැවතත් ජනේලයෙන් එබී බැලූහ. වෙනත් කිසිවෙකුත් පෙනෙන්නට නොවීය.

"හොඳයි, මම කියන්නම්. මම මාලිගා පිරිසිදු කරන සේවකයෙක්. මගේ ළඟ පණිවිඩයක් තියෙනවා රූඩිගෙන්. එයා කිව්වා බොබ් කියලා එක්කෙනෙකුට මතකය ආවද කියලා අහන්න."

"එයාට කියන්න නැහැ කියලා. බොබ්ට තවම මතකය ඇවිල්ල නැහැ." ජුපිටර් පිළිතුරු දුන්නේය.

"මම ඒක කියන්නම්. රූඩි කිව්වා ඔයාලට ඉවසන්න කියලා. කළුවර වැටුණාම එයා ඒවි. ඒ එනතුරු මේ කෑම කන්න."

මිනිසා තම විශාල පිළිවැස්ම තුළින් ඔතන ලද සැන්ඩ්විච්, පලතුරු සහ ප්ලාස්ටික් බෑගයක දැමූ වතුර ද ළමුන් අත තැබීය.

ළමයි ඉතා සතුටින් ආහාර අතට ගත්හ.

"මම දැන් ඉක්මනට ආපහු යන්න ඕනෑ. ඉවසන්න. පෝල් කුමරු ඔයාලා සහ අපේ කුමාරයව ආරක්ෂා කරාවි."



Scanned with CamScanner

sinhalaebooks.com

ඔහු ගිය සැනින්ම පීටර් සැන්ඩ්විච් කෑබැල්ලක් ගෙන කටේ දමා ගත්තේය.

"මේ කෑම අපට මුළු දවසටම." කියමින් ජුපිටර් එය බොබ් වෙත යැවීය.

"වැදගත්ම දේ තමයි වතුර. අපේ වාසනාවට රූඩියි, එලිනයි අපේ යාළුවෝ වුණේ."

"ඔව්... ඔව්... අපේ වාසනාව." බොබ් සිනාසුනේය.

"මොකක්ද එයා ඊයේ රෑ කිව්වෙ ඩිජාරෝ කුමාරයට සහාය දෙන සංවිධානයක් ගැන. මගේ ඔළුව රිදුණු නිසා මට ඒකට හරියට ඇහුම්කන් දෙන්න බැරි වුණා."

"ඔයා ඒ ගැන දැනටමත් දන්නවා." ජුපිටර් කෑම කමින්ම උත්තර දුන්නේය.

"එයා කිව්වා රූඩිගෙයි, එලිනගෙයි තාත්තා ඩිජාරෝ කුමරුගේ තාත්තා රට පාලනය කරන කාලේ අගමැති වෙලා හිටියලු. ඒ විතරක් නෙමෙයි, පෝල් කුමාරයා බේරගත්ත උසස් පරම්පරාවකින්ලු එයාලා පැවත එන්නෙ. ස්ටෙෆාන් ආදිපාදවරයා රට පාලනය බාර ගත්තට පස්සෙ රූඩිගේ තාත්තට බල කළාලු අගමැතිකමෙන් අස් වෙන්න. මේ නිසාම ඔහු ස්ටෙෆාන් ආදිපාදවරයා සැක කරලා තියෙනවා. එයා සංවිධානයක් පිහිටුවලා තියෙනවා ඩිජාරෝ කුමරුට පක්ෂපාත සියලුදෙනාම එකතු කරලා. එයාලා නිතරම ස්ටෙෆාන් ගැන සෙවිල්ලෙන් ඉන්නෙ. එයාලගෙ සංවිධානයේ නම තමයි වෘත්තීය ගායකයින්ගේ සංවිධානය."

"සමහරු බළකොටුවේ මුරට ඉන්නවා. සමහරු නිලධාරීන් විදිහට කටයුතු කරනවා. මම හිතන්නෙ අර අපට කෑම ගෙනාව, පිරිසිදු කරන සේවකයත් එයින් එක්කෙනෙක් කියලා. ඊයේ එයාලගෙ සංවිධානය දැනගෙන ඉඳලා තියෙනවා අපිව අත් අඩංගුවට ගන්න බව. ඒ බව රූඩිගේ තාත්තා දැනගෙන එයාලා ඉක්මනට ක්‍රියාත්මක වුණා. ඒ නිසයි රූඩියි, එලිනයි අපේ උදව්වට ආවෙ. රූඩිලා පුංචි ළමයි කාලේ එයාගේ තාත්තා ජීවත් වෙලා තියෙන්නෙ මේ මාලිගාවේ. ඒ නිසා එයාලා මේ හැම අස්සක් මුල්ලක්ම දන්නවා. හැංගිලා යන්න



පුළුවන් පටු මාර්ග, උමගවල්, කාණු ඒ හැම දෙයක් ගැනම දන්නවා. ඒ නිසා එයාලට ඕනෑ තැනක යන්න එන්න පුළුවන් කාටවත් නොපෙනී. ඔයාට මතකද ඩිජාරෝ අපට කිව්වා මේ මාලිගාව හදල තියෙන්නෙ පැරණි බළකොටුවක නටබුන් මත කියලා?"

"ඔක්කෝමත් හරි. අපි තවමත් මාලිගාව මුදුනෙ හිර කරලා. ඇත්තටම ඔයා හිතනවද රූඩියි, එලිනයි රෑ අපිව එක් කරගෙන යන්න ඒවි කියලා. කාට හරි අපිව අනුවෙන්න ඉස්සරවෙලා." පීටර් නොඉවසිල්ලෙන් විමසීය.

"එයාලා එහෙම කරයි. එයාලගෙ සැලැස්ම තමයි එයාලගෙ සංවිධානයට උදව් කිරීම. මම හිතනවා අපිට මෙතනින් යන්න පුළුවන් වේවි. අර මම ඔයාට දුන්න හඬ පටය ඒක හරිම වැදගත් සාක්ෂියක්."

"මට හිතෙනවා, මම ජේම්ස් බොන්ඩ් වුණා නම් හොඳයි කියලා. මොකද එයාට නම් ඕනෑ තැනකින් යන්න පුළුවන්. ඒත් මමවත්, ඔයාවත්, ජේම්ස් බොන්ඩ් නෙවෙයිනෙ. මේක හරිම විහිළුවක්. අපිට රූඩිගෙ උදව් නැත්නම් යන්න බැහැ." පීටර් මැවිසිලි නගන්නට විය.

"අපි අපිට කරන්න පුළුවන් දේ උපරිමයෙන් කරලා තියෙන්නෙ. අපිට මෙහෙන් යන්න ඕනෑ නම් ඩිජාරෝගෙන් උදව් ගන්න පුළුවන් වේවි. ඇයි අපි මෙහාට ආවෙ? අනිත් එක, රූඩියි, එලිනයි මෙහාට එනතුරු අපිට කිසිම දෙයක් කරන්න බැහැ. ඒක නෙමෙයි, ඔයාලා දන්නවා ඔය කෑමවලින් භාගයක් දවල්ටත් ඉතුරු කර ගන්න ඕනෑ බව."

පීටර් ඉක්මනින් ඉතිරි සැන්ඩ්විච් ආපසු තැබීය.

"ඒක මතක් කළාට ගොඩාක් ස්තුතියි. මට දවල් කෑම නැති වුණොත් හරිම අමාරුයි. මුළු දවසම මෙතන ඉන්න වුණොත්..."

ඇත්තෙන්ම ඒ දවස දිගු විය. ඔවුහු වරින් වර ජනෙල් සිදුරෙන් එබී බැලූහ. අවසානයේ හිරු බැස යන්නට විය. සෙන්ට් ඩොමිනික් පල්ලියේ රන් කොත පසුපසින් රන් පැහැ බෝලයක් මෙන් හිරු ගිලී ගියේය. සැඳෑවේ කැදලි කරා එන කුරුල්ලන්ගේ ගී නාදය ඩෙන්සෝ උද්‍යානය දෙසින් ඇසුණි.

අඳුරත් සමග මුළු මාලිගාවම නිහඬ විය. රාත්‍රියේදී අවදිව



Scanned with CamScanner

sinhalaebooks.com

සිටින්නේ මුර සෙබළුන් පමණි. මාලිගයේ සිර කුටි අඳුරේ පසු විය. දෙදෙනෙක් නිසොල්මනේම ඔවුන් දන්නා මාර්ගයකින් බඩගාගෙන එන්නට වූහ. ඔවුන් දෙදෙනා ඉදිරියට එද්දී හිණි පෙළ ළඟ සිටි මුර භටයා ඔවුන් නොදුටු සේ අහක බලා ගත්තේය. ඇඩි අඳුර සහ රාත්‍රියේ නිසල බව බළකොටුවේ මුදුනට නැගීමට ඔවුනට උපකාරී විය. ඔවුන් මදක් නැවති බලා සිටියේ කිසිවකු විසින් ඔවුන් ලුහුබඳීවි දැයි සැක හැර දැන ගැනීමටය. ඉන්පසු ඔවුහු මුර කුටියට රිංගා ගත්හ. පීටර් ඔවුන් දෙස විමතියෙන් බැලීය. රූඩි අත විදුලි පන්දමක් තිබූ අතර එය ලේන්සුවකින් ආවරණය කර තිබුණේ එළිය අන්තරායදායක බැවිනි.

"අපි ලෑස්තියි යන්න. අපේ සැලැස්ම වෙන්නෙ, ඔයාලව බළකොටුවෙන් පිට කරලා ඇමෙරිකන් තානාපති කාර්යාලයට බාර දෙන එක. ආරංචියක් තියෙනවා, ස්ටෙෆාන් ඉක්මනින්ම එයාලගෙ සැලැස්ම ක්‍රියාත්මක කරනවා කියලා. අපි හිතනවා ඔහු හෙට ඩිජාරෝ කුමාරයගේ රාජාභිෂේකය අවලංගු කරලා ඔහුගේ පාලන කාලය දින නියමයක් නැතිව දීර්ඝ කරලා ප්‍රකාශයට පත් කරයි කියලා. අවාසනාවකට අපිට පුළුවන්කමක් නැහැ ඔහුව නවත්වන්න. මිනිස්සු මේ සිද්ධිය දැන ගත්තා නම් එයාලා බළකොටුව වටලලා ඩිජාරෝ කුමාරයව බේරා ගනිවි. නමුත්, ඒක ඔවුන්ට කියන්න බැහැ. ඒක ඩිජාරෝ කුමාරයට තර්ජනයක් වෙන්න පුළුවන්. අපි උත්සාහ කළා ගුවන් විදුලියයි, රූපවාහිනී මධ්‍යස්ථානයයි අල්ලා ගන්න. ඒත් අපිට වඩා ස්ටෙෆාන් කපටියෙක්. ඔහු ඒවාට පූර්ණ ආරක්ෂාව යොදවලා. බොබ්... ඇත්වත් කියන්න, ඔයාට මතකද රිදී මකුළුවා ඇම්මේ කොහෙද කියලා. ඒක මිදුලෙ තිබුණෙ නැහැ."

බොබ් හිස සැලීය. ඔහුගේ මතකය නැතිවීම පිළිබඳ ඔහු බිය විය.

"අපි ළඟ රිදී මකුළුවා හිටියා නම්, අපිට ඩිජාරෝ කුමාරයට උදව්වක් කරන්න තිබුණා නේද?" ජුපිටර් ඇසීය.

"එහෙම කරන්න තිබුණා. රිදී මකුළුවා කියන්නෙ රාජ්‍ය ලාංඡනය. කෙනෙක්ව රජකමට පත් කරද්දි ඒක තියෙන්නම ඕනෑ. ඒක ගොඩක් වටිනවා." එලීනා කීවාය.

"අනිත් අතට අපේ යුතුකමක් වෙනවා රිදී මකුළුවා හොයාගන්න එක. බලකොටුවෙන් පිටවෙලා යන්න ඉස්සරලා මට හිතෙනවා රිදී



මකුළුවා සඳලුතලේ ගරාදි වැට දිගේ හරි, අපේ කාමරයේ හරි ඇති කියලා. අපිට තවමත් ඉඩ තියෙනවා ඒක හොයාගන්න." ජුපිටර් යෝජනා කළේය.

"ඒක හුඟක්ම භයානකයි. නමුත් සමහර විට ඒක හොයාගන්න පුළුවන් වේවි. ඒ කොහොම වුණත් ඔයාලව හොයාගන්න පුළුවන් එකම තැනත් ඔයාලගේ කාමරේ කියන එක අමතක කරන්න එපා, තේරුණාද? කමක් නැහැ. ඒකත් අපි කරලා බලමු." රූඩි කිව්වේය.



Scanned with CamScanner

sinhalaebooks.com

# 10

## හදිසි පහරදීමක්

ඔවුහු මුර කුටියෙන් පිටව යාමට පෙර සැලකිලිමත් වූහ. ඔවුහු කෑම ඔතාගෙන ආ කඩදාසි, වතුර රැගෙන ආ ඉටි මලු ආදී සියල්ලම එකතු කර ගත්හ. ඔවුන් කිසිදු සාක්ෂියක් එහි ඉතිරි කළේ නැත. ඉන්පසු රාත්‍රිය මැදක් ගතවන තෙක් බලා සිටියහ.

"අපි ඇති තරම් බලාගෙන හිටියා. දැන් අපි යන්න ඕනෑ. මගේ ළඟ වැඩිපුර විදුලි පන්දම් දෙකක් තියෙනවා. පොඩි ඒවා. මම එකක් ජුපිටර්ට දෙනවා. අනික් එක පීටර්ට දෙනවා. අවශ්‍ය වෙලාවට විතරක් මේවා පාවිච්චි කරන්න. මම ඉස්සරලා යන්නම්. එලිනා ඔයාලට පිටිපස්සෙන් එයි. දැන් අපි යමු."

ඔවුහු හිණි පෙළ දිගේ එකට ගමන් කරන්නට වූහ. ඔවුහු නිතරම පිටත ශබ්දවලට ඇහුම්කන් දුන්හ. අහස කළු වලාවන්ගෙන් පිරී ගොස් ලොකු වැහි බිඳු ඇද වැටෙන්නට විය. ඔවුහු කිසිදු ශබ්දයකින් තොරව ගමන් කරන්නට වූහ. රූඩිගේ විදුලි පන්දමේ එළිය කණාමැදිරි එළියක් මෙන් වරින් වර පත්තු විය. බොහෝ පඩි පෙළවල් පසු කිරීමෙන් පසු ඔවුහු වෙනත් කොරිඩෝවකට පැමිණියහ. ඔවුහු කාමරයක් ළඟට විත් එහි දොර ඇරියෝය.

"අපි මෙහෙ ටිකක් ඉඳලා යමු." රූඩි කීවේය.

"ඈතට යන්න තවත් ලේසි වේවි. මේ කොටසේ යන්න ලේසියි. අපි ආව හරිය තමයි භයානක. මම හිතන්නෙ නැහැ එයාලා තවත් අපි ගැන හොයනවා කියලා. ඉස්සරලම අපි රිදී මකුළුවා හොයාගන්න ඕනෑ. ඒක හම්බ වුණත් නැතත් අපි යට තියෙන කාමරවලට බහින්න



ඕනෑ. ඒවායින් තමා අපට පොළොව යට තියෙන හිර ගෙවල්වලට යන්න වෙන්නෙ. ඒවායෙන් පිටවන කුඩා කානුව දිගේ තමයි අපිට යන්න වෙන්නෙ. එලිනයි, මමයි දැනටමත් මේ ගමන යන හැටි සැලසුම් කරලා ඉවරයි. ඇමෙරිකන් තානාපති කාර්යාලයට ඔයාලා බාර දුන්නාම ඔයාලා ආරක්ෂා සහිතයි. ඉන්පස්සේ අපේ සංවිධානය නගරය පුරාම පෝස්ටර් අලවනවා. 'ඩිජාරෝ කුමරුට අනතුරුදායකයි. ස්ටෙෆාන් රජකම බලෙන් පැහැර ගන්න හදනවා' කියලා. ඊට පස්සෙ.... මොනවා වේවිද කියන්න අපි දන්නෙ නැහැ. අපිට බලාපොරොත්තුවක් තියාගන්න පුළුවන්."

"දැන් අපි ජනේලයෙන් ගිහිල්ලා සඳලුතලයට බහින්න ඕනෑ. මගේ ඉණ වටේ ලණුවක් තියෙනවා. එලිනා ළඟත් එකක් තියෙනවා. එයාගේ එක අපි හදිස්සියකට පාවිච්චි කරන්න තියා ගමු."

රූඩි ලණුව තදින් බැඳ තබා ජනේලයෙන් බැස සඳලුතලයට පිවිසුණේය. පීටර් සහ ජුපිටර් ඔහු අනුගමනය කළෝය.

බොබ් සහ එලිනා ජනේලයෙන් එබී බැලූහ. ඔවුන් විදුලි පන්දම් සොලවමින් රිදී මකුළුවා සොයන්නට වෙහෙසෙනු පෙනෙයි. මඳ වේලාවකින් ආලෝකය මැකී ගියේය.

"පල්ලෙහාට එන්න." රූඩි මිමිණුවේය.

අඳුරේ සියලුදෙනාම එකට එකතු වූහ.

"ඇත්තටම ඒක ගහට වැටෙන්න ඇති. මට නම් වෙන හිතන්න විදිහක් නැහැ. මට නම් හිතෙන්නෙ කාමරයෙන් සඳලුතලයට එද්දි හදිසියට විසි කරන්න ඇති."

ඔවුන් සඳලුතලයේ අයින දිගේ ගොස් වටේ පරීක්ෂා කළහ. නමුත් ඔවුන්ට රිදී මකුළුවා හමුවූයේ නැත.

"වැඩක් නැහැ. රිදී මකුළුවා සඳලුතලේ නැහැ."

"අපි දැන් මොකද කරන්නේ?" පීටර් කොඳුළේය.

"කාමරය ඇතුළට යමු. අපි කාමරෙත් බලමු." ජුපිටර් යෝජනා කළේය.

එක් එක්කෙනා බැගින් කාමරයට ජනේලය තුළින් රිංගා ගත්හ.



Scanned with CamScanner

sinhalaebooks.com

ඔවුහු හොඳින් ඇහුම්කන් දුන්හ. මුළු බළකොටුවම නිහඬතාවයේ ගිලී තිබුණි. එහි නිහඬ බව බින්දේ රැහැයියන් පමණි.

"අපේ කාමරෙත් රැහැයියෝ ඉන්නවා. ඒක වාසනාවන්ත ලකුණක්." පීටර් මිමිණීය.

"බොබ්, ඔයා කිව්වනේ ඔයා රිදී මකුළුවා අතේ තියාගෙන කාමරය වටේම දිව්වා කියලා. ඉතින් ඒක මේ කොහේ හරි ආත්ත ඕනෑ. අපි මුළු කාමරයම පරීක්ෂා කරමු." එලීනා යෝජනා කළාය.

ඔවුහු කාමරයේ හැමතැනම පරීක්ෂා කරන්නට වූහ. බොබ්ට විදුලි පන්දමක් නොවූ බැවින් ඔහු පීටර් සමග එක් විය. ආලෝකය නිසා ඇතැම් දේවල් දිලිසෙයි. බොබ් දිලිසෙන යමක් ඇහිලුවේය. බොබ්ගේ සිත සතුටින් පිරී ගියේය. ඔහුගේ බලාපොරොත්තු කඩ කරමින් ඔහු ඇහිඳ තිබුණේ සේයාපටයක් ඔතා තිබූ තුනී ඇලුමිනියම් පත්‍රයකි. බොබ් නැමී ඇඳ යට ද බැලුවේය. එහි සිටි කළු පැහැති කුඩා සතෙක් 'ක්‍රික් ක්‍රික්' හඬ නගමින් ඉගිළ ගියේය.

පීටර් ඒ පසුපසට විදුලි පන්දමේ එළිය විහිදුවේය. කාමරයේ මුල්ලක තිබූ මකුළු දැලක ඌ එල්ලී සිටියේය. රැහැයියා එයින් පැන යාමට උත්සාහ දැරිය. නමුත් ඌ තව තවත් දැලෙහි පැටලුණේය. ජනේලයේ සිටි මකුළුවෝ දෙදෙනා රැහැයියා දෙස බලා සිටියෝය. එයින් එකෙක් පැමිණ රැහැයියා වටා නූල් ඔතන්නට විය. මොහොතකින් ඌ අසරණව ඔවුන්ගේ සිරකරුවෙකු බවට පත් විය.

බොබ්ට රැහැයියා නිදහස් කර යැවීමේ සිතක් පහළ විය. නමුත් ඒ අදහස මැඩපවත්වා ගන්නට ඔහුට සිදු විය. රැහැයියා බේරා ගන්නට නම් මකුළු දැල කඩා විනාශ කළ යුතුය. සමහර විට මකුළුවා මරා දමන්නට ද සිදුවේ. ඒත් මකුළුවා වෙරෝනාවේ වාසනාවේ ලාංඡනයයි.

"ඔයා කිව්වා රැහැයියෙක් කාමරයේ ඉන්න එක වාසනාවක් කියලා. ඒත් රැහැයියට වාසනාවක් නැහැ. අපි බලාපොරොත්තු වෙන දේවල් නෙවෙයි සිද්ධ වෙන්නෙ." බොබ් කීවේ කනගාටුවෙනි.

පීටර් නිහඬ විය. බොබ් සහ පීටර් එකතුව ඇඳ යට පරීක්ෂා කර බැලීමෙන් පසු අනෙක් අයට එකතු වූහ.

"මට නම් හිතෙන්නෙ ඇත්තටම බොබ් රිදී මකුළුවා හංගලා තියෙන්නෙ. ඊයේ රෑ මුර සෙබළුන්ට හම්බ වුණෙත් නැති නම්, අපිටත්



ඒක හොයාගන්න බැරි වුණා නම්, ඒකට මොනවා වෙන්න ඇද්ද?" ජුපිටර් මුමුණන්නට විය.

"ඒක හම්බ වෙන්නෙ නැහැ." රූඩි ද පහත් හඬින් කීවේය.

"ස්ටෙෆාන් වියරු වැටිලා ඉන්නෙ. එයාට ඒක හම්බ වුණා නම් හිනාවෙනවා ඇති. සමහර විට බොබ් ඒක හංගන්න ඇති. බොබ්, ඔයාට දැන්වත් මතක් කර ගන්න පුළුවන්ද, ඒක කොහෙද හැංගුවෙ කියලා?"

තවමත් බොබ්ට රිදී මකුළුවා ගැන මතකයක් නැත. ඔහු හිස වනා ඒ බව ඇඟවූයේය.

"හොඳයි, අපි තවත් බලමු. ඇඳුම් පෙට්ටිය බලන්න. එලීනා, ඔයා මෙට්ටෙ යටයි, කොට්ට යටයි බලන්න. සමහර විට ඒවායේ යට හංගන්න ඉඩ තියෙනවා. ඊට වඩා හොඳ තැනක් නැහැ මම හිතන්නේ." රූඩි උනන්දුවෙන් කීවේය.

පීටර් සහ ජුපිටර් ඇඳුම් බෑගය පරීක්ෂා කළ අතර එලීනා මෙට්ට, ඇඳ ඇතිරිලි, කොට්ට ආදියෙහි යට සොයා බැලුවාය. එහි අවසාන ප්‍රතිඵලය ද කිසිවක් නැත.

නැවතත් ඔවුහු කාමරය මැදට එකතු වූහ

"ඒක මෙහෙ නම් නැහැ." රූඩිගේ හඬ කුතුහලයෙන් පිරී තිබුණි.

"අපිට බැරි වුණා ඒක හොයා ගන්න. සෙබළුන්ටත් බැරි වුණා. සඳලුතලය දිගේ යද්දී ඒක එයා ළඟ තිබුණලු. බොබ් උඩට නගිද්දී ඒක අත හැරෙන්න ඇති. ඒත් මට තවමත් හිතාගන්න බැරි එහෙමනම් ඇයි ඒක මිදුලට වැටුණෙ නැත්තෙ?" රූඩි කුතුහලයෙන් යුතුව මුමුණන්නට විය.

"දැන් අපි මොකද කරන්නෙ රූඩි?" ජුපිටර් ඇසීය.

සුපුරුදු ලෙස වෙනදා සියල්ලක්ම සිදුවන්නේ ජුපිටර්ගේ මූලිකත්වයෙනි. නමුත් අද රූඩි මූලිකත්වය ගෙන සිටින්නේ පැරණි මාලිගාවේ සියල්ලක්ම හොඳින් දැන සිටින්නේ ඔහු බැවිනි.

"ඔයාලගෙ ආරක්ෂාව වැදගත්. දැන් අපි යමු." රූඩි යෝජනා කළේය.



Scanned with CamScanner

sinhalaebooks.com

සැනෙකින් දොර විවර විය. විදුලි එළි කාමරය ආලෝකවත් කළේය. තද රතු නිල ඇඳුමකින් සැරසුණු රාජකීය මුර භටයෝ දෙදෙනෙක් කාමරයට ඇතුළු වූහ.

"උඹලා කොහෙද නතර වෙලා ඉන්නෙ? අපි උඹලව අත් අඩංගුවට ගන්නවා. අපි ඇමෙරිකන් ඔත්තුකාරයෝ අල්ලා ගත්තා."

එම මොහොත ඉතාම ව්‍යාකූල අවස්ථාවක් විය. රූඩි වේගයෙන් මුර භටයන් දෙදෙනා වෙතට පැන්නේය.

"එලිනා..., මෙයාලාව ආරක්ෂා කර ගන්න.... මාව අලා යන්න..." රූඩි කෑ ගැසුවේය.

"එන්න.... ඉක්මන් කරන්න.... ජනේලයෙන් පනින්න. මගේ පස්සෙන් එන්න..." එලිනා අණ කරන ස්වරයකින් කෑ ගැවාය.

බොබ් ජනේලය දෙසට යන්නට හැරුණේය. ඒ සමගම රූඩි පළමුවෙන් ආ මිනිසා සමග පොර බදන්නට විය. ඔහුගේ කකුල් අල්ලා ගන්නට වෙර දැරීය. අනෙක් මුර භටයා ජුපිටර්ගේ බෙල්ලෙන් අල්ලා ගත්තේය. දෙගොල්ලන්ම පොර බදන්නට ගොස් එක ගොඩේ ඇද වැටුණි. බොබ් සිටියේ ඔවුනට මැදි වී නිසා බර සිරුරක් ඔහුගේ ඇගේ හැපෙත්ම බොබ් බිම ඇද වැටුණේය. ඔහුගේ හිස නැවත වතාවක් බිම වැදුණි. බිම් පලසේ වැදුණු නිසා පහර එතරම් ප්‍රබල වූයේ නැත. දෙවන වර ද බොබ්ගේ ඇස් නිලංකාරව ගියේය.



# 11

## මහලු ඇන්ටන්

බොබ් ඇස් වසා වැතිර සිටියේ ජුපිටර් සහ රූඩි කතා කරන දේවල්වලට ඇහුම්කන් දෙමිනි.

"අපිත් හරියට අර රැහැයියා මකුළු දැලට අහු වුණා වගේ අහු වුණේ. මම කොහෙත්ම හිතුවෙ නැහැ මුරභටයෝ දොරෙන් එහා පැත්තෙ ඉන්නවා කියලා." ජුපිටර් දෙමිනස් සිතින් කීවේය.

"මමත් හිතුවෙ නැහැ එහෙම. මම හිතුවා කාමරය හිස් නිසා ඔවුන් ඒක අමතක කරලා ඇති කියලා. කමක් නැහැ, අඩු තරමේ එලිනයි, පීටරුයි දෙන්නවත් පැන ගත්ත නේ." රූඩිගේ සිතේ ද වූයේ කනස්සල්ලකි.

"එයාලා මොනවා කරයිද?" ජුපිටර් ප්‍රශ්න කළේය.

"මම දන්නෙ නැහැ. මගේ තාත්තට හරි, අපිට පක්ෂ වෙන කාට හරි, කිව්වම අපිව බේරගන්න එක සැක සහිතයි. මොකද එයාට හැංගෙන්න වෙලා තියෙන්නෙ ස්ටෙෆාන් එයාගෙන් පලිගන්න නිසා."

"අපිත් හරියට ඩිජාරෝගෙ සුප් එකේ තියෙන කරපිංචා කොළ වගේ." ජුපිටර් මුමුණන්නට විය.

"අපි මෙහේ ආවෙ ඩිජාරෝ කුමරුට උදව් කරන්න. ඒත් දැන් අපි එහෙම පිටින්ම අමනයෝ."

"අමනයෝ...? මට ඒ වචනය තේරුම් ගන්න බැහැ."

"දුර්වලයෝ." ජුපිටර් කීවේය.



Scanned with CamScanner

sinhalaebooks.com

"අපි බලමු මොකද වෙන්නෙ කියලා. බොබ් නැගිට්ටනවා වගේ. එයාගෙ ඔළුව දෙපාරක්ම වැදුණ නේ."

බොබ් දෙනෙත් හැරියේය. ඔහු ඝන රෙද්දක වැතිර සිටියේය. ඔහු ඇසිපිය ගසා අවට පිරික්සා බැලුවේය. ඔහු වටේ ගල් බිත්ති සහිත කාමරයකි. එහි වහලය ද ගලින් නිම කර තිබුණි. සවිමත් දොරෙහි සිදුරක් පමණක් ඉතිරිව තිබුණි. ජුපිටර් සහ රූඩි ඔහු වෙත නැඹුරු වී සිටියෝය. බොබ් හිඳ ගත්තේය. ඔහුගේ හිස කැරකෙන්නට විය.

"ඊළඟ සැරේ මම වෙරෝනාවට එද්දි පාපන්දු ගහද්දි අන තොප්පියක් ගේනවා." බොබ් කිවේ සිනාසෙන්නට උත්සාහ දරමිනි.

"හ්ම්...! දැන් ඔයාට හොඳයි." රූඩි සතුටට පත් විය.

"බොබ්, ඔයාට මතකද?" ජුපිටර් ඉක්මනින් ඇසීය.

"හොඳට හිතන්න."

"ඇත්තෙන්ම මට මතකයි. අපි කාමරේ ඉඳිද්දි මුර සෙබළු දෙන්නෙක් කාමරේ දොර ඇරගෙන ඇතුළට ආවා. ඔයයි, රූඩියි එයාලා එක්ක පොර බැදුවා. මගේ ඇඟේ හැපුණු වේගයට මම බිම වැටුණා. මගේ ඔළුව ආයෙත් සැරයක් බිම වැදුණා. මට ඒ ඔක්කොම මතකයි. මම හිතන්නෙ දැන් අපි ඉන්නෙ හිර මැදිරියක් වගේ තැනක."

"මම ඒක නෙවෙයි ඇහුවෙ. මම ඇහුවෙ ඔයා රිදී මකුළුවට මොකද කළේ කියලා මතකද? මේකයි, සමහර වෙලාවට ඔළුව එක පාරක් වැදුනම අර්ධව ස්මරණ ශක්තිය තියෙනවා. සමහර විට ආයෙ පාරක් වැදුනාම මුළු ස්මරණ ශක්තියම එන්න පුළුවන්."

"නැහැ. තවමත් එතැන හිස්තැනක් තියෙනවා." බොබ් කට ඇද කළේය.


"සමහර විට ඒක අවාසියක් වෙන්නෙ නැති වෙයි. ස්ටෙෆාන් බල කරන එකක් නැහැ ඔයාට ඒ ගැන කියන්න කියලා."

එසැනින්ම දොරේ අගුල කරකවනු පෙනුණි. බරැති යකඩ දොර පැද්දී ඇතුළට ආවේය. රාජකීය මුර භටයෝ දෙදෙනෙක් ඔවුන් ඉදිරියේ වූහ. ඔවුන්ගේ එක් අතක විදුලි ලාම්පුවකුත්, අනෙක් අතේ කඩුව බැඟිනුත් තිබුණි.



"එන්න..." එක් අයෙක් ගුගුළේය.

"ප්‍රශ්න කරන කාමරයේ ස්ටෙෆාන් ආදිපාදතුමා බලා ඉන්නවා. අපිත් එක්ක එන්න. හැබැයි සෙල්ලම් දාන්න ලෑස්ති වෙන්න එපා. ඊට පස්සේ වැඩේ නරක් කරගන්නත් එපා." ඔහු කඩුව වනමින් තර්ජනය කළේය.



ළමෝ හෙමින් සැරේ ඇවිද යන්නට වූහ. එක් සොල්දාදුවෙක් ඔවුන්ගේ ඉදිරිපසින් ද අනෙකා පසුපසින් ද ගමන් කළහ. ඔවුහු බර අඩි තබමින් කොරිඩෝව දිගේ ගමන් ගත්හ. ඔවුහු තවත් වසා ඇති දොරවල් සහිත කාමර පසු කරමින් හිණි පෙළ මුදුනටම නැගුණහ. එතැන මුරකරුවන් දෙදෙනෙක් සීරුවෙන් සිටියහ.

මුරභටයන් දෙදෙනා ළමයි දොරකඩෙන් ලොකු කාමරයකට තල්ලු කරනු ලැබූහ. බොබ් අමාරුවෙන් මෙන් හුස්ම ගත් අතර ජුපිටර් පවා සුදුමැලි වී ගියේය. ඔවුන් දුටු දර්ශනය භයානක චිත්‍රපටයක මෙනි. අවුරුදු සිය ගණනකට පෙර සිට වධ හිංසා පමුණුවන කාමරය එය විය.

sinhalaebooks.com

එක් පැත්තක දඬු කඳකි. එහි වරදකරු හිර කර ඇටකටු උඩට විශාල බර පටවනු ලැබේ. මඳක් එහායින් තවත් උපකරණයකි. විශාල රෝදයක වරදකරු තද කර තබා කකුල් සහ අත් මිටිවලින් පොඩි කරනු ලබයි. එහි තවත් විවිධ උපකරණ තිබුණි. විශාල ලී කොට තිබුණත් එය සූදානම් කර නොතිබුණු නිසා එම උපකරණය කුමක්දැයි නිශ්චය කිරීමට ඔවුනට නොහැකි විය. කාමරය මැද වූයේ යකඩයෙන් නිම කළ උස ගැහැනු රුවකි. එහි හැඩය ගොළුබෙලි කටුවක හැඩය ගනියි. එහි ඉදිරිපස අසව් අල්ලා ඇති නිසා විවෘත කිරීමට හැකිය. එහි ඇතුළත යකඩ කූරු සවිකර ඇති අතර යම් අයකු යකඩ ගැහැනියගේ ඇතුළට ඇමූ පසු යකඩ කූරු ඍජුව සිට පහර දෙයි.

"ප්‍රශ්න කරන කාමරේ." රූඩි පැටලිලි හඬින් මිමිනුවේය.

"මම අහලා තියෙනවා, ඉස්සර කාලෙක කළු ජෝන් කියලා දුෂ්ට පාලකයෙක් ඉඳලා තියෙනවා. මම දන්න විදිහට නම් මේක එයා පාවිච්චි කළාට පස්සෙ කවුරුත්ම පාවිච්චි කරලා නැහැ. මම හිතනවා ස්ටෙෆාන් අපිව මෙහාට ගෙනෙන්න ඇත්තෙ බය කරන්න. ඔහු අපිට වධ හිංසා කරන එකක් නැහැ." රූඩි කොඳුරන්නට විය.

සමහර විට රූඩි නිවැරදි වන්නට ද පුළුවන. නමුත් දඬු කඳ, රෝදයක් වැනි උපකරණය, යකඩ ගැහැනිය සහ තවත් භයානක උපකරණ දැකීමෙන් බොබ්ගේ මෙන් ජුපිටර්ගේ ද සිතට දැනුණේ බිය මුසු පිළිකුලකි.

"නිශ්ශබ්ද වෙනවා.... ස්ටෙෆාන් ආදිපාදතුමා එනවා...." මුරභටයා රූඩිට ගෙරෙව්වේය.

කාමරයේ දෙපස සිටි මුර භටයෝ දෙදෙනා සීරුවෙන් සිටියෝය. ස්ටෙෆාන් ආදිපාදවරයා කාමරයට ඇතුළු විය. ඒ පසුපසින්ම රෝජාස් ආදිපාදවරයා ද පැමිණුනි. ස්ටෙෆාන් ආදිපාදවරයාගේ මුහුණ අඳුරු පෙනුමක් ගත්තේය.

"දැන් මී පැටව් ටික උගුලට අහුවෙලා ඉවරයි. දැන් හොඳම වෙලාව තොරතුරු සපයන්න. මට දැනගන්න වුවමනා දේ උඹලා මට කියන්න ඕනෑ. එහෙම නැත්තම් වැඩ වරදියි." ස්ටෙෆාන් ආදිපාදවරයා ළමුන් දෙස මාරුවෙන් මාරුවට බැලුවේය.

මුර සෙබළු මුල්ලක තිබුණු පුටුවක් දූවිලි පිස දමමින් ගෙන



ආවෝය. ඔහු ඉදිරියේ වූ ලී බංකුවේ ළමයි තිදෙනා හිඳ ගත්හ. ස්ටෙෆාන් ආදිපාදවරයා පුටුවේ වාඩි වී පුටු ඇන්දට ඇඟිලිවලින් තට්ටු කරන්නට විය.

"ආහ්...! තරුණ රුඩොල්ෆ්, උඹත් මෙහේ. මම උඹේ තාත්තා එක්කවත් උඹේ පවුලෙ අය එක්කවත් කිසිම සම්බන්ධකමක් තියාගන්න කැමති නැහැ. මම ඒ ගැන උඹට කියන්නෙ නැහැ."

ස්ටෙෆාන් ආදිපාදවරයා රූඩිට එසේ කියද්දී රූඩි තොල් තද කරගෙන බලා සිටියා මිස කිසිවක් කියන්නට ගියේ නැත.

"ආහ්...! දැන් උඹලා, මගෙ තරුණ ඇමෙරිකන්කාරයො, හරි... මට උඹලා ඉන්නවා. අඩුම තරමේ උඹලා දෙන්නෙක්වත් ඉන්නවා. මම උඹලගෙන් අහන්න යන්නෙ නැහැ ඇයි උඹලා මෙහෙ ආවෙ කියලා. උඹලගෙ කැමරා සහ ඒට පිටුපස්සෙ තිබුණු අනෙක් උපකරණවලින් අපි හැමදෙයක්ම තේරුම් ගත්තා. ඒකෙන් උඹලා ඔප්පු කළා උඹලා ඇමෙරිකානු රජයේ ඔත්තුකාරයෝ කියලා. උඹලා මෙහාට ආවේ වෙරෝනාවට විරුද්ධව කුමන්ත්‍රණයකට. ඒත් උඹලා ඊටත් වැඩිය ලොකු වැරැද්දක් කරලා තියෙනවා. උඹලා වෙරෝනාවේ රිදී මකුළුවා හොරකම් කරලා."

ඔහු ඉදිරියට නැමුණේය. ඔහුගේ මුහුණ අඳුරු වී තිබුණි.

"මට කියන්න, ඒක කොහේද?" ඔහු ඇසීය.

"මට ඕනා බොහොම ලේසියි ඒක උඹලගෙන් දැනගන්න. මම හිතනවා උඹලා තරුණ කොල්ලෝ. ඒ වගේම මෝඩයි. හ්ම්...! දැන් කතා කරපල්ලා...!"

"අපි ඒක හොරකම් කළේ නැහැ. කවුරු හරි ඒක හොරකම් කරලා අපේ කාමරයේ හංගලා." ජුපිටර් නිර්භයව පිළිතුරු දුන්නේය.

"ඒ කියන්නේ, උඹ පිළිගන්නවා ඒක උඹලා ළඟ තියෙනවා කියලා. ඒක අපරාධයක්. නමුත් මම සාධාරණ මිනිහෙක්. මම කනගාටු වෙනවා උඹලගෙ කොලුකමයි, මෝඩකමයි ගැන. දැන් මට කියන්න ඒක කොහේද තියෙන්නෙ? මට ඒක ආපහු ඕනෑ. මම උඹලට සමාව දෙන්නම්."

බොබ් බලා සිටියේ ජුපිටර් කතා කරන තුරුය. ජුපිටර් මඳක්



Scanned with CamScanner

sinhalaebooks.com

නැති ගත්තේය. නමුත් ඔහු සිතුවේ සත්‍යය ප්‍රකාශ කිරීම වැරැද්දක් නොවන බවයි.

"අපි දන්නෙ නැහැ ඒක කොහෙද තියෙන්නෙ කියලා. අපි ඒ ගැන කිසිම දෙයක් දන්නෙ නැහැ."

"උඹලා මට අකීකරු වෙනවා. ආහ්...!" ස්ටෙෆාන් ආදිපාදවරයා ඔවුන් බියට පත් කරමින් ගුගුළේය.

"අනිත් කෙනාට කතා කරන්න පුළුවන්. උඹවත් මට අනුකම්පා කෙරුවොත්, උඹලට සමාව ලැබෙනවා. මගෙ පුංචි මී පැටියො, කියන්න කොහේද රිදී මකුළුවා?" ස්ටෙෆාන් ආදිපාදවරයා සන්සුන් හඬින් විමසීය.

"මම දන්නෙ නැහැ." බොබ් පිළිතුරු දුන්නේය.

"ඒත් ඒක උඹ ළඟ තියෙනවා." ස්ටෙෆාන් ආදිපාදවරයා නැවතත් තර්ජනාත්මක හඬින් කෑ ගැසීය.

"උඹ ඒක ගැන හොඳට දන්නවා. ඉතින් උඹ දන්නවා ඒක කොහේද තියෙන්නෙ කියලා. උඹ ඒක හැංගුවා නේද? නැත්තම් උඹ ඒක කාටහරි දුන්නද? උත්තර දීපන්... නැත්තම් උඹලට වැඩ වරදියි."

"අපි දන්නෙ නැහැ, ඒක කොහාට ගියාද කියලා. ඔබ මුළු රැම අපෙන් ඇහුවත් අපට කියන්න තියෙන්නෙ එකම දෙයයි. ඒ අපි රිදී මකුළුවට මොනවද වුණේ කියන එක දන්නෙ නැහැ කියලා විතරයි." ජුපිටර් ඍජු ලෙසින් කිවේය.

"උඹලා මුරණ්ඩු වෙනවා වගේ." ස්ටෙෆාන් ආදිපාදවරයා ඇඟිලිවලින් පුටු ඇන්දට තට්ටු කළේය.

"මට උඹලව සුවපත් කරන්න පුළුවන්. අපිට මේ කාමරේම තියෙනවා උඹලට වඩා නිර්භීත මිනිස්සුන්ව කතා කරවන්න පුළුවන් උපකරණ. උඹලා කැමතිද යකඩ ගැහැනියගෙ ඇතුළට යන්න. ආහ්...! එයා උඹලව බොහොම ආදරයෙන් වැලඳ ගනිවි."

බොබ්ගේ දෑසෙහි බිය රැඳුණා මෙන්ම ජුපිටර් අපහසුවෙන් කෙළ ගිල්ලේය. ඔවුන් නිහඬ වූ අතර රෑඩි නිර්භයව කතා කරන්නට විය.



"ඔබ නිර්භීත නැහැ. ඔබ බයගුල්ලෙක්....! ඔබට ශක්තියක් නැහැ අභියෝගවලට මුහුණ දෙන්න. ඔබ උත්සාහ කරන්නේ ඩිජාරෝ කුමරුගෙන් රජකම ලබා ගන්න. ඔබට ඕනෑ වෙරෝනාවේ මිනිස්සු ඔබ ධර්මිෂ්ඨ, කාරුණික රජෙක් කියලා කියනවා අහන්න. නමුත් ඔබ කාටහරි වද හිංසා පමුණුවලා තිබුණොත් ඔබත් ඉස්සර හිටපු කළු ජෝන් කුමාරයගෙ තත්ත්වයට පත් වෙයි. මතකද මිනිස්සු ඔහුට විරුද්ධව නැඟී සිටියා. එයාගේ ශරීරය කොටස්වලට ඉරලා දැම්මා. එහෙම කළොත් ඔබටත් වෙන්නෙ ඒ ටිකම තමයි."

"බොහොම නිර්භීත වචන ටික." ස්ටෙෆාන් ආදිපාදවරයා උපහාසාත්මක ලෙස සිනාසුනේය.

"මට ඔය යකඩ ගැහැනියවත්, දඬු කඳවත් ඕනෑ වෙන්නෙ නැහැ වරදකරුවකුගෙන් ඇත්ත දැනගන්න. මගේ ළඟ වෙනත් ක්‍රම තියෙනවා." ඔහු මුර සෙබළුන්ට අතින් සංඥාවක් කළේය.

"අභිගුණ්ඨික ඇන්ටන්ව එක්ක එන්න."

"වයසක ඇන්ටන්, එයා...." රෑඩි පුදුමයෙන් තම සගයන්ට ඇසෙන සේ මිමිණුවේය.

"නිශ්ශබ්ද වෙනු." ස්ටෙෆාන් ආදිපාදවරයා ගිගුරුවේය.

ළමයි ඔවුන්ගේ හිස් ඔසවා බැලූහ. මහලු මිනිසෙක් මුර සෙබළුන් පිරිවරාගෙන කාමරයට ඇතුළු විය. ඔහු උස සිරුරකින් යුතු වූ අතර ඔහු වැඩි දුරක් ගමන් කළේ කොන්ද නමා ගෙනය. ඔහුගේ සහායට අතේ සැරයටියක් ද විය. ඔහු ඇඳ සිටියේ දීප්තිමත් සාටකයකි. දෙකනේ රන් කරාබු යුවළක් වූ අතර ඔහුගේ මුහුණ හිස්කබලේ ගිලී තිබුණි. ඔහුගේ මුහුණ කොතරම් අඳුරු වුවද ඇස් දිලිසෙන්නට විය.

ඔහු ගාට ගාට විත් ස්ටෙෆාන් ආදිපාදවරයා ළඟ නතර විය.

"ඔන්න වයසක ඇන්ටන් ආවා." ඔහු කතා කළ ආකාරයෙන් ඔහුගේ යම් විශේෂත්වයක් පෙනෙන්නට තිබුණි.

"මට ඔබේ බලය අවශ්‍යයි." ස්ටෙෆාන් අණක ස්වරූපයෙන් කිවේය.

"මේ ළමයි යම් දෙයක් දන්නවා. ඒත් ඔවුන් ඒක කියන්නෙ නැහැ. මට ඒක දැනගන්න ඕනෑ."



Scanned with CamScanner

sinhalaebooks.com

මහලු අභිගුණ්ඨික මිනිසාගේ මුහුණෙහි සමච්චල් සිනාවක් නැගුණි.

"මේ වයසක ඇන්ටන් අණ කිරීම පිළිගන්නෙ නැහැ. සුබ රාත්‍රියක් ස්ටෙෆාන් ආදිපාදතුමනි." අභිගුණ්ඨික මිනිසා ඔහුට සමු දී යන්නට හැරුණේය.

අභිගුණ්ඨික මිනිසාගේ උඩඟුකම නිසා ස්ටෙෆාන් ආදිපාදවරයාගේ මුහුණ අඳුරු වී ගියේය. නමුත් ඔහු තම කෝපය පිටට නොහඟවා පාලනය කර ගත්තේය. ඔහු තම මුදල් පසුම්බියෙන් රත්රන් කැබලි කිහිපයක් එළියට ගත්තේය.

"මම ඔබට අණ කළේ නැහැ ඇන්ටන්. මම ඔබේ උදව්වයි බලාපොරොත්තු වුණේ. මම හොඳට ගෙවන්නම්. මේවා රත්රන්."

අභිගුණ්ඨික මිනිසා ආපසු හැරුණි. ඔහු දැන් දිගු කර රත්රන් කැබලි ගෙන ඒවා සාටකය යටට දමා ගත්තේය.

"ඇන්ටන් වැඩ කරන්නේ ලෝබ නැති අයට විතරයි." ඔහු කිවේ ආදිපාදවරයා දෙස සිනාවක් පාමිනි.

"මොකද්ද ඔබට දැනගන්න ඕනෑ කරන්නෙ ආදිපාදතුමනි?"

"මේ කොල්ලො දන්නවා රිදී මකුළුවා කොහේද හංගලා තියෙන්නෙ කියලා. ඒත් උන් කියන්නෙ නෑ ඒක කොහේද තියෙන්නෙ කියලා. ඒත් මට ලේසියෙන්ම ඇත්ත දැනගන්න පුළුවන් මේවගෙ උපකාරයෙන්." ඔහු වධ හිංසා පමුණුවන උපකරණ දෙසට අත දිගු කර පෙන්විය.

"ඒත් මට ඔවුන් ගැන දුක හිතුණා. ඔබේ බලය බොහොම ඉහළයි. වේදනාවක් නැහැ. දැන් මෙයාලගෙන් ප්‍රශ්න කරන්න."

"වයසක ඇන්ටන් ඔබේ අණ පිළිපදිනවා." ඔහු සිනාවක් නැගීය.

ඔහු ළමුන් දෙසට හැරුණි. ළමුන් ඉදිරියේ බිම හිඳගත් ඔහු තම ලෝගුව යටින් පොඩි උරයක් ගත්තේය. එහි පොඩි පිත්තල කෝප්පයක් ද කුඩු වර්ගයක් ද තිබුණි. ඔහු කෝප්පයට ඇඟිලි තුඩුවලින් කුඩු වර්ගය දැම්මේය. ඉන්පසු ඔහු සිගරට් දල්වන ලයිටරයක ආධාරයෙන් එම කුඩු රත් කරන්නට විය. ඝන නිල් පැහැති දුමක් එයින් ඉහළට නගින්නට විය.



"පොඩි කොල්ල නේ..... හුස්ම ගනිල්ලා....." ඔහු හීන් හඬින් කිවේ ගීතයක ආකාරයෙනි.

ඔහු එසේ කියන ගමන්ම ළමුන් තිදෙනාගේම මුහුණු වෙත කෝප්පය ගෙන ගියේය.

"හොඳට හුස්ම ගන්න. ඇන්ටන් අණ කරනවා, ඇත්ත සඳහාම දුම උරන්න."

ඔවුන් මුහුණු පසෙකට හරවා දුම් උර වීම නතර කරන්නට උත්සාහ කළ ද එය සාර්ථක වූයේ නැත. දුම ඔවුන්ගේ නාස් පුඩු දිගේ ඉහළට ගියේය. ඔවුන් එය ඉරවීමට අකමැති වුවද එය ඇඩි සුවඳකින් යුක්ත වූවකි. නමුත් ඔවුහු ඔහුට අවනත නොවී සිටින්නට උත්සාහ ගත්හ. ඒත් ඔවුනට ජය ගත නොහැකි විය. ඔවුන්ගේ මනසට ප්‍රසන්න බවකුත්, ඇසට නිදිමත ගතියකුත් දැනෙන්නට විය.

"දැන් මා දිහා බලන්න.... මං දිහා බලන්න, පොඩි පැටවු නේ... මගේ ඇස් දිහා බලන්න."

ඔවුනට අවශ්‍ය වූයේ ඔහුට විරෝධය පෑමටය. ඔවුන්ගේ ඇස් ඉබේම හැරවුණි. මහලු ඇන්ටන්ගේ ඇස් දෙස ඔවුහු බැලුවෝය. ඒ දිලිසෙන නිල් ඇස් තුළ වතුර පිරී තිබෙන සෙයක් ඔවුනට පෙනුණි.

"දැන් කතා කරන්න." ඔහුගේ හඬ විධානයක ස්වරූපයක් ගත්තේය.

"රිදී මකුළුවා කොහේද තියෙන්නෙ?"

"මම දන්නෙ නැහැ." රූඩි පිළිතුරු දුන්නේ නිහඬව සිටීමේ තේරුමක් නොමැති බැවිනි.

බොබ් සහ ජුපිටර්ගේ පිළිතුරු වූයේ ද එයමය.

"ආන්... ආයෙත් හුස්ම ගන්න. තදින් හුස්ම ගන්න."

ඔහු නැවත වතාවක් දුම් දමන කෝප්පයක් ළමුන් තිදෙනාගේ මුහුණ ඉදිරියෙන් ඇල්ලුවේය. බොබ්ට දැනුණේ අහසේ පාවෙන්නා බඳු සැප පහසු බවකි.

අභිගුණ්ඨික මිනිසා රූඩිගේ නළල ඔහුගේ ඇඟිලිවලින් සෙමෙන් තද කළේය. ඇසිපිය නොහෙළන රූඩිගේ ඇස් වෙත කිට්ටු විය.



Scanned with CamScanner

sinhalaebooks.com

රූඩිට අහක බැලීමට හැකියාවක් නොවිය. ඔහුගේ සිරුරේ පාලනය රැඳුණේ මහලු ඇන්ටන් මතය.

"දැන් හිතන්න." මහලු ඇන්ටන් මිමිණුවේය.

"කතා කරන්න එපා. හිතන්න.... රිදී මකුළුවා ගැන හිතන්න, හිතන්න, ඒක කොහේද තියෙන්නෙ...? ආහ්..."

සෑහෙන වේලාවකට පසු ඔහු රූඩිගේ නළල මතින් අත ඉවතට ගත්තේය. ඒ අයුරින්ම ජුපිටර්ට ද කළේය. ඊළඟට ඔහු බොබ් ළඟට පැමිණියේය. පෙර පරිදිම බොබ්ගේ නළල මත ඔහුගේ ඇඟිලි තැබුවේය. ඔහුගේ ඇඟිලි තුඩුවල පහස බොබ්ට දැනුණේ විදුලිය වැදුණු විටක මෙන් හැඟීමකි. ඔහුගේ නිල් දෑස්වලින් අනෙකාගේ සිතිවිලි කියවන්නට හැකිය. බොබ් රිදී මකුළුවා ගැන කල්පනා කරන්නට විය. බොබ්ට එකවරම පෙනුණේ ඔහු ඇන්ටන්ගේ අල්ල මත හිඳගෙන සිටින ආකාරයකි. ඉන්පසු එය අතුරුදහන් විය. ඔහුට වෙන කිසිම අදහසක් ආවේ නැත. ඔහුට කිසිවක් මතක් කර ගත නොහැකි විය. ඔහුගේ සිතිවිලි ද පාවී යන්නට විය.

මහලු ඇන්ටන්ට ප්‍රහේලිකාවකි. ඔහු බොබ් ළඟම ළත වුණේය.

ඔහු එකම වචනය මුමුණන්නට විය.

"හිතන්න.... හිතන්න...."

අවසානයේ ඔහු සුසුමක් හෙළමින් ඉවතට හැරුණේය. බොබ් ඇසිපිය සැලීය. ඔහු ඇන්ටන්ගේ බන්ධනයෙන් මිදී තිබුණි.

මහලු ඇන්ටන් ස්ටෙෆාන් ආදිපාදතුමාට හිස නමා ආචාර කළේය.

"පළවෙනි ළමයා රිදී මකුළුවා දැකලවත් නැහැ. මහත ළමයා ඒක දැකලා තියෙනවා. ඒත් ඒක එයා අල්ලලා නැහැ. එයා දන්නෙ නැහැ ඒක කොහේද තියෙන්නෙ කියලා. පොඩි එක්කෙනා රිදී මකුළුවා අතේ තියාගෙන ඉඳලා තියෙනවා....."

"ඔව්, ඔව්... කියාගෙන යන්න..." ආදිපාදවරයා වඩාත් උනන්දු විය.

"වලාකුළක් ආවා එයාගේ සිතිවිලිවලට. රිදී මකුළුවත් ඒ වලාකුළේ නොපෙනී ගියා. මට මීට ඉස්සරලා මේ වගේ දෙයක්



හම්බ වෙලා නැහැ. එයා දන්නවා රිදී මකුළුවා කොහාටද ගියේ කියලා. නමුත් හිතේ එතැන හිස්තැනක් තියෙනවා. ඒ නිසා අමතකයි. ඔහුට මතකය එනතුරු මට කරන්න දෙයක් නැහැ."

"තුජ්..., විතරක්...!" ආදිපාදවරයා කෝපයෙන් රත් විය.

"මට කියන්න..." ආදිපාදවරයාගේ හඬ වෙනස් විය.

"ඇන්ටන්, මම ඔයාගේ උත්සාහය අගය කරනවා. උන්ට රිදී මකුළුවා කොහේද කියලා කියන්න බැරි වුණේ ඔයාගේ වරදක් නිසා නෙවෙයි. ඒත් ඔයාට එක එක දේවල් ගැන අනාවැකි කියන්න පුළුවන්නෙ. ඔයාට විශාල බලයක් තියෙනවා. අපි ඔක්කෝමලා ඒක දන්නවා. මොකක්ද මේ මකුළුවා...? මේ...." ඔහු තම ආශාව මැඩ පවත්වා ගන්නට උත්සාහ දැරීය.

"මම කිව්වේ, මගේ අදහස තමයි වෙරෝනාවේ රජකම ලබාගන්න එක. ඒත් මේ මෝඩ කොල්ලො මට ඒකට ඉඩ දුන්නෙ නැහැ."

මහලු ඇන්ටන්ගේ මුවෙහි කපටි සිනාවක් නැඟුණි.

"දැනගන්න ඕනෑ රිදී මකුළුවා ගැනද? නැත්තම් රිදී ගැනද? ඒකා මකුළුවෙක් විතරයි. ඔබේ බලාපොරොත්තුවේ විදිහට මට ඇහෙනවා ජයග්‍රහණයේ සීනු හැඬ වෙනවා. දැන් ඔබට සුබ රාත්‍රියක්. මම වගේ වයසක මිනිස්සුන්ට නින්ද අවශ්‍යයි." ඔහු ඇතුළතින් සිනා වී ආදිපාදවරයාගෙන් සමු ගත්තේය.

ස්ටෙෆාන් ආදිපාදවරයා ඔහුට අත වැනීය.

"මුර භටයෙනි, ඔහු නිවසට ඇරලවන්න." ආදිපාදවරයා මුර භටයින්ට නියෝග කළේය.

ඉන්පසු ඔහු රෝජාස් ආදිපාදවරයා වෙත හැරුණි.

"ඔබට ඇහුණද? රිදී මකුළුවා කියන්නේ මකුළුවෙක් විතරයි. ඒකේ තේරුම අපි රිදී මකුළුවා ගණන් ගන්න ඕනෑ නැහැ. ඒකේ වැදගත්කමක් නැහැ. ඇන්ටන් කිව්වා මම ජයග්‍රහණය කරනවා කියලා. මම තවත් බලාගෙන ඉන්නෙ නැහැ. මම දන්නවා ඇන්ටන් කිව්ව දෙයක් කවදාවත් වැරදිලා නැහැ. හෙට උදේම ඩිජාරෝ කුමරු අත් අඩංගුවට ගන්නත්, මගේ අනුරාජ පදවිය බාරගන්නත් දැන්වීමක්



Scanned with CamScanner

sinhalaebooks.com

ප්‍රකාශයට පත් කරනවා. ඇමෙරිකාව අපේ කටයුතුවලට ඇඟිලි ගහන්න හදනවා. ඒ නිසා අපි ප්‍රකාශයට පත් කරන්න ඕනෑ එයාලගේ ඔත්තුකාරයෝ වගේම හොරු දෙන්නෙක් අපි අත් අඩංගුවට ගත්තා කියලා. තුන්වැනි දේ තමයි ඇඩොල්ෆ් පවුලේ ඔක්කෝම එකතු කරලා ඔවුන්ට විරුද්ධව නඩුවක් දමන්න ඕනෑ, රාජ්‍ය ද්‍රෝහී වීමේ වැරැද්දට."

"හෙට උදේ ස්ථිරවම මම වෙරෝනාව මගේ බාරයට ගන්නවා. ඉන්පස්සේ අපි තීරණය කරනවා ප්‍රසිද්ධ නඩු විභාගයකදී මේ දඟකාර කොල්ලන්ට මොකද කරන්නෙ කියලා. නැතිනම් රටෙන් පිටුවහල් කරනවා."

"මුර භටයෙනි, මුන් ආපසු සිරකුටියට අරන් යන්න. එහිදී උන්ට භාවනා කරන්න දෙන්න." එසේ කියමින් ඔහු බොබ් වෙත නැඹුරු විය.

"පුංචි මී පැටියෝ, ඒ අතරතුරේ උත්සාහ කරලා බලපන් උඹ රිදී මකුළුවට මොනවද කළේ කියලා. ඇන්ටන් අර විදිහට කිව්වත්, මම කැමතියි මම වෙරෝනාවේ රජ වුණාම ඒ රිදී මකුළුවා මගේ කරේ පලඳින්න. ඒ නිසා ඒක මට ආපහු දෙන එක වඩා හොඳයි. දැන් මෙයාලව අරන් යන්න."



# 12

# කානුවේ කුණාටුව

ජුපිටර්, බොබ්, රූඩි පිරිවරා ගත් මුර සෙබළු දෙදෙනා ඔවුන්ගේ පිටුපසින් සහ ඉදිරියෙන් ගමන් කරන්නට වූහ. රූඩි පා ඔසවා ගල් පඩි පෙළේ තදින් වැදෙන්නට සැලැස්විය. ඔහුට පිටුපසින් ආ මුරභටයා ඔහුට ළංවී යමක් කොඳුළේය.

"යාළු මීයෝ දෙන්නෙක් ඉන්නවා කානුවේ."

රූඩි හිස සැලිය.

ටික වේලාවකට පසු ගලින් නිම කරන ලද කුඩා අඳුරු පොළොව යට සිර මැදිරියකට ඔවුන් දමා යකඩ දොර වසා දැමීය. එහි දුබල ආලෝකයක් සහිත ඉටිපන්දමක් දැල්වෙමින් තිබුණි. ළමුන් එහි තනි කර දමා මුර සෙබළු දෙදෙනා පිටව ගියහ.

ඔවුහු මිනිත්තු කිහිපයක් නිහඬව සිටියෝය. බොබ්ට සහ ජුපිටර්ට වතුර වැටෙන ශබ්දයක් ඇසුණි.

"බළකොටුවට යටින් තියෙන ඩෙන්සෝ ඇළ මාර්ගයේ කුණාටුවක්. එළියට හයියෙන් වහිනවා ඇති. ඒ වතුර කානුවලට වැටෙනවා. ඩෙන්සෝ ඇළ මාර්ගයේ කුණාටු ඇති වුණේ අවුරුදු සිය ගණනකට ඉස්සර. ඒ කාලේ කානුවලට බට ආලා තිබ්බෙ නැහැ. සාමාන්‍ය කානුවක් ගැන හිතන්න. ඒවා ගල් උමගවල්. ඒවගෙ පතුලේ වට ප්‍රමාණයේ උස සමහර වෙලාවට මිනිසෙකුටත් වඩා විශාලයි. වියළි කාලගුණයකදී මිනිසුන්ට ඒකේ ඇවිදගෙන සැතපුම් ගාණක්



Scanned with CamScanner

sinhalaebooks.com

යන්න පුළුවන්. හොත් කාලගුණයකදී ඒකේ පුංචි බෝට්ටුවකින් යන්න පුළුවන්. මිනිස්සු කිප දෙනෙක් පමණක් ඒ අනතුරුදායක ගමන යනවා. මටයි, එලිනටයි, තව කිප දෙනෙකුටයි ඒ ගමන යන්න පුළුවන්. වතුර එච්චර ගැඹුර නැහැ. අපිට ඒක යටින් ආරක්ෂාකාරිව යන්න පුළුවන්. ඇමෙරිකන් තානාපති කාර්යාලය ළඟින් තියෙන මාර්ගයකට මතු වෙන්න පුළුවන්. එතකොට ඔයාලා ආරක්ෂා සහිතයි."

ජුපිටර් ඒ කරුණ ගැන සිතා බැලීය.

"අපි ඉන්නෙ හිර කුටියක. අපිට කොහේවත් යන්න බැහැ නෙ."

"තව ටික වෙලාවකින් මේ හිර කුටියෙන් අපිට එළියට යන්න පුළුවන් වුණොත්...?" රූඩිගේ සිත සතුටින් පිරී තිබුණි.

"කවුරු හරි කෙනෙක් ඉන්නවා අපට උදව් කරන්න. එක මුරභටයෙක් මට පණිවිඩයක් දුන්නා 'යාළු මී පැටව් දෙන්නෙක් කානුවේ ඉන්නවා' කියලා. ඒකේ තේරුම තමයි අපේ සංවිධානයේ කවුරු හරි අපිට උදවු කරන්න බලාගෙන ඉන්නවා."

"මට හිතෙන්නෙ ජුපිටර්, ඔයා හරි. අපිට මෙහෙන් එළියට යන්න බැහැ ස්ටෙෆාන් ආදිපාදවරයා අපිව එළියට දාන තුරු."

"කවුද අර අභිගුණ්ඩික ඇන්ටන්? මට හිතෙන්නෙ එයාට අපේ හිත් කියවන්න පුළුවන්."

"ඇන්ටන් කියන්නේ අභිගුණ්ඩිකයින්ගේ රජ්ජුරුවෝ. එයා කියනවා එයාට අවුරුදු සියක් වයසයිලු. ඒ වගේම එයා ළඟ අමුතු බලයක් තියෙනවා අනෙක් අයට තේරුම් ගන්න බැරි. ඇත්තෙන්ම එයාට අපේ සිතිවිලි ගැන අවබෝධයක් තියෙනවා. එයා දන්නවා රිදී මකුළුවගෙ ඇත්ත. ඒත් මට දුකයි. එයා කිව්වා ස්ටෙෆාන්ගේ ජයග්‍රහණයේ සීනු හැඬවෙනවා ඇහෙනවා කියලා. ඒකේ තේරුම අපේ බලාපොරොත්තු ඉටු වෙන්නෙ නැහැ. මගේ තාත්තා හිර කරනවා. මගේ යාළුවෝ, එලිනයි, මමයි, අපි සේරම...." ඔහු නිහඬ විය.

"අපි කොහොමද ඔයාගෙ හිත හදන්නෙ?" බොබ් ඔහුගේ හැඟීම් තේරුම් ගත්තේය.



"ඒ බලාපොරොත්තුව බිඳ වැටුණොත් ජුපිටර්, ඔයා ළඟ අදහසක් තියෙනවද?"

"මගේ ළඟ අදහසක් නම් තියෙනවා. මෙතනින් එළියට යන්න නම්, ඉස්සරලම අපි මුරභටයො ලවා දොර අරවා ගන්න ඕනෑ. ඉන්පස්සෙ අපි එයාලව යටත් කර ගන්න ඕනෑ."

"යටත් කර ගන්න.... ලොකු මිනිස්සු දෙන්නෙක්...?" රූඩි පුදුමයෙන් ඇසීය.

"ආයුධ නැතුව අපිට ඒක කරන්න බැහැ."

"මට දෙයක් මතක් වුණා." ජුපිටර් නළල රැළි ගැන්විය.

"ඇත්තම කියනවා නම් ඒක කතාවක්. අපට ඕනෑ නම් ඒක කරන්න පුළුවන්. ඒක අපට සෙබස්තියන් මහත්තයා දීපු රහස් පරීක්ෂක කතාවක්."

"ඉතින් මොකද්ද ඔයාගෙ අදහස ජුපිටර්?" බොබ් මහත් නොඉවසිල්ලෙන් ඇසීය.

"කතාවෙ අන්තිමට ගැහැනු ළමයෙකුයි, පිරිමි ළමයෙකුයි කාමරයකට දාලා යතුර දානවා. හරියට මේ අපි වගේ. එයාලා එයාලගෙ ඇඳ ඇතිරිල්ල ඉරලා ලණුවක් හදනවා. ඉන්පස්සෙ ඒ ලණුවෙ දෙපැත්තටම තොණ්ඩු දෙකක් දමනවා. ඔවුන් කාමරය ඇතුළට ආවාම එයාලා සිරකාරයෝ කර ගන්නවා."

ජුපිටර් ඔවුන් කළ උපක්‍රමය විස්තර කරන්නට විය. රූඩි එයට ඉතා උනන්දුවෙන් සවන් දුන්නේය.

"ඒක හරි. ඒත් ලණුවක් විදිහට අපි මොකද්ද පාවිච්චි කරන්නෙ?"

"මේ ඇඳේ තියෙන්නෙ ඇඳ ඇතිරිලි. ඒවා ගොඩාක් පරණයි. ඒවගෙ අග හරිය කඩමාලු වෙලා. අපිට පුළුවන් මේවා තීරු විදිහට ඉරන්න. ඒකත් ලණුව ඇඹරුවා වගේ ශක්තිමත් වේවි. අපිට පුළුවන් ඒ තීරු ලණුවක් විදිහට පාවිච්චි කරන්න."

"අපිට ඒක කරන්න පුළුවන්. එක මුරකාරයෙක් මගෙත් එක්ක හිතවත්. එයා අපිත් එක්ක බොරුවට පොර බදයි. අපි අනිත් එක්කෙනාව



Scanned with CamScanner

sinhalaebooks.com

අල්ලා ගත්තොත් හරි...." රූඩි කිවේය.

ඉක්මනින්ම ඔවුහු එම කාර්යය පටන් ගත්හ.

ඔවුහු එම ඇඳ ඇතිරිලි කුඩා තීරුවලට ඉරන්නට වූහ. වාසනාවකට මෙන් ජුපිටර් ළඟ පිහියක් තිබුණි. ඒවා පරණ නිසා ඉරීම ලේසි විය. ඔවුහු ඉතා හෙමින් සීරුවේ ඒවා ඉරන්නට වූයේ එහි ශබ්දය පිටතට ඇසෙන බැවිනි. ඔවුහු එක තීරුවක් අඟල් හතරක් පමණ පළලට ඉරුවෝය. ඇතැම් විට ඒවා ඉරන්නට දත් ද ප්‍රයෝජනයට ගත්හ. ඔවුන් එම කාර්යය ඉතා සෙමින් කළ නිසා මහත් වෙහෙසකාරී බවක් ගෙන දුනි. නමුත් ඔවුන් උත්සාහය අත්හලේ නැත. ඔවුන් ළඟ දැන් තීරු හතරක් තිබේ. ටික වේලාවකට පසු එය අටක් විය.

ඔවුහු තිදෙනා මඳ වේලාවක් ඇඳන්වල වැතිරී සිටියෝය. ඔවුනට දිගු විවේකයක් අවශ්‍ය විය. නමුත් ඉක්මනින්ම නැවතත් වැඩ පටන් ගත්හ. ජුපිටර් ඉරන ලද රෙදි තීරු දෙකක් ගෙන තදින් එකට ගැට ගැසුවේය. ඔහු එහි කොන් දෙකට ලිස්සා යන ගැට දෙකක් ඇමුවේය. ඔහු එය අත්හදා බැලීමට රූඩිගේ අත්වලට සහ කකුල්වලට ඇම්මේය. රූඩි එක්වරම කැලඹිල්ලටත්, විස්මයටත් පත් විය.

"දෙයියනේ ඒක හොඳට වැඩ කරනවා." රූඩි මිමිණුවේය.

"මේ ඇති මුරකාරයන්ට." ජුපිටර් කිවේය.

"අපි ඉරාපු ඉතිරි රෙදි පටි ටිකත් අරගෙන යමු. ඕනෑ වුණොත් ගන්න පුළුවන් නෙ." රූඩි යෝජනා කළේය.

ඔවුහු තීරු අටකට වඩා ඉරා එය එකට ගැට ගසා දිගු ලණුවක් සෑදූහ. ඉන්පසු එය රූඩිගේ ඉණ වටා ඔතා ගත්තේය.

"දැන් තමයි අමාරුම කොටස." ජුපිටර් කිවේය.

බොබ් ඇඳෙහි වැතිර හඬන්නට පටන් ගත්තේය. මුලින් හෙමින් පටන් ගත් කෙඳිරිය පසුව වැඩි වන්නට විය. රූඩි ඉක්මනින්ම තොණ්ඩු දෙකක් දොර ළඟින් බිම තැබීය. කවුරුන් හෝ කාමරයට ඇතුළු වූ විට පා තබන්නේ එයටය. සියල්ල සූදානම් කළ පසු බොබ් නැවතත් කෙඳිරි ගාන්නට පටන් ගත්තේය. ඔහු කෙඳිරි ගෑමේ වේගය ක්‍රමයෙන්



වැඩි කළේය. ඇත්තෙන්ම එය වේදනාබර කෙඳිරියකි. ටික වේලාවකට පසු මුර සෙබලෙක් දොර ළඟට පැමිණ උඩින් වූ පුංචි කවුළුව විවර කර, 'නිහඬ වෙයල්ලා. ඔය ශබ්දෙ නවත්තපල්ලා.' යැයි කීවේය.

රූඩි දොර ළඟ සිට ගත්තේය. ඒ අතරේ ජුපිටර් එක් අතකින් ඉටිපන්දම ගෙන බොබ් වෙත නැමී සිටියේය.

"එයාට අමාරුයි. එයාව අල්ලා ගන්න වෙලාවෙ ඔළුව වැදුණා. දැන් එයාට උණ ගැනිලා. එයාට දොස්තර කෙනෙක් ඕනෑ." රූඩි කිවේය.

"මේක උපායක්.... උඹලා බොරුවක් කරන්නෙ."

"මම කිව්වෙ එයාට අසනීපයි. ඇවිල්ලා එයාගෙ නළල අල්ලලා බලන්න. ඉන්පස්සෙ එයාව දොස්තර ළඟට එක්ක යන්න. අපි කියන විදිහට කළොත් අපි කියන්නම් රිදී මකුළුවා කොහෙද ඉන්නෙ කියලා. ස්ටෙෆාන් ආදිපාදතුමාත් සතුටු වේවි."

මුරභටයා කුතුහලයෙන් බලා සිටියේය.

"ඔයා දන්නවද, ආදිපාදතුමා කැමති නැහැ ඇමෙරිකාවේ අයට රිදවන්න."

"පොඩි එකාව දොස්තර ළඟට ගෙනියන්න ඕනැලු. එහෙම කළොත් එයාලා ආපහු රිදී මකුළුවා දෙනවලු. ඒ ළමයගෙ තත්ත්වය බරපතළයිලු. අපි ඉක්මන් කරලා මොනවා හරි කරන්න බලමු." එක මුර සෙබලෙක් කීය.

"වැඩියෙන්ම හොඳයි අපි මේක ඇත්තද කියලා බලන එක." දෙවන මුර සෙබලා යෝජනා කළේය.

"අපි කැමති නැහැ, මේ වෙලාවේ ආදිපාදතුමාට කරදර කරන්න. ඔයා ගිහින් බලන්න ඒ ළමයට ඇත්තටම අසනීපද කියලා. එතකල් මම දොර ළඟ ඉන්නම්. එයාලා තාම ළමයි. අපිට බය වෙන්න දෙයක් නැහැ."

ඔහුගේ කතාවේ අර්ථය රූඩි තේරුම් ගත්තේය.

"හොඳයි, මම ගිහින් බලන්නම්. එයාට උණ ද කියලා. නමුත්



Scanned with CamScanner

sinhalaebooks.com

ඒක බොරුවක් නම් එයාලට කනගාටු වෙන්න වෙයි."

යකඩ දොරටුව විවෘත විය. මුර සෙබලා සිර කුටියට ඇතුළු විය. ඔහු ඇතුළට පා තබත්ම ඔහුගේ පා යුග පිළිගන්නට ඔවුන්ගේ තොණ්ඩුව බලා සිටියේය. එක්වරම රූඩි තදින් ඇද්ද විට ලණුව තද වී මුර සෙබලා පොළොව මත ඇද වැටුණි. ඔහුගේ විදුලි ලාම්පුව විසි වී ගියේය. ජුපිටර් අනෙක් තොණ්ඩුව ගෙන හිසට විසි කළේය. රූඩි ඔහුගේ එහාට මෙහාට වීසි කරන අත්වලට ද තොණ්ඩුවක් දැම්මේය.

"උදව් කරන්න.... මට උදව් කරන්න.... මේ යක්ෂ කොල්ලෝ මාව අල්ලා ගත්තා...."

එසැනින්ම දෙවන මුර භටයා ද සිර කුටිය තුළට කඩා පැන්නේය. රූඩි ඔහු බලාපොරොත්තුවෙන් සිටියේය. එක් තොණ්ඩුවක් ඔහුගේ බෙල්ල වටා යැවුණි. අනෙක් තොණ්ඩුව ඔහුගේ කකුල් දෙක තද කළේය. අනෙක් තොණ්ඩුවලින් දෙදෙනා එකට තබා බැඳ දැම්මෝය.

පළමු මුර සෙබලා පයින් ගසන්නටත්, දඟලන්නටත් පටන් ගත්තේය. ඔහු දඟලමින් දෙවන මුරභටයාගේ සිරුර උඩ ඇද වැටුණි. රූඩි පහත් වී ඔහුගේ කනට යමක් මිමිණුවේය.

"දඟලන්න.... දිගටම දඟලන්න..... නතර කරන්න එපා."

මුරභටයා කීකරු විය. ඔවුන් දෙදෙනා දඟලද්දී ඔවුන්ගේ තොණ්ඩු තව තවත් තද විය. ඔවුන්ට එයින් නිදහස් වීමට නම් නොහැකි විය. ඔවුන් දෙදෙනා මකුළු දැලකට හසු වූ කෘමීන් දෙදෙනෙකු මෙන් තව තවත් දඟලන්නට විය.

රූඩිගේ සිත නැවතත් ධෛර්යයෙන් පිරුණි. ඔහු නැවතත් බලාපොරොත්තු ඇති කර ගත්තේය.

"දැන් ඉක්මන් කරමු. අනිත් මුරකාරයෝ කොරිඩෝවෙ ඉන්න පුළුවන්. අපි පුළුවන් තරම් ඉක්මනට යමු. ජුපිටර්, අර ලාම්පුව අරගෙන මගේ පස්සෙන් එන්න."

රූඩි දැනටමත් කොරිඩෝව දිගේ පහළට බසිමින් සිටියි. ඔවුන් ගමන් කළේ පොළොව යට තිබෙන සිර කුටි වෙතය. බොබ් සහ ජුපිටර් ඔහු පසුපසින් ගමන් කළෝය. ඔවුන් දුවන්නට වූ බැවින්



ඔවුන්ගේ විදුලි ලාම්පුවෙහි එළිය සැලෙන්නට විය.

ඔවුහු පඩි පෙළක් වෙත ළඟා වූහ. ඔවුහු දිවීම නතර කළෝය. රූඩි නැමී පොළොව මතුපිට තිබූ ලොකු යකඩ වළල්ලෙන් අදින්නට විය. එය කානුවක විවරයක් ආවරණය කළ මලකඩ කෑ ආවරණයකි.

"මේක අදින්න ඕනෑ, මලකඩ කාලා. ඒක ටිකක්වත් හොල්ලන්න බැහැ." රූඩි හති ඇරියේය.

"ඉක්මන් කරන්න. අර මිනිස්සු අපේ පස්සෙන් එන්න පුළුවන්. අපේ අර ලණුව වළල්ලට දාලා අපි ඔක්කෝම එකට අදිමු." ජුපිටර් යෝජනා කළේය.

"ඔව්, ඇත්තමයි...."

රූඩි තම ඉණ වටේ බැඳි රෙදිවලින් සෑදූ ලණුව අතට ගත්තේය. ඔහු එය යකඩ වළල්ලට දමා ගැට ගැසීය. තිදෙනාම එකතු වී ලණුවෙන් අදින්නට වූහ. පළමුවෙන්ම ආවරණය ටිකක්වත් සෙලවීමට නොහැකි විය. ඒ සමගම ඔවුනට කෑ ගසන ශබ්දයක් සහ පා ගැටෙන ශබ්දයක් පිටුපසින් ඇසුණි. ඒ සමගම ඔවුන් තැති ගත් සිතින් එය වේගයෙන් ඇද්දෝය. එය ගැලවී ඔවුන් පැත්තකට විසි වූහ. ඇතුළෙන් වතුර ගලන හඬ ඇසුණි.

"මම ඉස්සරලම යන්නම්." රූඩි ලණුව ලිහා ගත්තේය.

"අපි ඔක්කෝම එකට ලණුව අල්ලාගෙන යමු. අපිට ආයේ මේක වහන්න නම් බැහැ."

රූඩි පහළට තම කකුල් දැම්මේය. විදුලි ලාම්පුවේ හැඬලය කටින් හපාගෙන අත් දෙකෙන් ලණුව අල්ලාගෙන රූඩි වතුරට බැස්සේය. බොබ් ඔහු අනුගමනය කළේය. පතුලක් නොපෙනෙන අඳුරු කළුවර දෙස බැලීමෙන් හෝ වතුරේ හඬට සවන් දීමෙන් හෝ බියක් උපදවා ගන්නට ඔහුට වේලාවක් නොතිබුණි.

අවසානයේ ජුපිටර් ඇද වැටුණේ අඩි හයක් පමණ උසකිනි. නමුත් ඔහුට තුවාල වූයේ නැත. එහි වතුර තිබුණේ දණහිස තෙක් පමණි.



Scanned with CamScanner

sinhalaebooks.com

"මෙහෙත් එන්න ජුපිටර්...."

ඔහු රූඩි අල්ලා ගන්නටත් පෙර සමබරතාවය ගිලිහී විසි වී ගොස් වතුරේ ඉන්ද වූණේය. රූඩි ඔහුගේ උරහිසෙන් අල්ලා ඇතාගන්නට ඔහු සම්පූර්ණයෙන්ම ගිලෙන්නට තිබුණි.

"හරි සීතලයි..."

"දැන් වැහැපු වතුර. අපි කල් තියා ආවා නම් අපිත් වැස්සට අහු වෙනවා. එන්න, මගේ පස්සෙන්. ඔක්කෝමලා මේ ලණුව අල්ලා ගන්න. මේ වතුර ගඟ ඉදිරියටයි ගලන්නෙ. අපි යන්න ඕනෑ යකඩ පොලු හම්බවෙන තුරු. නැතුව අපිට ගඟ ඉහළට යන්න බැහැ."

කෝපයෙන් කෑ ගසන හඬ දෝංකාර දුන් අතර විදුලි පන්දම් එළිය ඔවුන් දෙසට එල්ල වුණි. ඔවුහු සුළි කැරකෙන වතුරේ ඉක්මනින් යන්නට වූහ. කට හඬවල් සහ එළිය ඔවුන් පසුපසින් ආවේය.

ඉක්මනින්ම ඔවුනට විශාල නළයක් හමු වූ අතර ඔවුන් ඒ උඩ සිට ගත්හ. වතුර පහර තදින් වදින නිසා තිදෙනාම ලණුව අල්ලාගෙන සිටියෝය.

"මුර සෙබළු අපේ පස්සෙන් එනවා...." රූඩි කෑ ගැසීය.

"එයාලා එන්නෙ ස්ටෙෆාන්ට බයේ. ඒත් එයාලා දන්නෙ නැහැ, මෙ කානු ගැන. අපි ටිකක් ඉහළට ගිහිල්ලා මිනිත්තුවක් විවේක ගමු."

දැන් පෙනෙන විදිහට නම් ජලය ගැඹුරුය. ඔවුන් එය පසු කරමින් දිය ඇල්ලක් මෙන් පෙනෙන තැනකට ආවෝය. ඔවුන් සම්පූර්ණයෙන්ම තෙමී ගොසිනි.

ඔවුන් අමාරුවෙන් දියේ ඇවිද යන්නට වූහ. සාමාන්‍ය කුඩා ප්‍රමාණයේ දිය ඇල්ලක් තුළින් ඔවුන්ගේ ගමන නිමා වූයේ හතර අතට විහිදී යන උමං මාර්ග මැදි කර තැනූ විශාල කුටියකිනි. රූඩි එහි නතර වී විදුලි එළිය වටේට විහිදුවේය. කුටියේ එක් පසෙක යකඩ ඉණිමඟක් ගලට ගොඩවීම සඳහා තබා තිබෙනු දුටුවෝය.

"අපිට මෙතනින් යන්න පුළුවන්. මෙතනින් මාලිගාවට ගොඩාක්ම ළඟයි. මට විශ්වාසයි මිනිත්තු කීපයකට ඉස්සරවෙලා කවුරු හරි මුර සෙබළු ආව නම් අපිව අල්ලා ගන්න තිබුණා. එයාලා



කොච්චර ඉක්මන් කළත් එයාලට ඒ කානුව දිගේ එන්න බැහැ. ඔයාලට මාව විශ්වාසද?"

ඔවුහු කුටියේ වැතිර මඳක් ගිමන් නිවන්නට වූහ.

"දෙවියනේ, හරි පුදුමයි.... අපි ඒක කළා. කොහොම වුණත් අපි ගොඩක් දුර ඇවිල්ලා. අපි කොහේද දැන් මේ ඉන්නෙ?" බොබ් සතුටෙන් ඇසීය.



Scanned with CamScanner

sinhalaebooks.com

# 13

## අඳුරේ දිගු ගමනක්

"නැගිට්ටිමු. අපි දැන් මේ ඉණිමඟ දිගේ යමු. මම ඉස්සරලා යන්නම්."

රූඩි අමාරුවෙන් ලිස්සන යකඩ ඉණිමඟ දිගේ නගින්නට විය. බොබ් සහ ජුපිටර් ඔහු අනුගමනය කළෝය. ඔවුහු විදුලි ලාම්පු නිවා දමා කළුවරේම නගින්නට වූහ. රූඩි මුදුනට ළඟා වූ පසු අත් දෙකෙන්ම උඩ ඇති යකඩ ආවරණය තල්ලු කළේය. හෙමින් එය විවර වුණි. විවරය තුළින් හිස දමා ඔහු හොඳින් වටපිට බැලීය. ඔහු බලාපොරොත්තු කඩ වූ හඬින් කෑ ගැසීය. ඉන්පසු යකඩ ආවරණය නැවතත් වසා දැමීය.

"මුර සංචාරේ ආපු සෙබළ වගයක් දකුණු පැත්තෙ ඉන්නවා. ටිකක් ඉමු." රූඩි මිමිණුවේය.

"ටික වේලාවකින් අපි ආයේ උඩට නගිමු."

"අපිට මෙහෙම හැංගිලා ඉන්න පුළුවන්නෙ."

"එයාලට යන්න කියලා යාච්ඤා කරමු." රූඩි සුසුමක් පිට කළේය.

වතුර දිගේ එළියක් දිව යනු පෙනිණ. එසැනින් ඔවුන් එදෙස එබී බැලූහ.

අතින් පදින පොඩි බෝට්ටුවක මිනිසෙක් හබල් ගාමින් සිටි අතර ගැහැනු ළමයෙක් එහි හිඳගෙන සිටියාය.



"රූඩි... රූඩි.... ඔයා කොහෙද....?" ඇය කතා කළාය.

"එලිනා.... අපි උඩ. ඔහොම ඉන්න. අපි එනවා...." රූඩි සතුටෙන් කෑ ගැසීය.

බෝට්ටුව නතර වුණි. ඔවුන්ගේ විදුලි පන්දමේ එළියෙන් ළමුන් තිදෙනෙක් අමාරුවෙන් යකඩ ඉණිමඟ දිගේ පහළට බසිනු පෙනුණි.



"පෝල් කුමරුට ස්තුති කරන්න...." එලිනා සතුටෙන් කීවාය.

"අපි ඔයාලව හොයා ගත්තා.... ඔයාලා එයාලගෙන් බේරුණා."

ළමෝ බෝට්ටුවට ගොඩ වූහ. බෝට්ටුවේ සිටි මිනිසා ආපසු බෝට්ටුව හැරවීය.



Scanned with CamScanner

sinhalaebooks.com

"අපිට මුර සෙබලෙක් පණිවිඩයක් දුන්නා 'යාළු මීයෝ කානුවේ න්නවා' කියලා." රූඩි එලිනාට කීවේය.

"අපි පැය ගණනක් බලාගෙන හිටියා. අපි බයේ හිටියේ ඔයාලට එයාලගෙන් බේරිලා එන්න බැරි වෙයි කියලා. රූඩි, මට ගොඩාක් සතුටුයි ආයෙත් ඔයාලා දැකපු එක." එලිනා සතුටු වූවාය.

"අපිටත් සතුටුයි ඔයාලා දැකපු එක." රූඩි සිනාසුනේය.

"මේ මගේ ඥාති සොහොයුරෙක්, ඩිමිත්‍රි." රූඩි තම සගයන්ට ඔරු පදින මිනිසා හඳුන්වා දුන්නේය.

"මොනවද පිට පැත්තෙ තොරතුරු?" රූඩි තම සොහොයුරියගෙන් විචාළේය.

"ඒවා දැන් කතා කර කර ඉන්න වෙලාවක් නැහැ. අපිට පුළුවන්ද මිනිත්තුවක් නතර වෙන්න. උඩ බලන්න."

"එයාලා කානුවේ ආවරණය ගලවලා..." ඩිමිත්‍රි කෑ ගැසීය.

"එයාලා අපි එනතුරු බලාගෙන ඉන්නවා. අපි ඒක තල්ලු කරමු."

ඩිමිත්‍රි හබල ආධාරයෙන් කානුවේ ආවරණය තදින් තල්ලු කළේය. ඔවුහු ඉහළ බලද්දී මුර සෙබළු කානුව දිගේ පහළට බසිමින් සිටියෝය. ඔවුන්ගෙන් එක් අයෙක් කෑ ගසමින් බෝට්ටුව තුළට පනින්නට උත්සාහ කළේය. බෝට්ටුව වේගයෙන් ඉවතට ගත් ඩිමිත්‍රි, එයට කඩා පනින්නට උත්සාහ දැරූ මුර සෙබලාගෙන් බේරා ගත්තේය. නැවතත් ඔවුහු අඳුරු උමගකට ඇතුළු වූහ.

"එයාලා පයින් ඒවි, අපිව අල්ලන්න. ඒ නිසා පරක්කු වේවි."

"මෙතන මංසන්ධියක්. මම මේ මාර්ගය වෙනස් කරනවා." ඩිමිත්‍රි කීවේය.

ඔවුන් ඊළඟට පැමිණියේ විශාල කුටියකටය. විශාල නළ තුනකින් එතැනින් වතුර පිට කළේය. ඩිමිත්‍රි වම් පස උමග දිගේ බෝට්ටුව පදවන්නට විය.

"ඔයාලා ඊයේ උද්‍යානයේදී දැක්ක සංගීත කණ්ඩායමේ ඩිමිත්‍රිත්



හිටියා. එයා මටයි, එලිනටයි වඩා මේ කානු ගැන දන්නවා." රූඩි තම සගයන්ට කීවේය.

"පීටර් කොහේද?" ජුපිටර් එලිනාගෙන් විමසීය.

"අපි එනතුරු බලාගෙන ඉන්නවා. ඒ ඇරත් එයා එහේ ඉන්න එක හොඳයි. මොකද මට ඕනෑ එයාව ආරක්ෂා කරන්න. එයත් ඔයාලව හම්බවෙන තුරු ඔයාලා බේරාගන්න එක ගැන බලාපොරොත්තු අත් ඇරලා නැහැ."

"අපි මේ කොහෙද ඉන්නෙ ඩිමිත්‍රි? මට බය අපට වැරදුණාද කියලා." රූඩි කුතුහලයෙන් විමසීය.

"අපි මේ අපේ රහස් තැනට යන්නෙ, රවුම් පාරකින්. තව මිනිත්තු පහකින් අපි එතන ඉඳීවි."

ඔවුහු නැවතත් විශාල කුටියකට ඇතුළු වූහ. එතැනදී කානු කිහිපයක් එකට එකතු වේ. එම කානුව විශාල එකක් විය. එතැන ඔවුනට සිටගෙන සිටින්නට පවා හැකිය. හදිසියේම එළියක් ඔවුන් වෙත එල්ල විය.

"කවුරු හරි උඩ ඉන්නවා." බොබ් මිමිණුවේය.

"ඒ පීටර් වෙන්න ඕනෑ. මෙතන තමයි අපි එකතු වෙන තැන." එලිනා කීවාය.

විදුලි ලාම්පුවේ එළිය වැඩිවෙත්ම පීටර් හිඳගෙන සිටිනු දක්නට ලැබුණි. ඔහු මහත් නොඉවසිල්ලෙන් ඔවුන් බලාපොරොත්තුව සිටියේය.

"මට හරි සතුටුයි, ඔයාලා හමුවීම ගැන." පීටර් සතුටු විය.

"මම මෙහෙ තනියම හිටියේ, හරිම බයෙන්."

"මේක හදලා තියෙන්නෙ ස්වාභාවික පොළොව යට තිබූ ගුහාවක. අපි මේක හොයාගත්තෙ අවුරුදු ගාණකට ඉස්සර. අපේ රහස් සමාගමක් තිබුණා මේ කානු හොයා ගන්න. අපේ තාත්තා ඒ වැඩේ නතර කරන තුරුම අපි ඒවා-හෙව්වා. අපි කවදාවත් හිතුවෙ නැහැ, අපි පොඩි කාලේ කරපු ඒ සෙල්ලම මෙච්චර ප්‍රයෝජනවත් වෙයි කියලා." රූඩි විස්තර කළේය.



Scanned with CamScanner

"දැන් අපි කොහොම හරි මන්ත්‍රණ සභාව අල්ලා ගන්න ඕනෑ. මම හිතන්නෙ නැහැ අපේ ඉස්සරලා සැලැස්ම හරියටම ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි කියලා."

"ඉස්සරලම මට කියන්න, දැන් මොකද වෙලා තියෙන්නෙ? ඩිමිත්‍රි කොහොමද මෙහාට ආවෙ?" රූඩි ප්‍රශ්න කළේය.

"ඔයාගෙ තාත්තව අත් අඩංගුවට ගන්න වෙලාවෙ මම හිටියෙ එහෙ. මම රහස් දොරටුවෙන් පැන ගත්තා. මම හැංගිලා අහගෙන හිටියා. කැප්ටන් ඔයාගේ තාත්තට තර්ජනය කළා. 'අපි උඹේ කැරලිකාර පුතා අල්ලා ගත්තා. උඹලා ඔක්කෝටම විරුද්ධව නඩු පවරනවා' කිව්වා. නමුත් එලිනා ගැන සඳහන් වුණේ නැහැ. මම හිතුවා එයා බේරෙන්න ඇති කියලා. මම දැනගෙන හිටියා ඔයාගෙ සැලැස්ම. මම ඒ හින්දා කුණු කානුවට ආවා. එතනදි මට එලිනා හම්බ වුණා. වැස්ස වහිනවා, වතුර වේගයෙන් ගලනවා. අපි හංගලා තිබුණු තැනින් මම අපේ පරණ බෝට්ටුව ගත්තා."

"මමයි, පීටරුයි අපි සැලසුම් කරපු විදිහටම මාලිගාවේ ඉඳලා මෙහාට ආවා. මෙහෙදි අපිට ඩිමිත්‍රි හම්බ වුණා. ඉන්පස්සෙ අපි ගොඩක් වෙලා බලා හිටියා ඔයාලා බේරිලා එයි කියලා. හොඳයි, දැන් අපි ආයෙමත් එකට. ඉතින් අපි ඉස්සරහට මොනවද කරන්නෙ කියලා කතා කරමු." එලිනා යෝජනා කළාය.

"ඉස්සරලම අපි ගුවන් විදුලිය අහමු. පීටර්, ඔයා ළඟ රේඩියෝ එකක් තියෙනවා නේද?" ඩිමිත්‍රි ඇසීය.

"ඔව්, මේ තියෙන්නෙ." පීටර් තම සාක්කුවෙන් කුඩා ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලියක් එළියට ගත්තේය.

"මම ඒක වහලා දැම්මා. මොකද ඒකෙ කියන ඒවා මට තේරෙන්නෙ නැති නිසා."

ඩිමිත්‍රි එය ගෙන වහා ක්‍රියාත්මක කළේය. එයින් එක දිගටම වචන ගලා එන්නට විය. එය වෙරෝනාවේ භාෂාවය. ඒ යටින් හමුදා සංගීතය ගලා ආවේය. එලිනා ඔවුන්ගේ භාෂාවෙන් කියන දෙය රහස් පරීක්ෂකයන් තිදෙනාට තේරෙන අයුරින් ඉංග්‍රීසි බසට පරිවර්තනය කළාය.



එයින් කියැවෙන ලද්දේ වෙරෝනාවේ සියලුම පුරවැසියන්ගේ දැන ගැනිම පිණිස ගුවන් විදුලියෙන් සහ රූපවාහිනියෙන් උදේ අටට විශේෂ ප්‍රකාශයක් නිකුත් කරන බවයි. එය අගමැතිගේ හඬින් පටිගත කරන ලද්දකි.

"ඒකෙන් අදහස් කරන්නේ උදේ අටට ප්‍රකාශයක් නිකුත් කරන්න යනවා, හෙළි නොවුණු විදේශීය කුමන්ත්‍රණයක් ගැන. ඒ කිව්වේ ඔය තුන් දෙනා ගැන. ඒ අපරාධයට ඩිජාරෝ කුමාරයත් හවුල් කියලා කියන්නයි හදන්නේ. ඉන්පස්සේ ස්ටෙෆාන් ආදිපාදවරයා තව දුරටත් රට පාලනය කරනවා. ඇත්තෙන්ම ඔයාලට නිදහස් වෙලා යන්න දෙන්නෙ නැහැ. එයාලගෙ බලාපොරොත්තුව ඔයාලට විරුද්ධව ප්‍රසිද්ධ නඩුවක් දාන්න. එයාලා ළඟ දැනටමත් සාක්ෂි තියෙනවා. ඔයාලගෙ කැමරා එයාල ළඟ. ඒ වගේම රූඩිගෙ තාත්තා හිරේ යවනවා. හැම දෙයක්ම එයාලට ඕනෑ විදිහට සිද්ධ වෙන්න යන්නේ."

"දෙවියනේ, අපි මෙහෙ ඇවිල්ලා ඩිජාරෝට කළේ ලොකු වැරැද්දක්. මීට වැඩිය හොඳයි අප මෙහෙ නැවිදින් හිටියා නම්." බොබ් කීවේ කනගාටුවෙනි.

"කවුරුවත් දැන් අංජනම් බලන්න ඕනෑ නැහැ. දැන් අපි ඔයාලව ආරක්ෂා සහිතව ඇමෙරිකානු තානාපති කාර්යාලයට අරගෙන යනවා. එහෙම නේද, ඩිමිත්‍රි?" එලිනා ඇසුවාය.

"හරි, එලිනා."

"ඒත් එතකොට ඔයාලට වෙන්නෙ මොනවද? ඔයාලගෙ තාත්තා...? ඩිජාරෝ...?" ජුපිටර් විමසීය.

"ඒක පස්සෙ බලා ගමු." එලිනා සුසුමක් හෙළුවාය.

"මට බය, එයාලගෙ සැලැස්ම අපි වෙනුවෙන් හරියටම ක්‍රියාත්මක වේවිද කියලා. අපිට පුළුවන් වුණොත් ඩිජාරෝව බේරා ගන්න. අපි ඩෙන්සෝවල මිනිස්සු නැගිටවලා ගත්තොත් හරිම භයානකයි. එහෙම වුණොත් මේ කුමන්ත්‍රණය පරද්දන්න අපිට පුළුවන්."

"ඔව්, ඒක හරි." ඩිමිත්‍රි එකඟ විය.



Scanned with CamScanner

"අපි ඔයාලව ආරක්ෂා කරනවා. ඊට පස්සේ අපිට පුළුවන් අපි ගැන බලන්න. අපේ බලාපොරොත්තු නැති වුණා. ඒ නිසා අපි දැන්ම පටන් ගමු. එයාලා කියපු වෙලාවට අගමැතිගේ ප්‍රකාශය විසුරුවා හරියි. ඒ වෙනකොට අපි කැමතියි ඔයාලා ඇමෙරිකන් තානාපති කාර්යාලයේ ඉන්නවා නම්."

"දැන් එන්න මගේ පස්සෙන්. මෙතන ඉඳලා අපි පයින් යමු."

එකිනෙකා පිටුපස එකිනෙකා ජලයේ ගමන් කරන්නට වූහ. ඔවුන්ගේ හදවත් නවත් බරකින් පෙළෙමින් තිබුණි.



# 14

# ජුපිටර්ගෙන් අදහසක්

වැස්ස පායා තිබුණි. ජලය කානු දිගේ සෙමින් ගලා ගියේය. ඔවුන්ගේ වළලුකර තෙක් පමණක් ජලය තිබූ නිසා ගමන් කිරීම පහසු විය. ඔවුන් බොහෝ කානු, කුටි, පසු කළ අතර ඩිමිත්‍රි මාර්ගය හොඳින් දැන සිටි නිසා බිය වීමට කරුණක් නොවීය.

"අපි දැන් මෙහෙම ගිහිල්ලා එළියට එන තැන හමුදා මුරපොළක් තියෙනවා. එතැන මුර සෙබළු නැති වෙන්න කියලා යාච්ඤා කරන්න." ඩිමිත්‍රි කිවේය.

"මට හිතෙනවා, අපි එළියට යද්දී මී පැටව් වගේ අපිව මුර සෙබළු අල්ලා ගනියි කියලා. කරන්න දෙයක් නැහැ, මොනවා වුණත් අපිට යන්නම වෙනවා. අපි දැන් ඉන්නෙ මල් වෙළඳ පොළට යටින්. පැත්තකින් තියෙන්නෙ ඩොමිනික් දේවස්ථානය. එයාලා අපිව දකින එකක් නැහැ. අපිට පුළුවන් වෙයි ඇමෙරිකන් තානාපති කාර්යාලයට යන්න."

"මට හිතෙනවා ඔයා හරි කියලා ඩිමිත්‍රි. අපිට මෙතන නතර වෙලා ඉන්න බැහැ. අපි ඉහළට නගිමු." රූඩි කිවේය.

යකඩ හිණි පෙළ දිගේ පළමුවෙන්ම ඩිමිත්‍රි නගින්නට විය. ඔහු කානුවේ ආවරණය අතින් තල්ලු කර නිරාවරණය කළේය.

"ඉක්මනට උඩට එන්න.... මම අත දෙන්නම්." ඩිමිත්‍රි කෑ ගැහුවේය.

පළමුවෙන්ම ඩිමිත්‍රිගේ ශක්තිමත් ඇතින් එලීනා ඉහළට ඇද

sinhalaebooks.com

ගත්තේය. ඊළඟට බොබ්ට වාරය හිමි විය. බොබ් ඇසිපිය සලා නුපුරුදු උදෑසන හිරුඑළියට දෙනෙත් විවර කළේය. එය වලාකුළු සහිත දිනයකි. පාරවල් රාත්‍රියේ වැස්සට තෙමී දිලිසෙමින් තිබුණි. පටු පාර දිගේ ඉහළට එසවුණු පැරණි ගෙවල් දෙපසෙහිම විය. දෙපස වූ කඩ විකුණුම්කරුවෝ දීප්තිමත් මල් සහ පලතුරු වෙළඳාම සඳහා පිළිවෙළට අසුරමින් සිටිති. ඔවුහු තෙමුණු ඇඳුම් පිටින්ම කානුවෙන් එළියට ආහ.

රූඩි සහ ඩිමිත්‍රි කානුවේ සිදුර වසා ඇමූහ. ඩිමිත්‍රි පටු පාර දිගේ ගමන් කරන්නට වූයේ දෙපස තිබෙන මල් සල්පිල් ගැන කිසිදු අවධානයකින් තොරවය. ඔහු යාර පනහක් පමණ ගොස් නතර විය. ඔවුනට ඉදිරියෙන් දෙපළක මුර සෙබළුන් සිටිනු දක්නට ලැබුණි.

"ආපහු යමු, හැංගෙමු...." ඩිමිත්‍රි අණ කළේය.

නමුත් ඔවුන් ප්‍රමාද වූවා වැඩිය. මුර සෙබළුන් ඔවුන්ව දැක තිබුණි. ඔවුන්ගේ තෙත ඇඳුම් ඔවුන් කවුරුන් දැයි කියන්නට සාක්ෂි ඉතිරි කර තිබුණි. මුර සෙබළු කෑ ගසමින් ඔවුන් පසුපස එළවන්නට වූහ.

"යටත් වෙනු...." ඔවුහු මොර දුන්හ.

"රජ්ජුරුවන්ගෙ නාමයෙන් අපි උඹලව අත් අඩංගුවට ගන්නවා."

"ඉස්සරලම මාව අල්ලා ගනිල්ලා...." ඩිමිත්‍රි එඩිතරව කෑ ගැසීය.

"මාව අල්ලපන්; අපි පල්ලියට යනවා. එහෙදි උඹලට පුළුවන් වෙයි, අපිව අල්ලන්න...." ඩිමිත්‍රි එසේ කෑ ගසමින් දුවන්නට විය.

සියල්ලෝම ඔහු පසුපසින් දුවන්නට වූහ. ඔවුන් පිටුපසින් මුර සෙබළු ද එළවන්නට වූහ. දෙපස වූ සල්පිල්වල වෙළෙන්දෝ එය බලන්නට පාරට එක්රොක් වූහ.

"පැත්තකට වෙනවා.... පැත්තකට වෙනවා...." මුර සෙබළු කෑ ගසමින් පාරේ වූ මිනිසුන් එහාට මෙහාට තල්ලු කරන්නට වූහ.

සියලුම පැරණි ගෙවල් අභිබවා ඉහළට නැගුණු සෙන්ට් ඩොමිනික් දේවස්ථානයේ රන් කොත බොබ්ගේ නෙත ගැටුණි. 'පල්ලිය අපිට හැංගෙන්න කොච්චර හොඳ තැනක්ද?' ඔහුට සිතුණි. නමුත්



මේ වන විට ඩිමිත්‍රිගේ සිතේ යම් සැලැස්මක් තිබිය හැකිය. ඇරත් මෙය ප්‍රශ්න අසන්නට වෙලාවක් ද නොවේ.

ඔවුන් පසුපසින් ආ එක් මුරභටයෙක් ලිස්සා බිම ඇද වැටුණි. පසුපසින් ආ සෙබළු කිහිප දෙනෙක්ම පය පැකිලී එක ගොඩේ ඇද වැටුණහ. ඇත්තෙන්ම ඔවුන් බිම වැටුණේ බොරුවට ද නැතිනම් අනතුරක් සිදුවී දැයි කියන්නට බැරිය. සමහර විට ඔවුන් ඔවුනට උදව් කරන හිතවතුන් ද විය හැකිය.

ඔවුනට ඉදිරියෙන් දේවස්ථානය දිස් වන්නට විය. ඔවුන් යන මාර්ගයේ මුර සෙබළු රැඳී සිටියහ.

පෙනෙන විදිහට නම් ඔවුනට දේවස්ථානයට ඇතුළු විය නොහැකිය. නමුත් ඩිමිත්‍රි ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වන්නට ගියේ නැත. ඔවුහු වීදියේ පසෙකින් වූ කුඩා දොරටුවකින් ඇතුළු වූහ. ඔවුහු වේගයෙන් පල්ලිය ඇතුළට දිව ආහ.

පල්ලිය තුළදී බොබ්ගේ සිතිවිලි පාවී යන්නට විය. හතරැස් කාමරයේ සිවිලිමක් නොවීය. ඒ නිසා ඔහුට ඉහළ බැලිය හැකිය. එක් පසෙකින් හිණි පෙළක් විය. හිණි පෙළ දිගේ යකඩ ගරාදි වැටක් යොදා තිබුණි. ඉහළ සිට පහළට ලොකු කඹ අටක් එල්ලා වැටෙමින් තිබූ අතර එහි අගට යකඩ වළලු සවි කර එය සිමෙන්ති බිත්තියට සවි කර තිබුණි. බොබ්ට තවත් ඒවා හොඳින් නැරඹීමට වේලාවක් නොවිය.

"අපි දැන් සොහොන් ගැබට යමු." යෝජනාව ඩිමිත්‍රිගෙන්ය.

"ඔයාලා දන්නවද සොහොන් ගැබ කියන්නෙ මොකද්ද කියලා? මැරුණු අය පල්ලියේ වළ දැම්මා. ඉස්සර කාලේ මිනිස්සු, මිනී වළ දාලා තියෙන්නෙ මෙහෙ. අපිට ඒවයෙ හැංගෙන්න පුළුවන්."

"අපි තවත් හැංගෙන එකේ තේරුම මොකක්ද? එයාලා ඉක්මනට හරි, පහුවෙලා හරි අපිව අල්ලා ගන්නවාමයි." ජුපිටර් බලාපොරොත්තු කඩ වූ හඬින් කීවේය.

සියල්ලෝම ඔහු දෙස බැලූහ.

"ඔයා මොනව හරි හිතනවද ජුපිටර්? මට ඒක කියන්න පුළුවන්. මොනවද ඔයා හිතන්නෙ?" පීටර් උනන්දු විය.



Scanned with CamScanner

sinhalaebooks.com

"මේ ලණු...." ජුපිටර් පහළට එල්ලෙමින් තිබූ ලණු පෙන්විය.

"අපි මේ පෝල් කුමරුගෙ සංස්ථාරය නාද කළොත්...?"

"පෝල් කුමරුගෙ සංස්ථාරය...?" රූඩි රවා බැලීය.

"නැහැ, මෙහෙ තියෙන්නෙ සාමාන්‍ය සංස්ථාර විතරයි. පෝල් කුමරුගෙ සංස්ථාරය තියෙන්නෙ අර කුලුනෙ. ඒක හඬවන්න පුළුවන් රාජකීය අවස්ථාවකදි විතරයි."

"ඔව්, ඒත් අපිට ඩිජාරෝ කුමාරයා කිව්වා, අවුරුදු සිය ගණනකට ඉස්සර පෝල් කුමාරයා කැරැල්ලට මැදිහත් වුණු වෙලාවෙ එයා නොමැරුණු බව කියලා එයාට පක්ෂපාතී අය ගෙන්වා ගෙන තියෙන්නේ මේ සීනුව නාද කරලා කියලා."

සියල්ලෝම ඔහු දෙස පුදුමයෙන් බැලූහ. ඩිමිත්‍රි තම කම්මුල් පිරිමදින්නට විය.

"ඔව්, ඕනෑ පොඩි ළමයෙක් දන්නවා ඔය කතාව. ඒක අපේ උරුමයේ කොටසක්. ඒත් ඔයා මොකක්ද ඒ ගැන හිතන්නෙ...?"

"එයා කියන්නෙ, අපි පෝල් කුමරුගෙ සීනුව නාද කළොත් මිනිස්සු ඩිජාරෝ කුමරුගෙ උදව්වට ඒවි කියලා." රූඩි එය තේරුම් ගත්තේය.

"අපි ඒ ගැන හිතුවෙ නැහැ. ඒක සිද්ධ වෙලා ගොඩාක් කල්. දැන් ඔක්කෝමලා හිතන්නෙ පත්තරය, රේඩියෝව, රූපවාහිනිය ගැන. මම හිතන්නෙ දැනටමත් ඒවා...."

"සීනු හැඬවෙන්න පටන් අරගෙන...." එලීනා සිනාසෙන්නට තැත් කළාය.

"මාධ්‍යවලින් වැදගත් ප්‍රවෘත්තිය කිව්වට පස්සෙ, ඩිජාරෝ කුමාරයට ආදරය කරන මිනිස්සු හිතයි එයා කරදරයක වැටිලා ඉන්නවා, ඒ නිසා ඔවුන්ගේ උදව් අවශ්‍යයි කියලා. ඉතින් ජනතාව උදව්වට එකතු වෙන්න පුළුවන්."

"ඒත්...." ඩිමිත්‍රි යමක් කියන්නට උත්සාහ කළේය.



"තවත්..., ඒත්... ඒත්..... කිය කිය ඉන්න වෙලාවක් නැහැ." රූඩි රළු ලෙස කිවේය.

"තව ටිකකින් අර මිනිස්සු දොරට ගහයි ඇවිල්ලා. අපිට ටික වෙලාවයි තියෙන්නෙ."

"හරි... හරි..." ඩිමිත්‍රි කලබල විය.

සැබවින්ම ඒ වන විටත් මුර සෙබළු ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වන්නට වූහ.

"රූඩි, ඔයා මෙයාලත් එක්ක යන්න. ජුපිටර් කියන විදිහට කරන්න. මම එලීනාත් එක්ක අර පැත්තට යනවා. එයාලා අපේ පස්සෙන් ආවොත් ඔයාලගෙ වැඩේ තවත් ලේසි වෙයි."

"එලීනා, එන්න මගෙත් එක්ක. මට මොනවා හරි ඕනෑ එයාලට සාක්ෂියක් විදිහට. ඔයාගෙ එක සපත්තුවක් මට දෙන්න."

එලීනා නතර වී නැමී තම තෙමුණු සපත්තුවක් ගලවා ඔහු අත තැබීය.

"දැන් මට යන්න වෙන්නෙ අළු ඇරිය වගේ තමයි." ඈ සිනාසුනාය.

"රූඩි ඉක්මන් කරමු...."

"මේ පාරෙන්, මගේ පස්සෙන් එන්න." රූඩි ඉස්සර විය.

ඔවුහු දේවස්ථානය හරහා අනෙක් සංස්ථාර කුලුන වෙත දිව ගියෝය. එලීනා සහ ඩිමිත්‍රි පසුපස දොර වෙත දුවන්නට වූහ. ඔවුන් සොහොන් ගැබෙහි සැඟවෙන බව මුර සෙබළුන්ට පෙන්වන්නට වුවමනා විය.

බොබ් දිව යන විට ඇද වැටීමෙන් කකුල කොර ගසමින් ඔවුන් පසුපසින් ඇදෙන්නට විය. පසුගිය කාලයේ එම කකුල කැඩී තිබුණු බැවින් එය වේදනා දෙන්නට විය. ඔවුහු වෙනත් කාමරයක් වෙත දිව ගියෝය. එයට ද සිවිලිමක් නැත. එයට ද හිණි පෙළක් තිබූ අතර එය ද යකඩ වැටකින් ආවරණය කර තිබුණි. එක් ලණුවක් පමණක් පහළ ඇදෙමින් තිබුණි.



Scanned with CamScanner

sinhalaebooks.com

රුඩි ඉක්මනින් එම කඹය බිත්තියට සවි කර තිබූ තැනින් ලිහා දමා හිණි පෙළ දිගේ දුවන්නට විය.

“උඩට එන්න ඉක්මනට....”

පීටර් බොබ්ට උදව් කරමින් ඔහුගේ අතෙන් අල්ලා ගත්තේය. ඔවුහු අමාරුවෙන් පඩි පෙළ නගින්නට වූහ.



# 15

# පෝල් කුමරුගේ ඝණ්ටාරය

ගල් පඩි විශාල බෑවුමකින් යුක්ත නිසා බොබ්ට එහි නැගීමට මහත් පරිශ්‍රමයක් දරන්නට සිදු විය. රුඩි ඔහුට ඇවිද ඒම අපහසු බව දැන තම අතෙහි වූ ඇඳ ඇතිරිල්ලෙන් සාදා ගත් ලණුවේ එක් කෙළවරක් බොබ් අතට දුන්නේය.

“මේකෙ එල්ලෙන්න... මම ඔයාට උදව් කරන්නම්.”

රුඩි ලණුව ඇදීම නිසා බොබ්ට ඉහළට නැගීම පහසු විය. ඔවුන් පළමු හිණි පෙළ නැග ගත්හ. නමුත් මුර සෙබළුන්ට තවමත් ඔවුන් ආගිය අතක් සොයා ගැනීම අපහසු වී ඇත. ඔවුන් තුන් වන හිණි පෙළට ද නැගුණු විට එහි විශාල යකඩ ගේට්ටුවක් විය. එයින් ඇතුළු වූ පසු එයට රුඩි අගුල දැමීය.

“මේකෙන් ටික වෙලාවකට හරි අපි පස්සෙන් එන එක වැළකෙනවනෙ.”

“පහුගිය දවස්වල පල්ලිය පවා මුර සෙබළු ආක්‍රමණය කරලා තිබුණා. පූජකවරු ඝණ්ටාර කුලුනු බලා ගැනීම අත් ඇරලා දාලා. ඒකයි මේවා මෙහෙම තියෙන්නෙ. මේ වගේ තවත් දොරටුවක් දෙකක් ඇති.”

ඔවුහු ඇතුළු වී දෙවන දොරටුවට ද අගුළු දැමූහ. ඝණ්ටාර කුලුනේ පහත සිටි සෙබළු ඔවුන් දුටුවෝය. ඔවුහු වේගයෙන් හිණි පෙළ දිගේ දිව ආහ. නමුත් පළමු දොරටුව අගුළු දමා තිබූ බැවින් ඔවුනට නතර වීමට සිදු විය. ඔවුනට කරන්නට දෙයක් නොමැති



Scanned with CamScanner

sinhalaebooks.com

වූයෙන් යකඩ කූරු කපන ලෙස අණ ලැබුණි.

"එයාලට ඉක්මනට එන්න බැහැ. ඒත් අපිට තියෙන්නෙ ටික වෙලාවයි." ජුපිටර් කල්බලයට පත් විය.

ඔවුන් දැන් සිටින්නේ ඩොමිනික් දේවස්ථානය මුදුනේය. ඔවුන්ට පහළින් වාහන සහ මිනිසුන් කුඩාවට පෙනුණි. පෙනෙන විදිහට සෑම දෙයක්ම සාමාන්‍ය අයුරින් සිදු වේ. ඔවුහු විවෘත ඝණ්ටාර කුටියට ළඟා වූහ. එහි වහලයේ විශාල ලීයක පොල් කුමරුගේ ඝණ්ටාරය එල්ලා තිබුණි. එතැන තුන් වන දොරටුවක් ද විය. රූඩි එය ද වසා දමා යතුරු ලෑවේය. ඝණ්ටාර කුලුනේ සිටි පරෙවියෝ රංචු පිටින් ඔවුන්ගේ හඬට බිය වී ඉගිළී යන්නට වූහ.

ළමයි පහළ බලමින් සැනසුම් සුසුමක් හෙළූහ. මුර සෙබළු තවමත් එළමු ගේට්ටුවට පහර දෙමින් සිටිති.

"එයාලා ඒ වැඩේ ඉක්මනට ඉවර කරාවි. අපි අපේ වැඩේ ඉක්මනට පටන් ගත්තොත් හොඳයි. මේ බලන්න, අපි කොහොමද මේ ඝණ්ටාරය ගහන්නෙ...? ඕහ්... මම හිතන්නේ, ඉස්සරලම අපි මේ ඝණ්ටාර ලණුවෙන් අදින්න ඕනෑ." රූඩි අනුමත කළේය.

ඝණ්ටාර කුටිය විශාල කාමරයකි. එහි විශාල ඝණ්ටාරය එල්ලී තිබේ. රූඩි එහි ලණුව ගෙන අදින්නට උත්සාහ කළේය. එයට පීටර් සහ ජුපිටර් ද උදව් කළෝය. එහි ලණුව සිනිඳු ලෝම සහිත දිගු සර්පයෙකු මෙනි. පහත සිටින මුර සෙබළුන් කෑ ගසන්නට වූයේ ළමුන් ලණුව අදිනු දුටු බැවිනි. නමුත් තවමත් එය වළකන්නට ඔවුන් ප්‍රමාද වැඩිය.

ඔවුහු ඝණ්ටාරය හොඳින් නිරීක්ෂණය කළෝය. එහි ප්‍රමාණය ද ඉතා විශාලය. ඝණ්ටාරයේ ලණුව පසෙකින් වූ රෝදයක ඔතා තිබේ. රෝදය කැරකෙන විට ඝණ්ටාරය ඉබේම පැද්දී හඬ නංවයි. ඔවුනට මෙය මහත් ප්‍රහේලිකාවකි. ඔවුන් මීට පෙර මෙවැනි දෙයක් දැක නැත. ඔවුන් දැක තිබුණේ සාමාන්‍ය ප්‍රමාණයේ ඝණ්ටාර පමණි.

"දෙවියනේ.... මේකෙ ලොකු...! අපිට පුළුවන්ද, මේක ගහන්න...?" පීටර් පුදුම විය.



"ඒක සාමාන්‍ය ක්‍රමයට අපිට කරන්න බැහැ." ජුපිටර් මඳක් කල්පනා කළේය.

"ඉස්සරලම අපි ඝණ්ටාරය පැත්තකට ඇල කරන්න ඕනෑ. ඉන්පස්සෙ අර යකඩය ඝණ්ටාරෙ වදින්න සලස්වන්න ඕනෑ. මම හිතන්නෙ එතකොට ඒක හරියට වැඩ කරයි." ජුපිටර් පැහැදිලි කළේය.

ළමයි හතර දෙනාම ඝණ්ටාරයේ ලණුව අල්ලා ගත්තෝය. ජුපිටර්ගේ සංඥාවකට අනුව ඔවුහු එය අදින්නට වූහ. රෝදය කැරකෙන්නට වූ අතර විශාල ඝණ්ටාරය ටිකෙන් ටික ඇලවෙන්නට විය. එය ලෝහ දණ්ඩට අඟල් කිහිපයක් දුරින් විය.

රූඩි ඝණ්ටාර ලණුව ගෙන එය ඝණ්ටාර කුලුනේ විසිතුරු වැඩ දැමූ කණුවක් වටේ එතුවේය. ඔවුහු මඳක් විවේක ගත්හ.

හිරු නැඟ එමින් තිබූ අතර සිසිල් සුළං රැළි විවෘත කුටිය තුළට හමා ආවේය. ඝණ්ටාර කුලුනේ ගැටියේ වසා සිටි පරෙවියෝ නැවතත් කෑ ගසමින් ඉගිළෙන්නට වූහ.

"දැන් වෙලාව කීයද?" ජුපිටර් ඇසීය.

රූඩි තම අත් ඔරලෝසුව වෙත දෙනෙත් යොමු කළේය.

"අටට විස්සයි. තව මිනිත්තු විස්සකින් අගමැති ප්‍රකාශයක් කරනවා ගුවන් විදුලියෙනුයි, රූපවාහිනියෙනුයි. අපිට ඉක්මන් කරන්න වෙනවා."

"වාසනාවට අපි ළඟ තාමත් අර ඇඳ ඇතිරිල්ලෙන් හදපු ලණුව තියෙනවා. අපි ඒක අර යකඩ දණ්ඩට අලා ඒක පද්දලා අරිමු ඝණ්ටාරේ වදින්න."

ඊළඟ මිනිත්තුවේදී ඔවුහු ලණුවෙන් තොණ්ඩුවක් සාදා යකඩ දණ්ඩට දැමූහ. ළමුන්ගෙන් වැඩිම ශක්තියක් තිබුණේ රූඩිටත්, පීටර්ටත්ය. ඔවුහු ලණුව ටිකක් ඇද්දෝය. යකඩ දණ්ඩ පැද්දී ගොස් විශාල ඝණ්ටාරයෙහි හැපුණි. එයින් ගැඹුරු හඬක් නැංවිය. බොබ් පහතට එබී බැලුවේය. පහත සිටින මිනිසුන් පුදුමයෙන් ඉහළ බලනු ඔහු දුටුවේය.

"මේකෙ හඬ හරිම අපහසුවක් අපේ කන්වලට. සමහර විට



Scanned with CamScanner

sinhalaebooks.com

කන් අඩි පුපුරන්නත් බැරි නැහැ. මම හිතන්නෙ අපේ කන්වලට පුළුන් ටිකක්වත් තිබුණා නම් හොඳයි. කමක් නැහැ. බොබ්, පීටර්, ඔයාලා ළඟ ලේන්සු තියෙනවද?" ජුපිටර් ඇසීය.

ඔවුහු තමන්ගේ සාක්කුවලින් ලේන්සු ගෙන ඒවා ඉරා ගුලි කර කන්වලට තද කර ගත්හ. ඉන්පසු ඔවුහු පුරාවෘත්තයේ සඳහන් පෝල් කුමරුගේ ඝණ්ටාරය නාද කරන්නට සූදානම් වූහ. පීටර් සහ රූඩි බොහෝ මහන්සි වූහ. ඔවුහු යකඩ දණ්ඩ පද්දා හැරියෝය. මිනිත්තුවකින් හඬ දෝංකාර දෙන්නට පටන් ගත්තේය. එහි හඬ මුළු වෙරෝනා රාජධානියටම ඇසෙන්නට ඇත. එහි ඒකාකාරී හඬ වූයේ 'ටාං.... ටාං.... ටාං....' යන්නයි.

බොබ් පහතට එබී බැලුවේය. මිනිසුන් රංචු පිටින් වීදිවලට එක්රොක් වන්නට විය. මොහොතින් මොහොත මිනිසුන් දුව එන්නට වූයේ වැදගත් පණිවුඩය කුමක් ඇයි දැන ගැනීම පිණිසය. ඩිජාරෝ කුමරු කරදරයක වැටී ඇති බවත්, ඔහුට උදව් අවශ්‍ය බවත් ඔවුන්ට දැන ගන්නට පුළුවන.

ජුපිටර් ද බොබ් ළඟින් හිඳ පහත දර්ශනය නරඹන්නට විය. කැලඹී ගිය මිනිස්සු ගංගාවක් ලෙසින් ආපසු හැරී මාලිගාව දෙසට එන්නට වූහ. ඇතැම් මිනිසුන් කෑ ගසමින් අත් දිගු කරමින් මාලිගාව දෙසට ගමන් ගනිද්දී එය වළකන්නට මුර සෙබළු උත්සාහ ගන්නා බවක් දක්නට ලැබුණි. මාලිගාවේ මුර සෙබළු රතු නිල ඇඳුමින් සැරසී ජන ගංගාව පාලනය කරන්නට උත්සාහ ගත්හ. මුර සෙබළුන් ජනතාව තල්ලු කර දමද්දී ඔවුහු ඉදිරියට ගමන් කරන්නට වූහ. ඔවුන් එසේ කරන්නට කරන්නට ජනතාව තව තවත් වැඩි වෙමින් මාලිගාව දෙසට ගමන් කළහ.

පීටර් සහ රූඩි ද ඔවුනට එක් වූහ. ඔවුහු ද පහත දර්ශනය නරඹන්නට වූහ. රූඩි අත ගුවන් විදුලියක් තිබුණි. ඔහු එය ක්‍රියාත්මක කළ ද කිසිවක් නෑසෙයි.

ළමෝ කන්වලට ඇබ ගසාගෙන සිටින බව මතක් වූ බැවින් ඒවා ඉවත් කර ගුවන් විදුලියට සවන් දුන්හ. ගුවන් විදුලිය තුළින් තියුණු හඬක් නැගෙන්නට විය. රූඩි එය ඉංග්‍රීසි බසට පරිවර්තනය කළේය.



"අගමැති කතා කරන්නෙ. ඔහු කියනවා, හෙළි නොවුණු විශාල කුමන්ත්‍රණයක් වෙරෝනාවට විරුද්ධව සිද්ධ වෙනවලු. දින නියමක් නැතිව රාජාභිෂේකය කල් දමනවලු. ස්ටෙෆාන් ආදිපාදවරයා අණ දෙනවලු අපරාධකාරයන්ව නීතිය ඉදිරියට ගෙනෙන්නට. ඒ කිව්වේ ඔයාලා ඩිජාරෝ කුමරුගෙ ආරක්ෂාව පතා සිරභාරයට ගන්නවලු. ඔහු ඉල්ලා සිටිනවා සියලුම වෙරෝනාවේ වැසියන්ගෙන් නීතිය ක්‍රියාත්මක කරන්න උදව් කරන්න කියලා."

"දෙවියනේ..., මේ කතාව හරිම නරකයි. ඒ කතාව හරියට විශ්වාස කරන්න පුළුවන් එකක් වගේ නෙ. ඒ කොහොම වුණත් ඒ ඔක්කොම බොරු." පීටර් කීවේ නොසතුටිනි.

"ඒත් කවුරුවත් ඒකට ඇහුම්කන් දෙන්නෙ නැහැ." රූඩි කීවේ ඉමහත් සතුටිනි.

"නගරේ ඉන්න හැම කෙනෙකුටම ඝණ්ටාරේ ශබ්දෙ ඇහුණා. ඒකෙ තේරුම මොකක්ද කියලා බලන්න මිනිස්සු වීදිවලට එකතු වුණා. බලන්න අර සෙනඟ දිහා. එයාලගෙන් වැඩි කොටසක් මාලිගාව දිහාටයි යන්නෙ. මට එහෙ වෙන්නෙ මොනවද කියලා බලන්න පුළුවන් නම්..."

"අර බලන්න...., මුර සෙබළු දොර කඩලා... එයාලා උඩට එනවා...!" පීටර් කෑ ගැසීය.

ළමෝ හිණි පෙළ වෙත හැරුණහ. නිල ඇඳුම් ඇඟලා ගත් මුර සෙබළු ඒ වන විටත් හිණි පෙළ මුදුනට පැමිණ සිටියහ.

"රජ්ජුරුවන්ගේ නාමයෙන් අපි උඹලව අත් අඩංගුවට ගන්නවා." නිලධරයෙක් කෑ ගැසීය.

"අපිව අත් අඩංගුවට ගන්න....!" රූඩි ඇසුයේ නිර්භීතවමය.

"එන්න පීටර්, අපි මෙයාලා මෙතෙන්ට එනතුරුම ඝණ්ටාරය ගහමු."

රූඩි සහ පීටර් කඹය ගෙන යකඩ දණ්ඩ පද්දන්නට වූහ. නැවතත් ඝණ්ටාරය නාද දෙන්නට විය. එය සියලුම වෙරෝනාවේ වැසියන් ක්‍රියාත්මක කරන්නට සමත් වනු ඇත. ඔවුනට අඩි කිහිපයක් දුරින්



Scanned with CamScanner

sinhalaebooks.com

සිටි මුර සෙබළු තෙවන ගේට්ටුව අරින්නට වෙහෙස දරමින් සිටිති.

මිනිත්තු පහක් පමණ කාලයකදී ළමෝ පෝල් කුමරුගේ සංස්ටාරය නාද කිරීමෙන් ජනතාවගෙන් ඉල්ලීමක් කරන්නට සමත් වූහ. මුර සෙබළුන්ට ඔවුන් අත් අඩංගුවට ගන්නට හැකි විය.

"දැන් ඉතින් උඹලට සුදුසු දඬුවමක් ලැබේවි." නපුරු නිලධාරියා කෑ ගැසීය.



16

# රිදී මකුළුවා සොයා ගනියි

මුර සෙබළුන් විසින් යටත් කර ගත් ළමෝ හිණි පෙළෙන් පහළට තල්ලු කරගෙන ගිය නමුත් ඔවුන් එයට විරෝධයක් පෑවේ නැත. සංස්ටාර කුලුන පාමුල සිටි මුරභටයන් පිරිස ඔවුන් රවුමක් සේ වට කරගෙන පල්ලියේ දොරටුවෙන් එළියට ආහ. තවමත් මිනිස්සු වීදිවල රැඳී සිටිති. ඔවුහු ළමයින් දෙස පුදුමයෙන් බලා සිටින්නට වූහ. ඔවුන් විසිර ගියේ මුරභටයන්ගේ කෑ ගැසීමෙනි. ළමයි දෙදෙනා බැගින් එකා පිටුපස එකා සිටින සේ මුර සෙබළුන් පිරිවරාගෙන ගලින් නිම කළ ගොඩනැගිල්ලකට ඇතුළු වූහ. එහි ඇතුළත සිටි නිල් පාට ඇඳුමින් සැරසුණු පොලිස් භටයෝ දෙදෙනෙක් ඔවුනට ආචාර කළහ.

"රජයට විරුද්ධ අපරාධකාරයෝ." හමුදා නිලධාරියා හයියෙන් කීවේය.

"මෙයාලව හිර කුඩුවට දාන්න. ස්ටෙෆාන් ආදිපාදතුමා මෙයාලගෙ ඉරණම විසඳන්න අණක් නිකුත් කරන තුරු."

පොලිස් නිලධාරීන් කලබල වූ බවක් පෙනෙන්නට තිබුණි.

"පෝල් කුමරුගෙ සංස්ටාරය...." එක් අයෙක් කියන්නට තැතනුවේය.

"පාලකයාගේ අණ.... මොවුන් ඇතුළට දමනු...." නිලධරයා ගිගුරුවේය.



Scanned with CamScanner

sinhalaebooks.com

පොලිස් නිලධාරියා ඔවුන් සිර කුඩු වෙත රැගෙන ගියේය. එහි නිදහස් සිර කුටි හතරක් තිබුණි. එයින් එකකට පීටර් සහ රූඩි ඇමූ අතර තවත් එකකට ජුපිටර් සහ බොබ් දමා වැසුවේය.

"මුන්ට දුක් විඳින්න දෙන්න ඕනෑ. ඒ වගේම මුන් බොහොම අමාරුකාරයෝ ටිකක්. හොඳට මුර කරන්න ඕනෑ. දැන් අපි ආපහු මාලිගාවට යනවා. මේ ගැන පාලකයට දැනුම් දෙන්න." සෙබළ නිලධාරියා රළු ලෙසින් කිවේය.

ඔවුහු සිර මැදිරි තුළ හුදෙකලා වූහ. රූඩි සිර මැදිරියෙහි තිබූ ඇඳන් දෙකෙන් එකකට පැන ගත්තේය.

"කමක් නැහැ, ඒගොල්ලො දැන් අපිව අල්ලා ගත්තනෙ." රූඩි කිවේ කනගාටුවෙනි.

"අපි අපිට කරන්න පුළුවන් හොඳම දේ කළා. මට ආසයි මාලිගාවෙ මොකද වෙන්නෙ කියලා බලාගන්න තියෙනව නම්."

පීටර් අනෙක් ඇඳෙහි වැතිර ඔහු කියන දෙයට සවන් දී ගෙන සිටියේය.

බොබ් ඇඳෙහි වැතිර සිටියි. ජුපිටර් ද ඔහුගේ ඇඳෙහි හිඳ ගත්තේය. මුළු රැය පුරාම නින්ද වර්ජිතව සිටි බැවින් ඔවුන්ට මහත් තෙහෙට්ටුවක් මෙන්ම නිදිමතක් ද දැනෙන්නට විය.

"අපි මුළු රෑම ඇහැරගෙනනෙ හිටියෙ. මට හිතෙනවා, අපි මෙහෙම විවේකයෙන් ඉන්න කොට මොනවා හරි දෙයක් කරන්න පුළුවන් වෙයි කියලා. කොහොම වුණත් සණ්ටාරේ සංඥාව...."

නමුත් ජුපිටර්ගේ කතාවට බාධා කරමින් ලොකු ඈනුමක් ගියේය. ඔහු දෑස් පොඩි කර බොබ් දෙස බැලීය. ඔහුට හොඳටම නින්ද ගොසිනි. පීටර් සහ රූඩි අවදියෙන් දැයි කත් යොමා සිටිය ද ඔවුන් ද නින්දට වැටී ඇත. ජුපිටර් කියන්නට ගිය දේ කියා අවසන් කළ යුතුව ඇත. නමුත් එයට ඇහුන්කන් දෙන්නට කෙනෙක් නැත.

"සණ්ටාරේ හඬින් දෙන සංඥාව අවුරුදු සිය ගණනක් පැරණි ක්‍රමයක්. ඒක ගුවන් විදුලිය, රූපවාහිනියට වඩා පැරණියි." ඔහු තමාටම කියා ගනිමින් ඇඳෙහි වැතුරුණේය.



"1453 තුර්කිය, කොන්ස්තන්තිනෝපලය අල්ලා ගත්තට පස්සෙ කැරැල්ලකදී සණ්ටාරෙ සංඥාව පාවිච්චි කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කළා... එහෙනම්...."

ඔහුට එතනින් එහාට යමක් කියන්නට නොහැකි විය. ජුපිටර් ද නිඳි දෙව් දුව වැලඳ ගත්තේය.

ඩෙන්සෝ නගරයට යටින් කානුවල ජලය ගලා ගියේය. බොබ්ට වතුරේ සිට ගන්නට නොහැකි විය. ජල පහරට තල්ලු වී වේගයෙන් ඔහු ගසාගෙන යන්නට විය. ජුපිටර් ඈත සිට 'බොබ්... බොබ්...' යනුවෙන් කෑ ගැසීය. බොබ් මහත් වෙර යොදා නැගී සිටියේය. කවුරුන් හෝ ඔහුගේ උරහිසෙන් අල්ලාගෙන කතා කළේය.

බොබ්, නැගිටින්න .. නැගිටින්න... මොකද ඔයාට වුණේ? හීනයක් දැක්කද?" ඔහුගේ කන අසලින්ම කවුරුන් හෝ කතා කරන හඬ ඇසිණි.

බොබ් නිදිමත ගතියෙන්ම ඇසිපිය සැලුවේය. ඈනුමක් හැර ඇඳෙහි හිඳ ගත්තේය. ජුපිටර් සිනාසී ඔහු දෙස බලා සිටියේය.

"බොබ්, අපිව හම්බ වෙන්න අමුත්තෙක් ඇවිල්ලා. බලන්න කවුද කියලා..."

බර්ට් යන්ග් ඔහු දෙස සිනාසෙමින් බලා සිටිනු බොබ් දුටුවේය.

"බොහොම හොඳයි බොබ්." බර්ට් සතුටෙන් කිවේය.

"හරිම භයානක දෙයක් සිද්ධ වුණේ. අපි ගොඩක් කනගාටු වුණා අපේ සම්බන්ධය දිගටම පවත්වාගෙන යන්න බැරි වුණාම. ඒත් ඔයාලා ඒක අවබෝධ කරගෙන වඩාත් හොඳට වැඩේ කළා. මට හරි සතුටුයි ඔයාලා ඔක්කෝම ගැන." බර්ට යන්ග් බොබ්ගේ අත මිරිකමින් ළෙන්ගතුව ප්‍රකාශ කළේය.

"ඩිජාරෝ කුමාරයා... එයා ආරක්ෂා සහිතද?" බොබ් ඇසීය.

"එයා දැන් මෙහෙ ඉන්නවා. එයාට මොකුත් කරන්න බැරි වුණා. ස්ටෙෆාන්, අගමැති, එයාගෙ මුර සෙබළු ඒ සේරම අත් අඩංගුවට ගත්තා. රූඩිගෙ තාත්තා හිරෙන් නිදහස් කළා විතරක් නෙමෙයි, එයා තමයි දැන් ආයෙත් සැරයක් අගමැති වෙලා ඉන්නෙ. ඔයාලා දැන



Scanned with CamScanner

sinhalaebooks.com

ගන්න කැමති ඇති ඔයාලා සණ්ටාරේ ගැහුවට පස්සෙ මොකද වුණේ කියලා, එහෙම නේද?"

රූඩි සහ පීටර් ද සිර මැදිරියට එකතු වූහ. පොලිස් නිලධාරීන් දෙදෙනා ඔවුන් දෙස සිනාසෙමින් බලා සිටියෝය. බර්ට් යන්ග් කතාව කෙටියෙන් කියන්නට පටන් ගත්තේය.

"මමයි ඇමෙරිකන් තානාපතියි මාලිගාවට ගියේ ළමුන් තුන්දෙනාට කුමක් වූවා දැයි සොයා බලන්නට. ඒ වන විට මාලිගා දොරටුව වසා දමා තිබුණා. අපිට ඇතුළු වෙන්න දුන්නෙත් නෑ. අපි මුරභටයන් එක්ක වාද කරමින් ඉන්න විට අනතුරු ඇඟවෙන සණ්ටාර සංඥාව ඇසෙන්නට පටන් ගත්තා. පළමුවෙන්ම ඒ හඬින් සියලු දෙනාම පුදුමයට පත් වුණා. නමුත් ඒ හඬ දිගටම ඇසෙද්දී මිනිස්සු මාලිගාව ඉදිරිපිටට එක් රොක් වන්නට වුණා."

"ක්‍රමයෙන් සෙනඟ වැඩි වෙලා එතැන පිරී ඉතිරෙන්නට වුණා. මිනිස්සු ඩිජාරෝ කුමරුගේ නම කියමින් කෑ ගසන්නට වුණා. මුර සෙබළු ජනතාව පලවා හැරිය නොහැකිව අසරණව බලා සිටියා. මේ අතර මාලිගාවේ උස තාප්පය උඩට නැගුණු මිනිසෙක් ඩිජාරෝ කුමරු අනතුරට පත් වී ඇති බවත් ඔහු බේරාගත යුතු බවත් කියමින් අනෙක් මිනිසුන්ට කරුණු පැහැදිලි කළා."

"මට මේ වෙලාවෙ හිතුණා මමත් ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. මමත් වෙරෝනාවේ සමහරක් මිනිස්සු වගේ කෑ ගහන්න පටන් ගත්තා. 'ඩිජාරෝ කුමාරයව ආරක්ෂා කරන්න, ස්ටෙෆාන් ආදිපාදවරයව පහ කරන්න' ඒ වගේ දේවල් කිව්වා."

"මිනිස්සු ධෛර්යමත් වුණා. ඔවුන් ගේට්ටුව කඩාගෙන ඇතුළු වුණා. මමත් ඒත් එක්කම ඇතුළට ආවා. මට පුළුවන් වුණා අර ඉස්සරලම තාප්පය උඩට නැගලා කෑ ගැහුව එක්කෙනාට එකතු වෙන්න. එයා කිව්වා මට එයා ගායකයෙක් කියලා. අපි මාලිගාවට ඇතුළු වුණා. කලහකාරී පිරිස මුර සෙබළුන් පැත්තකට තල්ලු කරලා දැම්මා. මුර සෙබළුන් බය වුණා ජනතාවට විරුද්ධව වැඩ කරන්න. මගේ යාළුවා, එයාගේ නම ලොන්සෝ...."

"එයා මගේ සහෝදරයා.... එයත් බේරිලාද?" රූඩි ආඩම්බරයෙන් ඇසුවා.



"ඔව්, එයා දැනගෙන හිටියා කුමාරයා ඉන්නෙ කොහෙද කියලා. අපි කැරලි කණ්ඩායම මෙහෙයෙව්වා. මුර සෙබළුන් දැක්කා මොකද්ද සිද්ධ වෙන්න යන්නෙ කියලා. එයාලා බොහෝ දෙනෙක් අපිට ප්‍රශ්න ඇති කළේ නැහැ. අපි ඩිජාරෝ කුමාරයාව නිදහස් කර ගත්තා. එයා නියම කුමාරයෙක් විදිහට සෙබළුන්ට අණ කළා ස්ටෙෆාන් ආදිපාදවරයවයි, අගමැතිවයි අත් අඩංගුවට ගන්න කියලා. එයාලා හැංගෙන්න උත්සාහ කළා. ඒත් අන්තිමේදි එයාලා අත් අඩංගුවට පත් වුණා."

"කුමාරයට විරුද්ධ වුණු මුර සෙබළුන් අයින් කරලා දැම්මා. කුමාරයට පක්ෂපාතී මුර සෙබළුන් හිටියා. කුමාරයට විරුද්ධ වුණු සේරම කුමන්ත්‍රණකාරයෝ අත් අඩංගුවට ගත්තා. කුමාරයාට පුළුවන් වුණ හැටියෙම ඔයාලව බලන්න මෙහාට ඒවි. ඔයාලට මතකද අර කැලිෆෝනියාවේදි සිද්ධ වෙන්න ගිය අනතුර. ඒක ඉබේ සිද්ධ වුණු එකක් නෙවෙයි. ඒකත් කුමාරයව අයින් කරන්න කරපු කුමන්ත්‍රණයක්."

"අපේ කුමාරයා දිගු කල් දිනේවා..." ප්‍රීති ඝෝෂා හඬ නැඟුණි.

ඩිජාරෝ කුමරු ඔවුන් ඉදිරියේ පෙනී සිටියේය. ඔහු සුදුමැලි වී සිටි නමුත් ඔහුගේ දෑස් දීප්තියෙන් බැබළුනි. ඔහු සිර කුටියට ඇතුළු විය. ළමුන් තිදෙනාම එකට බදාගත් කුමරු "මගේ ඇමෙරිකන් යාළුවෝ..."යි සතුටෙන් කීවේය.

ඔහු එකිනෙකා වැලඳ ගත්තේ හද පිරී සතුටෙනි.

"ඔයාලා මාව ආරක්ෂා කළා පෝල් කුමරුගෙ සණ්ටාරය නාද කරලා. කොහොමද ඔයාලට එහෙම අදහසක් ආවෙ?"

"ජුපිටර් තමයි ඒක කළේ." රූඩි උත්තර දුන්නේය.

"අපි හිතුවෙ ගුවන් විදුලියයි, පත්තරයෙයි, රූපවාහිනියයි ගැන විතරයි. අපිට කොහොමටවත් සණ්ටාරය ගැන මතක් වුණේ නැහැ."

"ඔයා අපිට කිව්වනෙ, ඔයාලගෙ මුතුන්මිත්තෙක් ඒ කිව්වෙ පෝල් කුමාරයා 1675 කැරැල්ලකදි එයා ආධාර පතාපු හැටි. නමුත් එයින් පස්සෙ මේක පාවිච්චි කළේ රාජකීය කටයුත්තකදී විතරයි. ඒත් මට හිතුණා මේක හොඳම වෙලාව ඒක පාවිච්චි කරන්න කියලා. රූපවාහිනී, ගුවන් විදුලි, පත්තර මේ හැමදෙයක්ම එන්න අවුරුදු සිය ගණනකට ඉස්සරවෙලා තමයි සණ්ටාරෙ පාවිච්චි කළේ. ඇඳිරි නීතියක්



Scanned with CamScanner

sinhalaebooks.com

දාන්න, වෙනත් අනතුරු අවස්ථාවක වගේ. ඒ නිසා...."

ඔහුගේ කතාව අවසන් කරන්නට පෙර ඩිජාරෝ කුමරු සිනාසෙමින් ජුපිටර්ගේ පිටට තට්ටු කළේය.

"ඔයා කළේ ශ්‍රේෂ්ඨ වැඩක්. පෝල් කුමරු ඔයා ගැන ආඩම්බර වේවි. ස්ටෙෆාන් ආදිපාදරවයා ආරක්ෂා සහිතව හිරේ ඉන්නවා. මම හැමදෙයක්ම අවබෝධ කර ගත්තා. මම අණ කළා අද රෑ වනතුරු පෝල් කුමරුගේ ඝණ්ටාව නාද කරන්න, අපේ ජයග්‍රහණය වෙනුවෙන්. දැන් ඔක්කෝම හරි, එක දෙයක් ඇර. වෙරෝනාවේ රිදී මකුළුවා තාමත් නැහැ."

"ජයග්‍රහණය වෙනුවෙන් ඝණ්ටාව නාද කරනවා..." ජුපිටර් තොල් මැතිරීය.

"ඩිජාරෝ කුමරුනි, මම හිතනවා මම දැනටමත් නිගමනය කරලා තියෙනවා රිදී මකුළුවා කොහේද ඉන්නෙ කියලා. අපිට මාලිගාවට ගියොත් ඒක හොයාගන්න පුළුවන් වෙයි."

ඔවුහු ටික වේලාවකට පසු ඩිජාරෝ කුමරුගේ රථයේ නැඟී මාලිගාව බලා ගමන් කරන්නට වූහ. මඟ දෙපස එක්වූ ජනතාව කුමරුට සුබ පතන්නට වූ අතර කුමරු ඔවුනට ආචාර කරමින් ගමන් කළේය. ඔවුන් මාලිගාවට ළඟා වූ පසු රහස් පරීක්ෂකයෝ තිදෙනා සහ කුමරු ඔවුන්ගේ කාමරයට ඇතුළු වූහ.

"දැන් මගේ අඩුපාඩුව පරීක්ෂා කරලා බලන්න ඕනෑ. මම හිතනවා ඒක තමයි හරි. මොකද අපි හැමතැනම හොයලා බැලුවනෙ. තව එක තැනක විතරයි රිදී මකුළුවා ඉන්න පුළුවන්. මට වැරදෙන්නත් පුළුවන්. ඒත්...."

"කතාව අඩු කරලා වැඩියෙන් වැඩ කරන්න." පීටර් කිවේ නොඉවසිල්ලෙන් මෙන්ම අමනාපයෙනි.

"මේක කතා කර කර ඉන්න වෙලාවක් නෙවෙයි. පෙන්වන්න..."

"හරි..., හරි..., ටිකක් ඉන්න." ජුපිටර් කාමරයේ මුල්ල දෙසට හැරුණි.

ඔහු අත් සහ දණහිස් බිමට තබා හෙමින් බඩගාගෙන බිත්තිය සහ ඇඳ අතර තවමත් එල්ලෙමින් තිබෙන මකුළු දැල වෙත ගියේය.



කළු සහ රන් පැහැ විශාල මකුළුවෙක් ඔහු දැක පැන ගොස් අතුරුදහන් විය. ඌ ජනේලය සහ බිත්තිය අතර ඇති පැල්මකට රිංගා ගත්තේය. ඔහුගේ දීප්තිමත් ඇසට ඒ තුළ තවත් කළු පැහැති රන්වන් පාට මිශ්‍රිත මකුළුවෙක් සිටිනු දක්නට ලැබුණි. ජුපිටර් තම අත ඒ තුළට දමා යමක් ඇද එළියට ගත්තේය. හෙමින් නැඟිට ගත් ජුපිටර් තම අල්ල මත තබා ඩිජාරෝ වෙත පෑවේය.



"බලන්න...."

"වෙරෝනාවේ රිදී මකුළුවා...!" ඩිජාරෝ සතුටෙන් කෑ ගැසීය.

"ඔයා ඒක හොයා ගත්තා. කොහොමද හිතුවෙ?"

"මම අවසානයේදී තීරණය කෙරුවා ඒක කොහේද තියෙන්න ඕනෑ කියලා." ජුපිටර් ඔහුට කීවේය.

sinhalaebooks.com

"ඔයා දන්නවද? මුර සෙබළු අපේ කාමරේ දොර අරින්න උත්සාහ කරද්දි රූඩි අපිව එළියට ගන්න උත්සාහ කළා. මමයි, ජීවරූයි දොරේ එල්ලිලා හිටියා. බොබ් ඒ වෙලාවෙ මේක හංගන්න තැනක් හොය හොයා කාමරය වටේම දිව්වා. බොබ් ළඟ හොඳ අදහසක් තියෙනවා. එයා හිතුවා මේක හංගන්න හොඳම තැන අතන කියලා."

"මමද ඒක කළේ...?" බොබ් ඇසුයේ සැකයෙනි.

ඔහු එය මතකයට නඟා ගන්නට උත්සාහ කළේය.

"ඔව්, ඔයාගෙ ඔළුව සඳලුතලයේ වැදුනට පස්සෙ ඔයාට ඒ සේරම අමතක වෙලා. ඔයා තේරුම් ගත්තා ඒක හංගන්න හොඳම තැන ඇත්තම මකුළුවා ඉන්න තැන කියලා. ඉතින් එයා හෙමින් සැරේ ඒක අර කුහරය ඇතුළට දැම්මා. අපි ඔක්කෝමලා කාමරය පරීක්ෂා කරලා බලද්දි ඒක දැක්කත් අපි හිතුවෙ නැහැ ඒක එහෙම එකක් කියලා. අපි හිතුවෙ ඒක ඇත්තම මකුළුවෙක් කියලා. නමුත් මම තේරුම් ගත්තා මකුළුවෝ දෙන්නෙක් එකම මකුළු දැලක ඉන්නෙ නැහැ කියලා."

"දෙවියනේ බොබ්.... ඔයත් අති විශිෂ්ටයි..." ඩිජාරෝ කුමරු සතුටින් ඔහු වටා අත යවා වැලඳ ගෙන පිටට හෙමින් තට්ටු කළේය.

"ඩිජාරෝ කුමාරයා කියනවා ඔහුගේ ජයග්‍රහණය සඳහා සණ්ටාරය නාද වෙනවා කියලා. ඊයේ රෑ මහලු ඇන්ටන්, අර අභිගුණ්ඨිකයන්ගේ රජ්ජුරුවෝ කිව්වා බලගතු අනාවැකියක්. එයා ස්ටෙෆාන් ආදිපාදවරයාට කිව්වා 'ජයග්‍රහණයේ සීනු හැඬවෙනවා ඔහුට ඇහෙනවා කියලා. 'අර මකුළුවා රිදී වුණත් මකුළුවෙක් විතරයි' කිව්වා. මම දන්නෙ නැහැ මහලු ඇන්ටන්ගෙ බලය ගැන. නමුත් එයා කිව්වට වඩා දෙයක් දන්නවා. ජයග්‍රහණයේ සීනු නාද වෙනවා කිව්වා. ඇත්තෙන්ම ඒක අද ඔබ වෙනුවෙන් සිද්ධ වෙනවා. අනිත් දේ තමයි මම තේරුම් ගත්තා මකුළුවෙක් වුණොත් ඌ මකුළුවෙක්ම තමයි. අපි වෙන කොහෙදි හරි දකින මකුළුවත්, දැලේ ඉන්න මකුළුවත් එකම තමයි." ඔහු කතාව නතර කර දිගු හුස්මක් ගත්තේය.

"ඔයා දන්නවද? මට එච්චරම ප්‍රශංසා කරන්න වුවමනා නැහැ." ජුපිටර් කීවේය.

"ඇයි නැත්තෙ...? ඔයා මේ හැම ප්‍රශංසාවක්ම ලබන්න සුදුසුයි.



ඔයාලා ඔක්කෝම. මට ඒ ප්‍රශංසාව ඔයාලට දෙන්න පුළුවන්." ඩිජාරෝ සතුටෙන් කීවේය.

ඩිජාරෝ කුමරු වෙරෝනාවේ රිදී මකුළුවා තම ලේන්සුවේ ඔතා එය පසුම්බියට දමා ගත්තේය.

"මට මගේ කෘතඥතාව සම්පූර්ණයෙන්ම ඔයාලට පෙන්වන්න විදිහක් නැහැ. ඒත් මට කරන්න පුළුවන් උපරිම දේ මම මේ වෙලාවෙ කරනවා."

ඔහු වෙනත් පසුම්බියකින් රිදී දම්වැල් සහිත රිදී මකුළුවන් තිදෙනෙක් එළියට ගත්තේය.

"කරුණාකරලා පේළියට හිටගන්න."

ඔහු එකිනෙකාගේ බෙල්ල වටා රිදී මකුළුවන් එල්ලුවේය.

"දැන් ඔයාලා තුන්දෙනා අපේ වර්ගයට අයිතියි. ඒක මගේ බලය යොදවලා ඔයාලට දෙන්න පුළුවන් ඉහළම සම්මානය. වෙරෝනාවේ උසස්ම තත්ත්වය. මේක පලඳවන්න පුළුවන් වෙරෝනාවේ වැසියෙකුට විතරයි. මම දැන්මම ප්‍රකාශයට පත් කරනවා ඔයාලා තුන්දෙනාට මගේ රටේ ගෞරවණීය පුරවැසිභාවය ලබා දෙන්න කියලා. තවත් ඔයාලට මගෙන් මොනවා හරි කෙරෙන්න ඕනැද? කියන්න... මගේ බලයෙන් කරන්න පුළුවන් වෙන මොනව හරි තියෙනවද?"

"හොඳයි...." ජුපිටර් යමක් කියන්නට තැතනුවේය.

නමුත් පීටර් ඊට ඉස්සර විය.


"කරුණාකරලා අපිට මොනවා හරි කන්න දෙන්න පුළුවන්ද?" පීටර් ඇසීය.

- නිමි -



Scanned with CamScanner

sinhalaebooks.com




Scanned with CamScanner